

කොළඹ විශ්වවිද්‍යාලය
ශ්‍රී ලංකාව

වාර්ෂික වාර්තාව
2012

අපගේ දර්ශනය

“දැනුම, පර්යේෂණය හා

ව්‍යවසායකත්වය අතර

සහ-ක්‍රියාකාරිත්වය ගොඩනගමින්

කලාපීය වශයෙනුත්

ජාත්‍යන්තර වශයෙනුත්

කීර්තියට පාත්‍ර වන

උත්කෘෂ්ට කේන්ද්‍රස්ථානයක් වීමට

ප්‍රයත්න දැරීම”

අපගේ මෙහෙවර

“ජාතික සංවර්ධනයට දායක
වන්නා වූ
ස්වාධීන චින්තනයකින් හා
විශ්ලේපණ
කුශලතාවන්ගෙන් යුක්ත ව
නවෝත්පාදනශීලී වූ උසස්
ප්‍රමිතින්ගෙන් හා
සමාජ වගකීමෙන් යුක්ත
මානව නිපුණතා උත්පාදනය
කිරීමට
කැප වන්නා වූ උත්කෘෂ්ට අධ්‍යාපන
හා
පර්යේෂණ කේන්ද්‍රස්ථානයක් බවට
පත් වීම”

3. උපකුලපතිගේ වාර්තාව :

මා 2012 වසර සඳහා අදාළ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරනුයේ ඉමහත් ප්‍රීතියෙන් හා සාඩම්බර හැඟීමකින් යුතුව ය.

ලොව පුරා විශ්වවිද්‍යාල හා කොලීජි අතර 2012 වසර මුල දී පවත්වන ලද වෙබ් ස්ථානගත කිරීමක දී කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාවේ ප්‍රථම ස්ථානය දරන විශ්වවිද්‍යාලය ලෙසත් දකුණු ආසියාවේ අට වන ස්ථානයෙහිත් ලොවෙහි 1447 වන ස්ථානයෙහිත් ස්ථානගත කරන ලද බව වාර්තා කරන්නේ ඉමහත් සතුටිනි.

පාලන අධිකාරිය වන පාලක සභාව විසින් ගනු ලබන මනා කළමනාකරණ තිරණ ද, ඉහළම අධ්‍යයන අධිකාරිය වන සනාතන සභාව විසින් දෙන ලද අධ්‍යයන මග පෙන්වීම් ද, නුදෙක්ම අධ්‍යයන, අධ්‍යයන සහායක, පරිපාලන සහ අනෙකුත් කාර්ය මණ්ඩලයන්හි කැපවීම හා අව්‍යාජ ක්‍රියාකාරිත්වයෙහි ද, ප්‍රථම උපාධි හා පශ්චාත් උපාධි යන මට්ටම් දෙකෙහි දී ම ශිෂ්‍යයන්ගේ ප්‍රතිදානයෙහි ද ප්‍රතිඵලයක් ලෙස මෙම තත්ත්වය ලබා ගත හැකි විය.

දකුණු ආසියාවෙහි ද ලෝක මට්ටමින් ද තමා අත්පත්කර ගෙන සිටින ස්ථානය ඉහළ නැංවීම් වස් විශ්වවිද්‍යාලය ප්‍රබල ලෙස යත්න දරමින් සිටී. අපගේ පරමාර්ථ හා ඉලක්ක සාක්ෂාත් කරගැනීමේ පිළිවෙත් වැඩිදියුණු කිරීම් වස්, ප්‍රතිපත්ති හා ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම ද විධිමත් ක්‍රියාකාරිත්ව තක්සේරු කිරීම් සඳහා රාමුවක් ස්ථාපනය කිරීම ද එසේම තත්ත්ව සහතිකකරණ ව්‍යායාම ද වැදගත් සාධක වේ.

ඉගැන්වීම, ඉගෙනීම, පර්යේෂණ හා අනෙකුත් බද්ධ ක්‍රියාකාරකම් කෙරෙහි හිතකර පරිසරයක් විශ්වවිද්‍යාලය තුළ පැවතීන. අධ්‍යයන සම්බන්ධතා හා ඊට අදාළ සහයෝගිතා වැඩසටහන්හි ඉදිරි ගමනක් පතා ජාත්‍යන්තර විශ්වවිද්‍යාල හා නියෝජිත ආයතන සමග අවබෝධතා ගිවිසුම් දහ හතරක් පමණ අත්සන් තබන ලදී. අප විශ්වවිද්‍යාලය සමග සැලකිය යුතු සංඛ්‍යාවක විදේශීය ශිෂ්‍යයන් අනුබද්ධ වී සිටි අතර, සම්මාන භුවමාරු ක්‍රමය යටතේ නොයෙකුත් විදේශීය විශ්වවිද්‍යාල සමග අප ශිෂ්‍යයෝ බද්ධ වී සිටිය හ.

අධ්‍යයන කටයුතුවලට අමතර ව, ක්‍රීඩා, විවාද වැඩසටහන්, ලලිත කලා හා සංස්කෘතිකාංග සහ ප්‍රජා මූලික ව්‍යාප්ති වැඩසටහන් වැනි සම විපයමාලා කටයුතුවල ද ශිෂ්‍යයෝ තදින් ම නියැලී සිටියහ. අඛණ්ඩ ලෙස, සය වන වරටත් අන්තර් විශ්වවිද්‍යාලයීය ක්‍රීඩා තරගාවලියේ දී කොළඹ විශ්වවිද්‍යාලය සමස්ත ශූරතාව දිනා ගන්නා ලදී.

කාන්තා සමස්ත ශූරතාව, පිරිමි සමස්ත ශූරතාව හා සමස්ත ශූරතාව දිනාගනිමින් මෙම ප්‍රහේද තුනෙන් ම සමස්ත ශූරයන් බවට විශ්වවිද්‍යාලය පත් වූ ප්‍රථම අවස්ථාව මෙය වේ.

විදේශීය විශ්වවිද්‍යාලයන්හි, ක්‍රීඩා, විවාද වැඩසටහන් ආදියට ද අප ශිෂ්‍යයෝ සහභාගී වූහ.

පවත්නා ඉඩකඩ වැඩි කිරීම සඳහා ප්‍රමාණවත් භූමිය නොමැති වීම සහ තදබල අවශ්‍යතාවක් ව පවතින අලුතින් ගොඩනැගිලි ඉදි කිරීම වෙනුවෙන් වැය කිරීමට ප්‍රමාණවත් මූල්‍ය සම්පාදන ප්‍රමාණවත් නොවීම විශ්වවිද්‍යාලයේ ඉක්මන් සංවර්ධනය අඩාල වීමට හේතු විය.

විශ්වවිද්‍යාලයේ පාලක සභාව, සනාතන සභාව, වැඩ බලන ලේඛකාධිකාරී, මූල්‍යාධිකාරී, අධ්‍යයන, පරිපාලන හා අනෙකුත් සියලු කාර්යමණ්ඩල වෙත ස්තුති කිරීමට මෙය අවස්ථාව කර ගනිමි. විශ්වවිද්‍යාලයේ කළමනාකරණය සමග සහයෝගිතාව දැක්වීම වෙනුවෙන් විශ්වවිද්‍යාලයීය ප්‍රථම උපාධි අපේක්ෂක ශිෂ්‍යයන්ට විශේෂ ස්තුතියක් පිරිනැමේ.

මහාචාර්ය ටී. ආර්. ආරියරත්න
වැඩ බලන උප කුලපති (2013 මාර්තු)

2012 විශේෂ අවස්ථා

- ලෝ පතල විද්‍යාඥ හා ඉන්දීය ජනරජයේ හිටපු ජනාධිපති අතිගරු ආචාර්ය ඒ. පී. ජේ. අබ්දුල් කලාම් 2012 ජනවාරි මස 24 වන දා කොළඹ විශ්වවිද්‍යාලයට සපැමිණ "අධ්‍යාපන ගතිකත්ව හා ශිෂ්ටාචාරයේ ඒකාග්‍රතාව" යන මැයෙන් දේශනයක් පවත්වන ලදී.

- කොළඹ විශ්වවිද්‍යාලය හා ඉන්දියාවේ තිරුපතිහි ශ්‍රී වෙන්කටෙස්වර විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කෙරුණි. කොළඹ විශ්වවිද්‍යාලය සමග ශ්‍රී වෙන්කටෙස්වර විශ්වවිද්‍යාලය (එස්. වී. යූ.) සතු සබඳතා සවිමත් කර ගැනීමට අවස්ථාවක් මෙම නව ප්‍රවණතාව ඔස්සේ විවර වී ඇත.

- කළමනාකරණ හා මූල්‍ය පීඨයේ සිසුන් වෙත සීමාවාසික පුහුණු අවස්ථා ලබා ගැනීමටත් කාර්යමණ්ඩල පුහුණුව ලබා ගැනීම සඳහාත් කළමනාකරණ හා මූල්‍ය පීඨය හා බ්‍රැන්ඩික්ස් ලංකා සමාගම අතර 2012 මැයි මස දී අවබෝධතා ගිවිසුමක් අත්සන් තබන ලදී.

- ප්‍රජා සෞඛ්‍යය සඳහා 44 වන ආසියා පැසිෆික් අධ්‍යයන එකමුතුව (ඒ.පී.ඒ.සී.පී.එච්) 2012 ඔක්තෝබර් මස 13 වන දා සිට 18 වන දා දක්වා පවත්වන ලදී. මෙය කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයෙහි සත්කාරයෙන් සිදු කරන ලදී.

- "අභිසාරී තාක්ෂණයන් හා තිරසාර ප්‍රජාවන්" යන මැයෙන් කොළඹ විශ්වවිද්‍යාලයීය සනාතන සභා ශාලාවේ දී 2012 අගෝස්තු මස 16 වන දින කොළඹ විශ්වවිද්‍යාලයේ වාර්ෂික පර්යේෂණ පරිසංවාදය පවත්වන ලදී.

- 2012 ඔක්තෝබර් මස 10 වන දින කොළඹ විශ්වවිද්‍යාලය විසින් මොබිටෙල් ටෙලිකොම් පුද්ගලික සමාගම සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් තබන ලදී. මෙය උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ පුද්ගලික හා රාජ්‍ය අංශයෙහි ඒකාබද්ධතාව වර්ධනය කිරීම වෙනුවෙන් සිදු කෙරෙන තවත් එක් පියවරකි.

- නව දිල්ලි නුවර දී ජූලි මස 23 හා 24 යන දෙදින දී පවත්වන ලද 2012 වසරේ ලෝක අධ්‍යාපන සමුළුවෙහි දී කේ - 12 හා උසස් අධ්‍යාපනය සඳහා විවෘත දූරස්ථ අධ්‍යාපනයෙහි හොඳම නව්‍යජනනය හා හොඳම පියවර සඳහා ත්‍යාගය කොළඹ විශ්වවිද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය විසින් දිනා ගන්නා ලදී.

- සාකල්‍ය වෛද්‍යවිද්‍යාව පිළිබඳ 3 වන ජාත්‍යන්තර සම්මන්ත්‍රණය 2012 නොවැම්බර් මස 17 හා 18 යන දිනයන්හි දී කොළඹ විශ්වවිද්‍යාලයීය සනාතන සභා ශාලාවෙහි දී පැවැත්විණ. කොළඹ විශ්වවිද්‍යාලය, ඉන්දියාවේ කේරළයෙහි මහත්මා ගාන්ධි විශ්වවිද්‍යාලය, ඔස්ට්‍රේලියාවේ බ්‍රිස්බේන්හි තාක්ෂණය පිළිබඳ ක්වීන්ස්ලන්ත විශ්වවිද්‍යාලය හා ඔස්ට්‍රේලියාවේ වික්ටෝරියාහි බලාරත් විශ්වවිද්‍යාලය ඒකාබද්ධව මෙම සම්මන්ත්‍රණය පවත්වන ලදී.

- 2012 අගෝස්තු මස 21 වන දින නවසීලන්තයේ මැසේ විශ්වවිද්‍යාලය සමග කොළඹ විශ්වවිද්‍යාලය නව ඒකාබද්ධතාවක් ගොඩනගා ගන්නා ලදී.

- කොළඹ විශ්වවිද්‍යාලය හා චීනයේ ටියැංජින් වෛද්‍ය විශ්වවිද්‍යාලය යන ආයතන අතර අධ්‍යයන හා සංස්කෘතික නුවමාරුව ප්‍රවර්ධනය කිරීම සඳහා කොළඹ විශ්වවිද්‍යාලය විසින් සහයෝගිතා ගිවිසුමකට එළඹෙන ලදී.

- වෛද්‍ය පීඨයේ සාරධර්ම ඇගයුම් කමිටුව විසින් 2012 - 2016 සඳහා SIDCER/FERCAP පිළිගැනීම අලුත් කර ගනු ලැබිය.

- තාක්ෂණය පිළිබඳ ඔස්ට්‍රේලියාවේ ක්වීන්ස්ලන්ත විශ්වවිද්‍යාලය සමග කොළඹ විශ්වවිද්‍යාලය නව සබඳතාවක් ගොඩනගා ගන්නා ලදී.

- *"කළමනාකරණයේ කාන්තාවන්"* සංවිධානය විසින් 2011/2012 වසරේ වෘත්තිය හා වෘත්තීන්හි නියැලී සිටින කාන්තාවන් සඳහා නීති අංශය යටතේ පිදෙන ත්‍යාගය ජීවා නිරිඇල්ල මිය විසින් දිනා ගන්නා ලදී.

- විශාලතම රාජ්‍ය පර්යේෂණ ආයතනය වන ස්පාඤ්ඤයේ සයිබර්මෙට්‍රික්ස් ආයතනය විසින් 2012 ජූලි මස පවත්වන ලද ලෝක විශ්වවිද්‍යාල වෙබ් ස්ථානගත කිරීමක දී කොළඹ විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ අංක 1 දරන විශ්වවිද්‍යාලය ලෙස ස්ථානගත කරන ලදී.

- 2012 වසර සඳහා ආසියාවේ හොඳම ව්‍යාපාර පාසල් නායකත්ව ත්‍යාගය අඛණ්ඩව දෙවන වරටත් උපාධි අධ්‍යයන පීඨය වෙත පිරිනමන ලදී.

- ලෝක බැංකුවෙන් එච්. ඒ. ටී. සී. ප්‍රතිපාදන හතක් (7) කොළඹ විශ්වවිද්‍යාලය වෙත ලැබිණි.

- ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයේ කළමනාකරණ හා මූල්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව තම 2012 කළමනාකරණ හා මූල්‍යය පිළිබඳ 7 වන ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණය දෙසැම්බර් 14 වන දින රාජගිරියේ බැංකු අධ්‍යයන කේන්ද්‍රයේ දී "පවත්නා ව්‍යාපාරික සංවර්ධනයක් කරා: අන්තර්විපයිය සමාජ පර්යේෂණයෙහි භූමිකාව" යන මැයෙන් සංවිධාන කරන ලද අතර වර්තමාන සන්දර්භය තුළ අධ්‍යයන ප්‍රජාව අතරේ එය ඉතාමත් ම ඉහළ ඉල්ලුමක් පවත්නා මාතෘකාවකි.

- කොළඹ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය විසින් සංවිධාන කරන ලද විශ්වවිද්‍යාලයීය ආර්ථික විද්‍යාඥයින්ගේ ප්‍රථම ශ්‍රී ලංකා සම්මේලනය (SLFUE). එනම් ශ්‍රී ලංකා ආර්ථික පර්යේෂණ සම්මන්ත්‍රණය (SLERC) 2012 නොවැම්බර් මස 29 හා 30 යන දිනවල ශ්‍රී ලංකා පදනම් ආයතනයේ පැවැත්විණි. සම්මන්ත්‍රණයේ තේමාව වූයේ 'ගෝලීය ආර්ථික සංවර්ධනය හා සංවර්ධනය වෙමින් පවත්නා ආර්ථිකයන්ගේ අභියෝග' යන්නයි.
- 2012 නොවැම්බර් 30 වන දා කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ වෛද්‍ය චතුරිකා රැදීගු වෙත 4 වන CVCD විශිෂ්ටත්වයේ ත්‍යාග ප්‍රදානෝත්සවයේ දී සෞඛ්‍ය විද්‍යාවන්හි විශිෂ්ටතම තරුණ පර්යේෂිකාවට හිමි CVCD ත්‍යාගය හිමි වන ලදී.
- කාන්තාවන් සඳහා වන ජාත්‍යන්තර සන්ධානය (TIAW) විසින් 'වෙනස් ඔවෙහි ලොවක සම්මාන 2012' සඳහා ලොව වටා සුවිශේෂී කාන්තාවන් 100 දෙනෙකු අතුරින් එක් අයෙකු

ලෙස විශ්වවිද්‍යාලයේ උපකුලපතිනිය මහාචාර්ය ඤපණිකා හිරිඹුරේගම තෝරා ගනිමින් සම්භාවනාවට පාත්‍ර කරනු ලැබුවාය.

- විශ්වවිද්‍යාල **06** ක් ජාත්‍යන්තර මට්ටමට ගෙන ඒමේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශ ප්‍රතිපාදන යෝජනාක්‍රමය යටතේ අධ්‍යයන කාර්යමණ්ඩලයේ **36** දෙනෙකු වෙත පශ්චාත් උපාධි පර්යේෂණ ශිෂ්‍යත්ව, සහයෝගිතා පර්යේෂණ හා යටිතලපහසුකම් සංවර්ධන ප්‍රදාන ලබා දෙන ලදී.

පටුන **පිටුව**

1. විමර්ශනය

1.1	පාලක සභාව	9
1.2	සනාතන සභාව	10
1.3	රැස්වීම්	14
1.4	සමස්ත ක්‍රියාකාරිත්වය	14

2. පීඨ, මණ්ඩපය, කේන්ද්‍ර හා ඒකක 16

2.1	ශාස්ත්‍ර පීඨය	16
2.2	අධ්‍යාපන පීඨය	26
2.3	උපාධි අධ්‍යයන පීඨය	31
2.4	නීති පීඨය	35
2.5	කළමනාකරණ හා මූල්‍ය පීඨය	40
2.6	වෛද්‍ය පීඨය	44
2.7	විද්‍යා පීඨය	51
2.8	ශ්‍රීපාලී මණ්ඩපය	59
2.9	කාර්යමණ්ඩල සංවර්ධන කේන්ද්‍රය(SDC)	70
2.10	මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය (CSHR)	72
2.11	ජාතික අධ්‍යාපන පර්යේෂණ හා ඇගයීම් මධ්‍යස්ථානය (NEREC)	76
2.12	කොළඹ විශ්වවිද්‍යාලයීය ප්‍රජා ව්‍යාප්ති කේන්ද්‍රය (CUCEC)	77
2.13	ශාරීරික අධ්‍යාපන අධ්‍යයනාංශය	78
2.14	සෞඛ්‍ය මධ්‍යස්ථානය	82
2.15	පුස්තකාලය	85

3. කොළඹ විශ්වවිද්‍යාලය පිළිබඳ විමර්ශනයක් 90

3.1	ප්‍රථම උපාධි ශිෂ්‍ය ඇතුළත් කිරීම්	90
3.2	2012 දී පැවැත්වූ පශ්චාත් උපාධි හා ශාස්ත්‍රපති විභාග	95
3.3	කාර්යමණ්ඩල තොරතුරු	100
3.4	අධ්‍යයන කාර්යමණ්ඩල තොරතුරු	101
3.5	අනධ්‍යයන කාර්යමණ්ඩල තොරතුරු	104

4. පර්යේෂණ හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු 104

4.1	ලැබූ ත්‍යාග පිළිබඳ තොරතුරු	106

5. ශිෂ්‍ය හා කාර්යමණ්ඩල සුභසාධනය 107

6. කොළඹ විශ්වවිද්‍යාලයීය ජාත්‍යන්තර ඒකකය 111

7. මූලධන කටයුතු හා සැලසුම්කරණය 114

8. අභ්‍යන්තර විගණනය 116

8.1	මූල්‍ය සමාලෝචනය – 2012	119
8.2	මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්	125
8.3	මූල්‍ය ප්‍රකාශ පිළිබඳ විගණකාධිපති වාර්තාව	186
8.4	විගණන නිරීක්ෂණ වාර්තාව	196

1. විමර්ශනය

1.1 පාලක සභාව

විශ්වවිද්‍යාලයේ පාලක සභාව 1985 අංක 07 දරන විශ්වවිද්‍යාල (සංශෝධන) පනතේ 24 වැනි වගන්තිය යටතේ සංශෝධනය කරනු ලැබූ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 44 වැනි වගන්තිය ප්‍රකාරව ස්ථාපිත කරන ලද්දකි. විශ්වවිද්‍යාලයීය පාලක සභාව විශ්වවිද්‍යාලයේ පාලන අධිකාරිය වන අතර උපකුලපතිතුමිය (සභාපතිනිය ලෙස නිල බලයෙන්), ශ්‍රී පාලී මණ්ඩපාධිපති, පීඨ සතෙහි සභාපතිවරුන් {පූර්ණ වශයෙන් නිල බලයෙන් පත් වූ සාමාජිකයින් නව (09) දෙනෙක්}, සනාතන සභාව නියෝජිතය කරන දෙදෙනෙකු, ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිපන් සභාව විසින් පත්කරන ලද සාමාජිකයින් දෙලොස් දෙනෙකු යන සාමාජිකයින්ගෙන් සමන්විත වේ. 2012 වසරේ දී එය පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත විය.

නිල බලයෙන්		
	සභාපතිනි: උපකුලපතිනිය	මහාචාර්ය සුජීකා හිරිඹුරේගම
	මණ්ඩපාධිපති, ශ්‍රී පාලී මණ්ඩපය	ආචාර්ය වියුඩර් වීරසිංහ
	පීඨාධිපතිවරු	
	• ශාස්ත්‍ර	මහාචාර්ය අතුල රණසිංහ
	• අධ්‍යාපන	මහාචාර්ය එම්. ඒ. එස්. පෙරේරා
	• නීති	එන්. සෙල්වකුමාරන් මයා වී. ටී. තම්ලිමාරන් මයා
	• කළමනාකරණ හා මූල්‍ය	මහාචාර්ය එච්. ඩී. කරුණාරත්න
	• වෛද්‍ය	මහාචාර්ය රොහාන් ජයසේකර
	• විද්‍යා	මහාචාර්ය ටී. ආර්. ආරියරත්න
	• උපාධි අධ්‍යයන	මහාචාර්ය කේ. එස්. චන්දසිරි

අනෙකුත් සාමාජිකයන්		
	සනාතන සභාවෙන් තෝරාපත් කළ අය	
	• මහාචාර්ය ඩී. එන්. සමරසේකර • මහාචාර්ය ඉන්ද්‍රලාල් ද සිල්වා	
	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත්කරන ලද අය	
	• රාජන් ආසිර්වාදම් මයා	
	• කේ. කනග්-ඊස්වරන් මයා	
	• එච්. එම්. එන්. වරකාඋල්ල මයා	
	• පී. ඩබ්. සේනාරත්න මයා	
	• සී. මාලියද්ද මයා	
	• ලීපා ද සිල්වා චන්ද්‍රසේන මිය	
	• තිලක් කරුණාරත්න මයා	
	• වෛද්‍ය කුඩා විජේරත්න	
	• ඒ. පී. ගුණරත්න මයා	
	• අශෝක් පතිරගේ මයා	
	• ආචාර්ය රංජනී ගමගේ	
	• ආචාර්ය හර්ෂ කබ්රාල්	
	ලේකම්: ලේඛකාධිකාරී	
	• ටී. එල්. ආර්. සිල්වා (වැඩ බලන)	

1.2 සනාතන සභාව

1985 අංක 7 දරන විශ්වවිද්‍යාල (සංශෝධන) පනතේ 26 (2) වගන්තිය මගින් සංශෝධිත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 46 (2) වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාල සනාතන සභාව ස්ථාපනය කරන ලදී. 2012 වසරේ දී එය පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය.

නිල බලයෙන්		
	සභාපතිනි: උපකුලපතිනිය	මහාචාර්ය ඇපණිකා හිරිඹුරේගම
	මණ්ඩපාධිපති, ශ්‍රී පාලී මණ්ඩපය	ආචාර්ය ටියුඩර් වීරසිංහ
	පීඨාධිපතිවරු	
	• ශාස්ත්‍ර	මහාචාර්ය අතුල රණසිංහ
	• අධ්‍යාපන	මහාචාර්ය එම්. ඒ. එස්. පෙරේරා
	• නීති	එන්. සෙල්වකුමාරන් මයා වී. ටී. තම්ල්මාරන් මයා
	• කළමනාකරණ හා මූල්‍ය	මහාචාර්ය එච්. ඩී. කරුණාරත්න
	• වෛද්‍ය	මහාචාර්ය එම්. එම්. ආර්. ඩබ්. ජයසේකර
	• විද්‍යා	මහාචාර්ය ටී. ආර්. ආරියරත්න
	• උපාධි අධ්‍යයන	මහාචාර්ය කේ. එස්. චන්ද්‍රසිරි
	පාසලෙහි හා අධ්‍යයනායතනයන්හි අධ්‍යක්ෂවරු	
	• කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා අධ්‍යයනායතනය	ටී. එල්. ආර්. සිල්වා මයා
	• ජෛව රසායන විද්‍යා, අණුක ජීව විද්‍යා හා ජෛව තාක්ෂණ විද්‍යායතනය	මහාචාර්ය කේ. එච්. තෙන්නකෝන්
	• මානව සම්පත් අභිවර්ධන ආයතනය	ආචාර්ය ඩබ්. කේ. හිරිඹුරේගම ආචාර්ය රොහාන් පෙරේරා
	• දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය	එස්. සේනාරත්න මයා
	• ජාතික පුස්තකාල සහ විඥාපන විද්‍යායතනය	උපාලි අමරසිරි මයා
	• වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	මහාචාර්ය ජයන්ත ජයවර්ධන
	• කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක පාසල	මහාචාර්ය පී. එන්. වික්‍රමනායක
	අධ්‍යයනාංශ ප්‍රධානීන්	
	• ගිණුම්කරණ	ආචාර්ය ඒ. ඒ. සී. අබේසිංහ
	• කාය ව්‍යවච්ඡේදන	මහාචාර්ය වී. එච්. ඩබ්. දිසානායක
	• ජෛව රසායන විද්‍යා හා අණුක ජීව විද්‍යා	මහාචාර්ය සී. පී. ඩී. ඩබ්. මැතිව්
	• ව්‍යාපාරික ආර්ථික විද්‍යා	ඩබ්. ඒ. එස්. පී. වීරතුංග මයා
	• රසායන විද්‍යා	මහාචාර්ය කේ. ආර්. ආර්. මහානාම
	• සායනික වෛද්‍ය විද්‍යා	මහාචාර්ය කේ. එස්. ඒ. ජයසිංහ
	• වාණිජ්‍යය සහ මූල්‍ය	ආචාර්ය ඒ. ඒ. අසිස්
	• වාණිජ නීතිය	ඩබ්. අයි. නානායක්කාර මිය
	• ප්‍රජා වෛද්‍ය විද්‍යා	මහාචාර්ය රෝහිණී ද ඒ. සෙනෙවිරත්න
	• ප්‍රජා විද්‍යා	ආචාර්ය එස්. උක්වත්ත මිය
	• ආර්ථික විද්‍යා	ආචාර්ය සිරිමල් අබේරත්න
	• අධ්‍යාපන මනෝවිද්‍යා	ආචාර්ය ඩබ්. චන්ද්‍රදාස
	• ඉංග්‍රීසි	මහාචාර්ය නෙලූකා සිල්වා
	• අධිකරණ වෛද්‍ය විද්‍යාව හා ඩූලකවේදය	මහාචාර්ය පී. ආර්. ප්‍රනාන්දු
	• භූගෝල විද්‍යා	මහාචාර්ය එස්. ඒ. නෝඛට්
	• ඉතිහාසය	ආචාර්ය ඩී. එන්. එන්. ආර්. දේවසිරි
	• මානව සම්පත් කළමනාකරණ	ආචාර්ය පවිත්‍රා කයිලාසපති

	• මානව විද්‍යා අධ්‍යාපන	ඩී. ආර්. අතුකෝරල මයා
	• ජාත්‍යන්තර සබඳතා	මහාචාර්ය අමල් ජයවර්ධන
	• කළමනාකරණ හා සංවිධාන අධ්‍යයන	ආචාර්ය ජේ. ඒ. එස්. කේ. ජයකොඩි
	• අලෙවිකරණය	ආචාර්ය කේ. කජේන්ද්‍රා
	• ගණිතය	ආචාර්ය ජේ. කේ. විජේරත්න
	• ක්ෂුද්‍රජීව විද්‍යා	මහාචාර්ය ජෙනිෆර් පෙරේරා
	• න්‍යෂ්ටික විද්‍යා	ආචාර්ය එස්. කුලතුංග
	• ප්‍රසව හා නාරීවේද	මහාචාර්ය එච්. සේනානායක
	• ළමා රෝග	මහාචාර්ය මනෝරි සේනානායක
	• පරපෝපවේද	මහාචාර්ය එන්. ඩී. කරුණාවීර
	• ව්‍යාධිවේද	මහාචාර්ය එම්. ඩී. එස්. ලොකුහෙට්ටි
	• හිපග්වේද	ආචාර්ය පී. ගලප්පත්ති මිය
	• භෞතික විද්‍යා	ආචාර්ය එස්. ආර්. ඩී. රෝසා
	• භෞතවේද	ආචාර්ය ඇන්ජලා ද සිල්වා
	• ශාක විද්‍යා	ආචාර්ය ටී. එල්. එස්. තිරිමාන්න මිය
	• දේශපාලන විද්‍යා හා රාජ්‍ය ප්‍රතිපත්ති	එම්. සේනානායක මයා
	• පුද්ගල හා තුලනාත්මක නීති	මහාචාර්ය ශාර්යා ස්කානිවෙල්
	• මනෝ වෛද්‍ය විද්‍යා	ආචාර්ය ඩී. ආර්. සී. හංවැල්ල
	• පොදු හා ජාත්‍යන්තර නීති	වී. ටී. තම්ල්මාරන් මයා
	• විද්‍යා හා තාක්ෂණ විද්‍යා අධ්‍යාපන	එන්. වී. කරුණාසේන මයා
	• සිංහල	පූජ්‍ය අගලකඩ සිරිසුමන හිමි
	• සමාජ විද්‍යා අධ්‍යාපන	ආචාර්ය ඒ. ඒ. ජයවර්ධන
	• සමාජ විද්‍යා	මහාචාර්ය ඩී. ඒ. පී. ද සිල්වා
	• සංඛ්‍යානය	ආචාර්ය එම්. ඩී. ටී. ආටිගල මිය
	• ශල්‍ය වෛද්‍ය විද්‍යා	මහාචාර්ය ඩී. එන්. සමරසේකර
	• සත්ත්ව විද්‍යා	ආචාර්ය එන්. පල්ලෙවත්ත
1985 අංක 7 දරන විශ්වවිද්‍යාල (සංශෝධන) පනතේ 26(2)(එච්) වගන්තිය යටතේ: මහාචාර්යවරු		
	• මහාචාර්ය බී. එම්. ආර්. ප්‍රනාන්දුපුල්ලේ (2012.09.30 දක්වා)	
	• මහාචාර්ය සී. පී. ඩී. ඩබ්. මැතිව්	
	• මහාචාර්ය චන්ද්‍රිකා විජේරත්න	
	• මහාචාර්ය ඩී. එම්. එස්. එස්. එල්. දිසානායක	
	• මහාචාර්ය ඩී. එන්. සමරසේකර	
	• මහාචාර්ය ඩී. ටී. යූ. අබේතුංග	
	• මහාචාර්ය ඩී. යූ. ජේ. සොන්නාදර	
	• මහාචාර්ය ඒ. ඩී. ද සිල්වා	
	• මහාචාර්ය එච්. එම්. සේනානායක	
	• මහාචාර්ය හේමමාලි පෙරේරා	
	• මහාචාර්ය ජේ. උයන්ගොඩ	
	• මහාචාර්ය ජෙනිෆර් පෙරේරා	
	• මහාචාර්ය ජේ. කේ. ඩී. එස්. ජයනෙත්ති	
	• මහාචාර්ය කේ. ඒ. පී. සිද්ධිසේන	
	• මහාචාර්ය කේ. ආර්. ආර්. මහානාම	
	• මහාචාර්ය කේ. එම්. එන්. ද සිල්වා	
	• මහාචාර්ය කේ. එස්. චන්ද්‍රසිරි	
	• මහාචාර්ය කේ. එස්. ඒ. ජයසිංහ	

	• මහාචාර්ය එල්. ඒ. ඩී. ඒ. තිස්ස කුමාර
	• මහාචාර්ය එම්. ඩී. පී. ද කොස්තා
	• මහාචාර්ය එම්. එච්. ආර්. පෙරීරා
	• මහාචාර්ය එම්. එම්. ආර්. ඩබ්. ජයසේකර
	• මහාචාර්ය එම්. වී. සී. ද සිල්වා
	• මහාචාර්ය මනෝරි සේනානායක
	• මහාචාර්ය නදීරා කරුණාවිර
	• මහාචාර්ය නයනි මෙලගොඩ
	• මහාචාර්ය නෙලුම ද මැල්
	• මහාචාර්ය ප්‍රීතිකා අගුනාවෙල
	• මහාචාර්ය පී. වී. උඩගම
	• මහාචාර්ය ආර්. ප්‍රනාන්දු
	• මහාචාර්ය ආර්. එල්. ජයකොඩි
	• මහාචාර්ය ආර්. එල්. සී. විජේසුන්දර
	• මහාචාර්ය රෝහිණී හේවාමාන්න
	• මහාචාර්ය රෝලන්ඩ් අබේපාල
	• මහාචාර්ය එස්. ඒ. නෝබට්
	• මහාචාර්ය එස්. රෝහිණී ද ඒ. සෙනෙවිරත්න
	• මහාචාර්ය එස්. එම්. විජේරත්න
	• මහාචාර්ය සුජාතිකා හිරිඹුරේගම
	• මහාචාර්ය එස්. ටී. හෙට්ටිගේ
	• මහාචාර්ය එස්. ඩබ්. කොටගම
	• මහාචාර්ය ශ්‍යාම් ප්‍රනාන්දු
	• මහාචාර්ය ශ්‍රියන්ති ඒ. දැරණියගල
	• මහාචාර්ය ටී. ආර්. ආරියරත්න
	• මහාචාර්ය ඩබ්. ඩී. රත්නසූරිය
	• මහාචාර්ය ඩබ්. අයි. ද සිල්වා
	• මහාචාර්ය ඩබ්. කේ. ද ආබෲ
	• මහාචාර්ය ඩබ්. එස්. ප්‍රේමවන්ස
	• මහාචාර්ය වයි. එන්. අමරමාලී ජයතුංග
	• මහාචාර්ය එම්. ඒ. එස්. පෙරේරා
	• මහාචාර්ය එම්. ආර්. සූරියාරච්චි
	• මහාචාර්ය එස්. ආර්. සිරිමාන්න
	• මහාචාර්ය අමල් ජයවර්ධන (2013.12.31 දක්වා)
	• මහාචාර්ය ආර්. ඩී. විජේසේකර
	• මහාචාර්ය ඩී. පී. දිසානායක
	• මහාචාර්ය සරත් විජේසූරිය
	• මහාචාර්ය අසංග තිලකරත්න
	• මහාචාර්ය දිපිකා ප්‍රනාන්දු
	• මහාචාර්ය ඒ. ඩී. එම්. එස්. අබේරත්න
	• මහාචාර්ය ශාර්යා ස්කානිවෙල්
	• මහාචාර්ය එම්. කරුණානිධි
	• මහාචාර්ය ඒ. කළුආරච්චි
	• මහාචාර්ය එස්. විජේරත්න
	• මහාචාර්ය එම්. ඩබ්. ගුණතුංග

	• මහාචාර්ය සී. ඒ. ඥානදාසන් මිය
	• මහාචාර්ය එස්. රාජපක්ෂ
	• මහාචාර්ය ඩී. ඒ. පී. ද සිල්වා
	• මහාචාර්ය එච්. එම්. එස්. හේරත්
	• මහාචාර්ය අජන්තා හපුආරච්චි මිය
	• මහාචාර්ය එස්. අයි. කීතපොන්කලන්
	• මහාචාර්ය ආර්. එස්. දසනායක
	• මහාචාර්ය නෙලුකා සිල්වා
	• මහාචාර්ය ඒ. එම්. ජී. එන්. කේ. අත්තනායක
	• මහාචාර්ය අමලා ද සිල්වා
	• මහාචාර්ය අතුල රණසිංහ
	• මහාචාර්ය එච්. ඩී. කරුණාරත්න
	• මහාචාර්ය වී. එච්. ඩබ්. දිසානායක
	• මහාචාර්ය එම්. අයි. එම්. ද සොයිසා
	• මහාචාර්ය ඒ. යූ. අබේදීර
	• මහාචාර්ය වී. පී. වික්‍රමසිංහ
	• මහාචාර්ය එන්. එල්. අබේසිංහ
	• මහාචාර්ය පී. මහවත්ත
	• මහාචාර්ය පූජ්‍ය එම්. ධම්මජෝති හිමි
	• මහාචාර්ය ටී. ඩී. කේ. වලේබොඩ
	• මහාචාර්ය එන්. ඩී. කොඩිකාර
	• මහාචාර්ය ඊ. ආර්. එච්. එස්. එස්. එදිරිවීර
	• මහාචාර්ය ඒ. පී. ජී. අමරසිංහ
	• මහාචාර්ය කේ. එස්. එච්. ද සිල්වා
	• මහාචාර්ය එම්. ඩී. එස්. ලොකුහෙට්ටි
	• මහාචාර්ය එල්. මානවඩු
	• මහාචාර්ය පූජ්‍ය ඩබ්. විමලරතන හිමි
	• මහාචාර්ය එච්. ඩී. කේ. ජී. ඒ. වීරකෝන්
	• මහාචාර්ය ඩබ්. බී. යාපා
	• මහාචාර්ය කේ. පී. එස්. සී. ජයරත්න
	• මහාචාර්ය පී. එස්. එම්. ගුණරත්න

1985 අංක 7 දරන විශ්වවිද්‍යාල (සංශෝධන) පනතේ 26 (2) (ජේ) වගන්තිය යටතේ තෝරා පත් කර ගත් සාමාජිකයෝ

• ශාස්ත්‍ර	මහාචාර්ය රමණී ජයතිලක ආචාර්ය දුපාන්ති මැන්දිස්
• අධ්‍යාපන	ඩබ්. එම්. ප්‍රඥාදර්ශන මයා
• නීති	එස්. සෙගරාජසිංහම් මිය
• කළමනාකරණ හා මූල්‍ය	මහාචාර්ය ඩබ්. පී. ජී. ද අල්විස් ආචාර්ය ජේ. ඒ. එස්. කේ. ජයකොඩි
• වෛද්‍ය	වෛද්‍ය රන්ජන් ඩයස් වෛද්‍ය ඒ. පී. මල්ලසේකර
• විද්‍යා	ඩී. එන්. ද සිල්වා මිය ආචාර්ය චන්දන ජයරත්න
පුස්තකාලයාධිපති	ඩී. සී. කුරුප්පු මිය (වැඩ බලන)
ලේකම් : ලේඛකාධිකාරී	ටී. එල්. ආර්. සිල්වා (වැඩ බලන)

1.3 රැස්වීම්

සමාලෝචිත වර්ෂය තුළ දී විශ්වවිද්‍යාලයීය පාලන අධිකාරීහු හා අනෙකුත් ඒකක ක්‍රමවත් පරිදි රැස්වූහ. එක් එක් ඒකක හා අධිකාරී ව්‍යූහයන් රැස් වූ වාර ගණන පහත පරිදි වේ:


පාලක සභාව	12
සනාතන සභාව	12
මූල්‍ය කමිටුව	12
පීඨාධිපති කමිටුව	15
නිවාඩු හා ප්‍රදාන කමිටුව	12
ව්‍යවස්ථා සම්පාදන කමිටුව	06
සැලසුම් හා සංවර්ධන කමිටුව	12
පර්යේෂණ හා සංවර්ධන කමිටුව	08
ගොඩනැගිලි කමිටුව	12
පීඨ සභා	
• ශාස්ත්‍ර පීඨය	09
• අධ්‍යාපන පීඨය	09
• නීති පීඨය	11
• කළමනාකරණ හා මූල්‍ය පීඨය	11
• වෛද්‍ය පීඨය	12
• විද්‍යා පීඨය	09
• උපාධි අධ්‍යයන පීඨය	12

1.4 සමස්ත ක්‍රියාකාරිත්වය

2012 වර්ෂයේ දී විශ්වවිද්‍යාලය තම පීඨ සත ද. අධ්‍යයනාංශ 43 ද මගින් තවදුරටත් අධ්‍යයන කටයුතු සම්පාදනය කිරීමෙහි නිරත විය.

අධ්‍යයන කාර්යමණ්ඩලය 41% කින් ද. පරිපාලන කාර්යමණ්ඩලය 3% කින් ද. අනධ්‍යයන කාර්යමණ්ඩලය 56% කින් ද සමන්විත වූ 1270 කින් යුත් කාර්ය මණ්ඩලයක සහය ලබමින් කොළඹ විශ්වවිද්‍යාලය තම ඉලක්ක කරා ගමන් කරන ලදී (රූපය I - 01).


රූපය 1-01
කාර්යමණ්ඩලය - 2012



ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, මහාචාර්ය, සහය මහාචාර්ය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සහ කථිකාචාර්ය යන අධ්‍යයන කාර්යමණ්ඩල අතර අධ්‍යයන කාර්යමණ්ඩලයෙහි සමානුපාතික බෙදීම පිළිවෙළින් 3%, 15%, 2%, 47% සහ 33% ක් විය (රූපය I - 02).

රූපය I- 02

අධ්‍යයන කාර්ය මණ්ඩල



අධ්‍යයන ක්‍රියාකාරිත්වය

වසර 140 කට වඩා වැඩි සාඩම්බර ඉතිහාසයක් සතු කොළඹ විශ්වවිද්‍යාලය "ස්වරූපයෙන් හා ස්වභාවයෙන් නවීන හා ජාත්‍යන්තර තත්ත්වයේ නාගරික විශ්වවිද්‍යාලයකට" හිමි තම ස්ථානය පවත්වාගෙන යෑමේ දී මුහුණ දෙන්නට සිදුවන අභියෝග ජයගැනීමෙහි ලා අඛණ්ඩව යත්න දරයි. එහි පිහිටීම මගින් ජාත්‍යන්තර තොරතුරු/සම්පත් කේන්ද්‍ර, පුස්තකාල, නෘත්‍ය ශාලා, ක්‍රීඩා සංකීර්ණ ආදිය වෙත පහසු ප්‍රවේශ සලසමින් "නාගරික විශ්වවිද්‍යාලයකින්" ලබාගත හැකි සියලු ආකාර වූ පහසුකම් මෙම විශ්වවිද්‍යාලය විසින් ශිෂ්‍ය ප්‍රජාව වෙත ලබා දෙයි. කොළඹ නගරය තුළ මධ්‍යගත පිහිටීම මගින් විශාල පරාසයක සංස්කෘතික, රසාස්වාදන හා ව්‍යාපාරික පහසුකම් වෙත පහසු ප්‍රවේශයක් ලබා දෙයි. කාලයේ පරීක්ෂාව ජය ගත් ශෛලමය ශක්තියක් සහිත අධ්‍යයන හා පරිපාලන යටිතල පහසුකම් හා එක් ව දීර්ඝ වූත් සාඩම්බර වූත් ඉතිහාසයෙන් පිටිවහලක් ලබමින්, ක්‍රියාකාරිත්ව ප්‍රවර්ධන ව්‍යූහමය සැලැස්මට අනුකූලව තම ප්‍රජා සේවාවෙත් ඉගැන්වීමේ හා පර්යේෂණයේත් නවීන හා නිර්මාණාත්මක ප්‍රවේශයක් වැළැඳ ගනිමින් විශ්වවිද්‍යාලය තම අභිමතාර්ථ කරා ප්‍රගමනය ලැබුවේය. සමාජ ඒකීයත්වය, සංස්කෘතික විවිධත්වය, සම අවස්ථා හා සමගිය වඩවන බහු සංස්කෘතික, බහු ජාතික, බහු ආගමික ශිෂ්‍ය හා කාර්යමණ්ඩල ප්‍රජාවක් කොළඹ විශ්වවිද්‍යාලය සතු ය. සමාලෝචිත වසර තුළ දී කිසිදු බාධාවකින් තොර ව, ඉගැන්වීම, ඉගෙනීම හා පර්යේෂණය සඳහා සහනදායී වූ පරිසරයක් තුළ විශ්වවිද්‍යාලයේ පීඨ, මණ්ඩපය, අධ්‍යයනායතන හා පාසල ඉතා සුගම ලෙස කටයුතු කරන ලදී.

ලොව සිසාරා 2012 වසර ආරම්භයේ දී සිදු කෙරුණු විශ්වවිද්‍යාල හා කොලීජි අතර වෙබ් ස්ථානගත කිරීමක දී ශ්‍රී ලංකාවේ අංක 1 ස්ථානයෙහි ද දකුණු ආසියාවේ 8 වන ස්ථානයෙහි ද ලොවෙහි 1447 වන ස්ථානයෙහි ද තත් විශ්වවිද්‍යාලය ස්ථානගත කර ඇත. දකුණු ආසියාවෙහි ද ජාත්‍යන්තරව ද ලබා ඇති තම ස්ථානය ඉහළට ගෙන ඒමට විශ්වවිද්‍යාලය මහත් සේ පරිශ්‍රමයක් දරයි.

2. පීඨ, මණ්ඩපය, කේන්ද්‍ර හා ඒකක

2.1 ශාස්ත්‍ර පීඨය

හැඳින්වීම

වැඩිම ශිෂ්‍ය ඇතුළත් කිරීම් කරණ කොටගෙන විශ්වවිද්‍යාලයේ විශාලතම පීඨය බවට පත්ව ඇති ශාස්ත්‍ර පීඨය, රිඩ් මාවතත් මහාචාර්ය ස්ටැන්ලි විජේසුන්දර මාවතත් අතර පිහිටා ඇත. ජනගහන විද්‍යා, ආර්ථික විද්‍යා, ඉංග්‍රීසි, භූගෝල විද්‍යා, ඉතිහාසය, ජාත්‍යන්තර සබඳතා, දේශපාලන විද්‍යා හා රාජ්‍ය ප්‍රතිපත්ති, සිංහල හා සමාජ විද්‍යා වශයෙන් අධ්‍යයනාංශ නවයකින් පීඨය සමන්විත වේ. මීට අමතරව, පීඨයේ ඉගැන්වීම් ඒකක සයක් (06) වන අතර, ඒවා නම් අරාබි හා ඉස්ලාමීය ශිෂ්ටාචාරය, ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් ඒකකය, (ශිෂ්‍ය පරිගණක ඒකකයෙන් හා පරිගණක ඉගැන්වීම් ඒකකයෙන් සමන්විත වූ) පරිගණක ඒකකය, ජනමාධ්‍ය ඒකකය, ගණිත ඒකකය සහ පාලි හා බෞද්ධ අධ්‍යයන ඒකකය වේ. එකී අධ්‍යයනාංශ හා ඒකක විසින් මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා අධ්‍යාපන පාඨමාලා ඉදිරිපත් කරනු ලබයි. ප්‍රථම උපාධි පාඨමාලාවන්ට අමතරව, ශාස්ත්‍රපති, දර්ශනපති සහ දර්ශනසූරී උපාධි පාඨමාලාවන් වෙත යොමු කෙරෙන පශ්චාත් උපාධි ඩිප්ලෝමා ද අධ්‍යයනාංශ කිහිපයක් විසින් ඉදිරිපත් කරනු ලබයි. සිව් වසරක තම ප්‍රථම උපාධි පාඨමාලාව සාර්ථක ලෙස නිම කරන බොහෝ සිසුනු අවසානයේ දී පීඨය විසින් ඉදිරිපත් කරනු ලබන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවකට හෝ පශ්චාත් උපාධි පාඨමාලාවකට ලියාපදිංචි වෙති. කෙසේවෙතත් අධ්‍යයන හා අනධ්‍යයන කාර්යමණ්ඩල විසින් දියත් කරන ලද වෘත්තිය සමිති ක්‍රියාමාර්ග කරණ කොටගෙන 2012 වසරේ අධ්‍යයන කටයුතු කෙරෙහි සිව් මසක කාලයක් බාධා ඇති විය.

2012 වසර තුළ මහාචාර්ය අතුල රණසිංහ ශාස්ත්‍ර පීඨයේ පීඨාධිපති වශයෙන් කටයුතු කළ අතර පීඨයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී ලෙස ආර්. ලෝගේන්ද්‍රා මහතා කටයුතු කළේය.

වසර තුළ දී මතු සඳහන් අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයින් අධ්‍යයනාංශ ප්‍රධානීන් ලෙස කටයුතු කරන ලදී. ආචාර්ය ස්වර්ණා උක්වත්ත (ජනගහන විද්‍යා); මහාචාර්ය සිරිමල් අබේරත්න (ආර්ථික විද්‍යා); 2012.11.02 දක්වා මහාචාර්ය නෙලුකා සිල්වා සහ 2012.11.03 දින සිට ආචාර්ය ඩී. මැන්දිස් (ඉංග්‍රීසි); 2012.01.15 දක්වා මහාචාර්ය ඩබ්. එන්. විල්සන් සහ 2012.01.16 සිට මහාචාර්ය එස්. ඒ. නෝඛට් (භූගෝල විද්‍යා); ආචාර්ය ඩී. එන්. එන්. ආර්. දේවසිරි (ඉතිහාසය); 2012.09.30 දක්වා මහාචාර්ය අමල් ජයවර්ධන සහ 2012.10.01 සිට 2012.11.30 දක්වා ආචාර්ය මනීපා වනසිංහ පැස්ක්වල් සහ 2012.12.01 සිට මහාචාර්ය නයනි මෙලගොඩ (ජාත්‍යන්තර සබඳතා); මහේප් සේනානායක මහතා (දේශපාලන විද්‍යාව හා රාජ්‍ය ප්‍රතිපත්ති); පූජ්‍ය අගලකඩ සිරිසුමන හිමි (සිංහල) ; මහාචාර්ය ප්‍රේමකුමාර ද සිල්වා (සමාජ විද්‍යා);

පහත සඳහන් අය අධ්‍යයන ඒකක සම්බන්ධීකාරකවරු ලෙස කටයුතු කළහ. එම්. එම්. එම්. සබ්ර් මහතා (අරාබි හා ඉස්ලාමීය ශිෂ්ටාචාර ඒකකය); 2012.09.30 දක්වා ආර්. කුලසිංහම් මිය සහ 2012.10.01 සිට එස්. ඉලංගකෝන් මිය (ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් ඒකකය); මහාචාර්ය අජන්තා හපුආරච්චි (ජනමාධ්‍ය ඒකකය); 2012.04.16 දක්වා මහාචාර්ය සිරිමල් අබේරත්න සහ 2012.05.05 සිට මහාචාර්ය එල්. මානවඩු (පරිගණක ඒකකය); 2012.01.11 දක්වා මහාචාර්ය එස්. ඒ. නෝඛට් සහ 2012.01.12 සිට ආචාර්ය එන්. රවීන්ද්‍රකුමාරන් (ගණිත ඒකකය); මහාචාර්ය අසංග තිලකරත්න (පාලි හා බෞද්ධ අධ්‍යයන ඒකකය);

පීඨයේ **මෙහෙවර** වනුයේ "ඉගැන්වීමෙන් පර්යේෂණයෙන්, පුනුණු කිරීමේ හා ඇගයීමෙන් ඉහළම අධ්‍යයන මට්ටම් හා සාරධර්ම අනුගමනය කරමින් සමාජ විද්‍යා හා මානව විද්‍යාවන්හි විදග්ධභාවය, තීක්ෂණ විමසීම, දක්ෂතා හා නිපුණතා ප්‍රවර්ධනය කිරීමත් සුවිශේෂී නිපුණතා හා දක්ෂතා පමණක් නොව පුළුල් සමාජමය හා මානවවාදී පැවැත්මක් ශිෂ්‍යයන්ට ලබා දීම හා එනයින් සමාජ වගකීමක් හා සදාචාරාත්මක කැපවීමක් සහිතව වෙනස්වන ලෝකයේ කාර්යයන් වෙත එළඹීමට හැකියාවක් ලබා දීම" යි.

ශාස්ත්‍ර පීඨයේ ප්‍රමුඛ සිදුවීම් - 2012

වාර්ෂික පීඨ ඇගයීම් වැඩමුළුව 2012 අප්‍රේල් මස 02 හා 03 යන දෙදින මෝල්කාව, කුකුලේගග රිසෝට් හිදී පවත්වන ලදී. මෙම වැඩමුළුව පවත්වන ලද්දේ පහත දක්වා ඇති අරමුණු පහ පෙරදැරි කරගෙනයි.

1. විෂයමාලා හා ඇගයීම් සඳහා ප්‍රමිති සාධනය
2. තොරතුරු තාක්ෂණ කුසලතා වර්ධනය
3. ඉංග්‍රීසි භාෂා නිපුණතා වර්ධනය
4. පර්යේෂණ සංස්කෘතියක් හා සංවර්ධනය ඉගැන්වීම
5. කාර්යමණ්ඩල - ශිෂ්‍ය කටයුතු හා සුභසාධනය

මෙම කරුණු සම්බන්ධයෙන් කණ්ඩායම් පහක් කටයුතු කරන ලද අතර, තත්ත්ව වාර්තාවන් හා පවත්නා තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා යාවත්කාල ක්‍රියාකාරී සැලසුම් ද ඇගයීම් වැඩමුළුවේ දී ඉදිරිපත් කරන ලදී. ඉහත දක්වා ඇති අරමුණු සාක්ෂාත් කර ගැනීමට හැකි වන සේ ක්‍රියාකාරී සැලසුම සංවර්ධනය කිරීම වැඩමුළුව අවසානයේ දී සිදු කරන ලදී. 2012/13 අධ්‍යයන වර්ෂවල සිට ඇතුලත් කර ගනු ලබන පළමු වසරේ සිසුන් සඳහා මෙම ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක වනු ඇත.

සමාලෝචිත වර්ෂයේ දී 2012 අගෝස්තු 16 හා 17 යන දෙදින තුළ පර්යේෂණ පත්‍රිකා 26 ක් ඉදිරිපත් කරමින් "ඒකාග්‍ර කිරීමේ තාක්ෂණයන් හා තිරසාර ප්‍රජාවන්" යන මැයෙන් පවත්වන ලද කොළඹ විශ්වවිද්‍යාලයීය වාර්ෂික පර්යේෂණ පරිසංවාදය සඳහා, පීඨ අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයෝ දායක වූහ. ජනගහන විද්‍යා, ආර්ථික විද්‍යා, භූගෝල විද්‍යා, සිංහල, සමාජ විද්‍යා හා ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් ඒකකය, ජනමාධ්‍ය ඒකකය, පාලි හා බෞද්ධ අධ්‍යයන ඒකකය යන අංශයන් හා සම්බන්ධ අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයන් විසින් පර්යේෂණ පත්‍රිකා ලබාදීමෙන් දායක විය.

පසුගිය වර්ෂයන්හි දී මෙන් ම 2012 වසරේ දී ද ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය විසින් දකුණු ආසියානු ශිෂ්‍ය තරගය (SAESM) සඳහා ශිෂ්‍ය සහභාගීත්වය සංවිධාන කිරීම කෙරෙහි ප්‍රමුඛ අවධානය යොමු කරන ලදී. 2004 වසරේ සිට ම අධ්‍යයනාංශය මෙම වැඩසටහනට සම්බන්ධ විය. 2012 දෙසැම්බර් 17 වන දා සිට 2012 දෙසැම්බර් 22 වන දා දක්වා නේපාලයේ කත්මන්ඩු නුවර දී පැවති මෙම අවස්ථාවට පත්‍රිකා ඉදිරිපත් කිරීමට සිසුන් උත්සුක කරවීමෙන් සහභාගි වන සිසුන් විසින් සිදු කරනු ලබන ඉදිරිපත් කිරීම් සූදානම් කිරීමෙන් ප්‍රධාන භූමිකාව SAESM හි නියෝජ්‍ය සම්බන්ධීකාරක ආචාර්ය එන්. රවීන්ද්‍රකුමාරන් විසින් දරන ලදී. ආචාර්ය එන්. රවීන්ද්‍රකුමාරන් සමග ප්‍රථම උපාධි අපේක්ෂක ශිෂ්‍යයන් 10 දෙනෙකු ද මෙම අවස්ථාවට සහභාගි විය.

ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය විසින් විශ්වවිද්‍යාලයීය ආර්ථික විද්‍යාඥයන්ගේ සම්මේලනයෙහි ශ්‍රී ලංකා ආර්ථික විද්‍යා පර්යේෂණ සමූළුවේ ප්‍රථම ජාත්‍යන්තර වාර්ෂික සැසිය 2012 නොවැම්බර් මස 29 හා 30 යන දෙදින පවත්වන ලද අතර, ආර්ථික විද්‍යාව පිළිබඳ ලාභෝර් පාසලේ ශිෂ්‍යයෝ 2012 දෙසැම්බර් 16 සිට 23 වන දා දක්වා කොළඹ විශ්වවිද්‍යාලයෙහි සංචාරයක නිරත වූහ.

සිංහල අධ්‍යයනාංශයේ දෙවන වාර්ෂික පර්යේෂණ පරිසංවාදය 2012 දෙසැම්බර් මස 10 වන දින එම්. බී. ආරියපාල ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදී. "සිංහල අධ්‍යයනයෙහි නව දිශානතීන්" යන පොදු මාතෘකාව යටතේ ශ්‍රී ලංකාවේ සියලු විශ්වවිද්‍යාල නියෝජනය වන පරිදි විද්වතුන් පිරිසක් විසින් තම අධ්‍යයන පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කරන ලදී. සාහිත්‍ය සම්මන්ත්‍රණයක් ද ඇතුළු ව 125 වන කුමාරතුංග මුනිදාස ජන්ම සංවත්සරය නිමිති කොට පවත්වන ලද අනුස්මරණ උත්සවය 2012 නොවැම්බර් මස 12 වන දා සිංහල අධ්‍යයනාංශයේ දී පවත්වන ලදී. බීපීං විදේශීය භාෂා පිළිබඳ විශ්වවිද්‍යාලය සමග අන්සන් කරන ලද අවබෝධතා ගිවිසුමට අනුව චීන සිසුන් 08 දෙනෙක් සිංහල අධ්‍යයනාංශයෙන් සිංහල භාෂාව ඉගෙනීම සඳහා ලියාපදිංචි වූහ.

ඉංග්‍රීසි අධ්‍යයනාංශය හා ජර්මනියේ, ජස්ටස් ලීබග් විශ්වවිද්‍යාලයේ අන්ග්ලිස්ටික් අධ්‍යයනායතනය අතර පවත්නා ශිෂ්‍ය හා අධ්‍යයන කාර්යමණ්ඩල හුවමාරු වැඩසටහන 2012 වසරේ දී ද සාර්ථක ලෙස අඛණ්ඩව පවත්වන ලදී. 2012 වසරේ පළමු සෙමෙස්තරයෙහි දී ජර්මනියට පිටත්ව යාම සඳහා ශිෂ්‍යයන් තිදෙනෙකු හා අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයන් දෙදෙනෙකු අධ්‍යයනාංශයෙන් තෝරා ගනු ලැබූ අතර, ජේ. එල්. යූ. වෙතින් ශිෂ්‍යයන් 03 දෙනෙක් ඉංග්‍රීසි අධ්‍යයනාංශයෙහි දෙවන සෙමෙස්තරය සඳහා ලියා පදිංචි වූහ.

කොළඹ විශ්වවිද්‍යාලයේ සමාජවිද්‍යා අධ්‍යයනාංශයේ සම්මන්ත්‍රණ මාලාව අධ්‍යයනාංශය විසින් 2012 වසර සඳහා යලි දියත් කරන ලදී. 2012 වසර මුළුල්ලේ ම විවිධ විෂය ක්ෂේත්‍ර හා සම්බන්ධ වූ

කිර්තිමත් විද්වත් පිරිස් විසින් ඉදිරිපත් කිරීම් සිදු කරනු ඇත. සහ-සම්බන්ධතා පර්යේෂණ හා කාර්යමණ්ඩල හා ශිෂ්‍ය හුවමාරු වැඩසටහන් සඳහා ඇමරිකා එක්සත් ජනපදයේ වර්ජිනියා ටෙක් විශ්වවිද්‍යාලයෙහි සමාජවිද්‍යා අධ්‍යයනාංශය සමග අවබෝධතා ගිවිසුමක් අධ්‍යයනාංශය විසින් අත්සන් තබන ලදී. ඔස්ට්‍රේලියාවේ ඩීකින් විශ්වවිද්‍යාලය සමග ද මීට සමාන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා සාකච්ඡා පවත්වන ලදී.

පීඨ පත්කිරීම්

ඉංග්‍රීසි අධ්‍යයනාංශයේ ආචාර්ය ඩී. මැන්දිස් **2012.03.26** දින සිට ක්‍රියාත්මක වන පරිදි අධ්‍යයන අධ්‍යක්ෂ තනතුරින් ඉල්ලා අස් වූ අතර, සමාජ විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්ය ගමිලා සමරසිංහ **2012.05.09** දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩ බලන අධ්‍යයන අධ්‍යක්ෂ තනතුරට පත් වූවාය.
ආචාර්ය චන්ද්‍රසිරි නිරිඇල්ල තොරතුරු හා ප්‍රලේඛන කේන්ද්‍රයේ (අයි. ඩී. සි.) සම්බන්ධීකාරක තනතුරෙහි තවදුරටත් කටයුතු කළේය.

ප්‍රථම උපාධි වැඩසටහන්

2012 වසරේ දී, පීඨයෙහි සම්පූර්ණ ප්‍රථම උපාධි අපේක්ෂක ශිෂ්‍ය සංඛ්‍යාව **2261**කට වැඩි විය. **2011** උසස් පෙළ කණ්ඩායම ඇතුළත් කර ගැනීම උසස් පෙළ විභාග ගැටලුව කරණ කොටගෙන ප්‍රමාද විය. සම්මාන සඳහා සීමාවාසික පාඨමාලා ද සහිත ව විවිධ මාදිලියේ පාඨමාලා රැසක් සිසුන් වෙත ඉදිරිපත් කරමින් අධ්‍යයන ඒකක ක්‍රමය තවදුරටත් ක්‍රියාත්මක කෙරිණි.

ප්‍රජා විද්‍යා අධ්‍යයනාංශය විසින් ද ශිෂ්‍යයන් වෙත සාමාන්‍ය හා විශේෂ උපාධි ඉදිරිපත් කරන ලදී. සාමාන්‍ය උපාධිය සඳහා විෂයයක් ලෙස ද, අනෙකුත් විශේෂ උපාධි අපේක්ෂක සිසුන් හට දෙවන හා තෙවන විෂයයක් ලෙස ද අධ්‍යයනාංශය විසින් ප්‍රජා විද්‍යාව තවදුරටත් ඉදිරිපත් කරන ලදී.

ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය විසින් ආර්ථික විද්‍යාව පිළිබඳ සාමාන්‍ය හා විශේෂ උපාධි තවදුරටත් ඉදිරිපත් කරන ලදී. ප්‍රථම වසරේ අධ්‍යයන වැඩසටහනට ශිෂ්‍යයන් **132** දෙනෙකු ආර්ථික විද්‍යාව විෂයයක් ලෙස තෝරාගන්නා ලදී. දෙවන, තෙවන සහ සිව්වන වසරවල දී විශේෂ විභාග සඳහා විෂයයක් ලෙස ආර්ථික විද්‍යාව ඉදිරිපත් කරන ලද මුළු ශිෂ්‍ය සංඛ්‍යාව **197** කි. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් අධ්‍යයන වැඩසටහන් ඉදිරිපත් කිරීමට අධ්‍යයනාංශය විසින් තවදුරටත් කටයුතු කරන ලද අතර, භාෂා දෙකෙන් ම දේශන පවත්වන ලද අවස්ථාවන්හි දී පවා ඉංග්‍රීසි භාෂාවෙහි නිපුණ සිසුන්හට ඉංග්‍රීසි භාෂාවෙන් පිළිතුරු සපයන්නට අවස්ථාව ලබා දෙන ලදී. ආර්ථික විද්‍යා විශේෂ උපාධි පාඨමාලාවෙහි අවසන් වසරේ සියලු සිසුන් සීමාවාසික පුහුණුවක් සඳහා තෙමසක කාලයකට විවිධ රාජ්‍ය හා පුද්ගලික අංශයේ ආයතනයන්හි සේවයෙහි යොදවන ලදී.

ඉංග්‍රීසි අධ්‍යයනාංශය විසින් සාමාන්‍ය හා විශේෂ උපාධි පාඨමාලා සඳහා ඉංග්‍රීසි සාහිත්‍යය, ඉංග්‍රීසි භාෂාව හා ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් (ELT) සහ සංස්කෘතික අධ්‍යයන වැනි පාඨමාලා ඒකක විශාල පරාසයක් ඉදිරිපත් කරන ලදී. අධ්‍යයනාංශය විසින් අමතර නවක ශිෂ්‍ය ඇතුළත් කිරීම් යටතේ ඇතුළත් කර ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව හා බාහිර ව ප්‍රථම වසරේ උපාධි පරීක්ෂණය සම්පූර්ණ කරන ලද ඉංග්‍රීසි ගුරු හවතුන් සංඛ්‍යාව ද වැඩි කරන ලදී. උපාධිධාරී ඉංග්‍රීසි ගුරුවරුන්, නොයෙක් ආයතනයන්හි පුහුණුකරුවන්, ප්‍රතිපත්ති සැලසුම්කරුවන් ආදීන් ලෙස කටයුතු කිරීමේ දී මෙම ශිෂ්‍යයන්ට ඉංග්‍රීසි භාෂාව හා ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම යන පාඨමාලා ඒකක විශේෂයෙන් ම උපකාරී විය.

භූගෝල විද්‍යා අධ්‍යයනාංශය විසින් සාමාන්‍ය හා විශේෂ උපාධි ශිෂ්‍යයන් හට පාඨමාලා ඉදිරිපත් කරන ලදී. අධ්‍යයනාංශයේ මෙහෙවර වූයේ ප්‍රථම උපාධි පාඨමාලාවන්හි නව අධ්‍යයන කොටස් තව දුරටත් සංවර්ධනය කිරීමේ කර්තව්‍යයයි.

ඉතිහාස අධ්‍යයනාංශය විසින් ශිෂ්‍යයන්ට සාමාන්‍ය හා විශේෂ උපාධි තවදුරටත් ඉදිරිපත් කරන ලදී. **2010** වසරේ දී අධ්‍යයනාංශය වෙන් වීමෙන් පසු දැන් එය ස්වාධීන අධ්‍යයනාංශයක් ලෙස කටයුතු කරයි.

ජාත්‍යන්තර සබඳතා අධ්‍යයනාංශය සාමාන්‍ය හා විශේෂ උපාධි පාඨමාලා ඉදිරිපත් කරනු ලබයි. ප්‍රථම උපාධි අපේක්ෂක ශිෂ්‍යයන් විසින් ඉතා කැමැත්තෙන් හැදෑරීමට උත්සුක වන ප්‍රථම වසරේ විෂයයක්

බවට මෙම විෂයය පත් ව ඇත. මේ නිසා, අනෙකුත් අධ්‍යයනාංශවලට සාපේක්ෂ ව, විශේෂ උපාධි වැඩසටහන් සඳහා වැඩිම සංඛ්‍යාවක ශිෂ්‍ය පිරිසක් ඇතුළත් කර ගැනීමට අධ්‍යයනාංශය තීරණය කර ඇත.

දේශපාලන විද්‍යා හා රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනාංශ විසින් සාමාන්‍ය හා විශේෂ උපාධි ශිෂ්‍යයන්ට පාඨමාලා ඉදිරිපත් කරන ලද අතර, සිංහල අධ්‍යයනාංශය විසින් ද මෙසේ සාමාන්‍ය හා විශේෂවේදී උපාධි හදාරන සිසුන්ට පාඨමාලා ඉදිරිපත් කර ඇත. සිංහල අධ්‍යයනාංශය විසින් මාසික සම්මන්ත්‍රණ මාලාවක් පවත්වමින් සිසුන්ගේ පර්යේෂණ හැකියාවන් දිරි ගැන්වීමකට ලක් කරන ලදී.

සමාජ විද්‍යා අධ්‍යයනාංශය සමාජ විද්‍යාව සඳහා විශේෂ උපාධි අධ්‍යයන පාඨමාලාවක් මෙන් ම සාමාන්‍ය උපාධිය සඳහා ද විෂයයක් වශයෙන් සමාජ විද්‍යාව ඉදිරිපත් කරන ලදී. තම අධ්‍යයනාංශයේ ප්‍රථම උපාධි ශිෂ්‍යයන්ට වඩා යහපත් අධ්‍යයන පරිසරයක් ගොඩනැගීම් වස්, වැඩිවශයෙන් තම අරමුදල් ම යොදවා ගනිමින් අධ්‍යයනාංශය තවදුරටත් තම යටිතල පහසුකම් හා අනෙකුත් පහසුකම් වැඩිදියුණු කිරීමේ නිරත ව සිටියි.

පාලි හා බෞද්ධ අධ්‍යයන ඒකකය විසින් ප්‍රධාන අධ්‍යයන පාඨමාලා සතරක් ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන් සඳහා ඉදිරිපත් කරන ලදී: එනම්, බෞද්ධ අධ්‍යයන (සාමාන්‍ය උපාධිය), බෞද්ධ අධ්‍යයන (විශේෂ උපාධිය), පාලි අධ්‍යයන (සාමාන්‍ය උපාධිය) හා එක් වසරක නවීන චීන භාෂා වැඩසටහන වේ.

2012 වසරේ දී ද, ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් ඒකකය කෙටි කාලීන හා අඛණ්ඩ අධ්‍යයන පාඨමාලා ඔස්සේ (ප්‍රථම උපාධි අධ්‍යයන පාඨමාලා ඉදිරිපත් කරමින්) උපාධි අධ්‍යයන පීඨය හැර කොළඹ විශ්වවිද්‍යාලයේ අනෙකුත් පීඨ සය වෙත තම සේවා සැපයීය. සිසුන්ගේ ඉංග්‍රීසි භාෂා නිපුණතා පුළුල් කිරීමේ අරමුණ පෙරදැරි කරගෙන මෙම පාඨමාලා ඉදිරිපත් කරනු ලබයි. මෙම 2012 වසරේ දී, ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් ඒකකය විසින් ශාස්ත්‍ර පීඨයේත්, කළමනාකරණ හා මූල්‍ය පීඨයේත්, නීති පීඨයේත් සිසුන් සඳහා විශ්වවිද්‍යාලය සතු ඉගෙනීම් කළමනාකරණ පද්ධතිය ඔස්සේ ජාලගත ඉගැන්වීම් උපකරණ හඳුන්වා දෙන ලදී.

වඩා යහපත් ඉගැන්වීම් හා ඉගෙනුම් අත්දැකීමක් තම ප්‍රථම උපාධි සිසුන් සඳහා ලබා දීම අරමුණු කරගෙන, අරාබි හා ඉස්ලාමීය ශිෂ්ටාචාර ඒකකය (අයි. සී. වී. ඒකකය) විසින් එහි යටිතල පහසුකම් සංවර්ධනය කිරීම මගින් 2012 වර්ෂයේ දී එම ඒකකය සවිමත් කරන ලදී.

ගණිතය බොහෝ අධ්‍යයන ක්ෂේත්‍ර සඳහා අන්තර්-විෂයීය විෂයයක් වන අතර, ගණිත ඒකකය (එම්. යූ.) විසින් ශාස්ත්‍ර පීඨ ශිෂ්‍යයන් වෙනුවෙන් පාඨමාලා ඒකක තුනක් ඉදිරිපත් කරන ලදී.

නුදුරු අනාගතයේ දී විශේෂ උපාධි පාඨමාලා ඉදිරිපත් කිරීමේ අභිප්‍රායයෙන් හා තනි අධ්‍යයනාංශයක් ලෙස ස්ථාපනය වීමේ අරමුණ පෙරදැරි කරගෙන, 2012 වර්ෂයේ දී ජනමාධ්‍ය ඒකකය විෂය මාලා ඇගයීමක් සිදුකරන ලදී.

ව්‍යාප්ති පාඨමාලා හා ප්‍රජා සේවා ලබාදීමේ වැඩසටහන් - 2012.

වාර්ෂිකව රුපියල් මිලියන 07 කට ආසන්න දායකත්වයක් සපයමින් විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදලේ විශාලතම දායකයා ලෙස රැඳී සිටීමට පීඨය වෙත හැකියාව උදා කර දෙමින් සාර්ව ප්‍රජාව වෙත වෘත්තීමය වර්ධන නිපුණතා ලබා දීම ඔස්සේ 2012 වසරේ දී ශාස්ත්‍ර පීඨය විසින් ව්‍යාප්ති පාඨමාලා බොහෝ ගණනක් ඉදිරිපත් කරන ලදී.

2012 අප්‍රේල් මස ජනගහන අධ්‍යයනාංශය විසින් මාණ්ඩලික නිලධාරීන් 25 දෙනෙකු සඳහා මිනිස් බල සැලසුම්කරණය හා පුරෝකථනය පිළිබඳ තුන් දින පුනුණු වැඩසටහනක් පවත්වන ලදී.

ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය විසින් ඩිප්ලෝමා පාඨමාලා දෙකක් ඉදිරිපත් කරන ලදී: සංචාරක, ගමනාගමන ආර්ථිකවිද්‍යාව හා හෝටල් කළමනාකරණ ඩිප්ලෝමාව සහ සූක්ෂ්ම මූල්‍ය ඩිප්ලෝමාව එම ඩිප්ලෝමා පාඨමාලා දෙකයි.

ඉංග්‍රීසි අධ්‍යයනාංශය විසින් සාමාන්‍ය මහජනතාව අතුරින් **3000** ක් පමණ දෙනෙකු වෙත ඉංග්‍රීසි බසින් ව්‍යාප්ති පාඨමාලා හා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ නොයෙක් ආයතන වෙනුවෙන් උපදේශක සේවා පවත්වන ලදී. අධ්‍යයනාංශය විසින් වෘත්තීන් සඳහා ඉංග්‍රීසි (1 හා 2 කොටස්) සහ නීතිය සඳහා ඉංග්‍රීසි (1 හා 2 කොටස්) යන සහතික පත්‍ර පාඨමාලා ද ඉදිරිපත් කරන ලදී. පරිපාලන හා අධ්‍යයන අවශ්‍යතා සඳහා උසස් ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලා ද ඉංග්‍රීසි ගුරුභවතුන් සඳහා ඉංග්‍රීසි ඩිප්ලෝමා ව (DETE) ද ඉංග්‍රීසි මාධ්‍යයෙන් උගැන්වීම් කටයුතුවල යෙදෙන ගුරු භවතුන් සඳහා ඩිප්ලෝමාවක් (DEEMIT) ද පවත්වන ලදී.

ජාත්‍යන්තර සබඳතා අධ්‍යයනාංශය විසින් ජාත්‍යන්තර සබඳතා සඳහා සහතික පත් පාඨමාලාව (සි. සි. අයි. ආර්.) හා ගැටුම්. සාමය හා නිරාකරණය පිළිබඳ සහතික පත් පාඨමාලාව (සී. පී. ආර්.) යනුවෙන් ව්‍යාප්ති පාඨමාලා දෙකක් ඉදිරිපත් කරන ලදී.

දේශපාලන විද්‍යා හා රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනාංශ විසින් "දේශපාලනය හා පාලනය පිළිබඳ සහතිකපත් පාඨමාලාව" යනුවෙන් නව සහතිකපත් පාඨමාලාවක් අරඹන ලදී.

සිංහල අධ්‍යයනාංශය ද 2011 අග භාගයේ දී සිංහල පිළිබඳ නව ඩිප්ලෝමා පාඨමාලාවක් අරඹන ලද අතර 2012 වසරේ දී ද එම පාඨමාලා ව අඛණ්ඩව පවත්වන ලදී.

ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් ඒකකය විසින් එම්-ඉගෙනුම් වේදිකාවෙන් ව්‍යාපාරික ඉංග්‍රීසි සඳහා විද්‍යුත් ඩිප්ලෝමාවක් හා ව්‍යාපාරික ඉංග්‍රීසි (ප්‍රාරම්භක අදියර හා අන්තර්මධ්‍ය අදියර) සඳහා සහතිකපත් පාඨමාලා ඉදිරිපත් කරන ලදී.

2012 වසරේ දී ද ජනමාධ්‍ය ඒකකය විසින් ජනමාධ්‍ය ඩිප්ලෝමා ව තවදුරටත් ඉදිරිපත් කරන ලදී.

ව්‍යාප්ති පාඨමාලාවන්හි ශිෂ්‍ය ඇතුලත් කිරීම් - 2012

පාඨමාලාව	**ශිෂ්‍ය සංඛ්‍යාව**
සංචාරක. ගමනාගමන ආර්ථිකවිද්‍යාව හා හෝටල් කළමනාකරණ ඩිප්ලෝමාව	36
සුසපම මූල්‍ය පිළිබඳ ඩිප්ලෝමාව	11
වෘත්තීන් සඳහා ඉංග්‍රීසි සහතිකපත් පාඨමාලාව 1 කොටස 11 කොටස	 406 473
නීතිය සඳහා ඉංග්‍රීසි සහතිකපත් පාඨමාලාව 1 කොටස 11 කොටස	 19 18
පරිපාලනමය හා වෘත්තිමය අවශ්‍යතා සඳහා උසස් ඉංග්‍රීසි ඩිප්ලෝමාව ප්‍රාරම්භක අදියර අවසන් අදියර	 393 334
ඉංග්‍රීසි ගුරුභවතුන් සඳහා ඉංග්‍රීසි ඩිප්ලෝමාව (ඩී ඒ ටී ඒ) 1 කොටස 11 කොටස	 147 165
ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීම් කටයුතු සිදුකරන ගුරුභවතුන් සඳහා ඉංග්‍රීසි ඩිප්ලෝමාව (ඩී ඒ ඒ එම් අයි ටී) 1 කොටස 11 කොටස	 57 80
ජාත්‍යන්තර සබඳතා පිළිබඳ සහතිකපත් පාඨමාලාව (සි සි අයි ආර්)	18
දේශපාලනය හා පාලනය පිළිබඳ සහතිකපත් පාඨමාලාව	18

සිංහල ඩිප්ලෝමාව	21
ව්‍යාපාරික ඉංග්‍රීසි පිළිබඳ සහතික පත්‍රය - 21 වන කණ්ඩායම ප්‍රාරම්භක අදියර අන්තර් මධ්‍ය අදියර උසස් අදියර	 56 118 52
ව්‍යාපාරික ඉංග්‍රීසි පිළිබඳ සහතික පත්‍රය - 22 වන කණ්ඩායම ප්‍රාරම්භක අදියර අන්තර් මධ්‍ය අදියර උසස් අදියර	 148 200 78
ව්‍යාපාරික ඉංග්‍රීසි පිළිබඳ ඒ-ඩිප්ලෝමාව	38
ජනමාධ්‍ය ඩිප්ලෝමාව	161
එකතුව	**3047**

පශ්චාත් උපාධි පාඨමාලා 2012

2012 වර්ෂයේ දී පීඨය විසින් බොහෝ ගණනක් පශ්චාත් උපාධි පාඨමාලා ඉදිරිපත් කරන ලදී.

ප්‍රජා විද්‍යා අධ්‍යයනාංශය 2010 වර්ෂයේ දී ආරම්භ කරන ලද ජනගහන අධ්‍යයන පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව 2012 වර්ෂයේ දී අඛණ්ඩව පවත්වාගෙන යන ලදී.

ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය විසින් ආර්ථික විද්‍යාව පිළිබඳ දර්ශනපති/දර්ශන විශාරද, ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති, මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති, හා ආර්ථික සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (ඩී. ඒ. ඩී.) සහ සංචාරක ආර්ථික විද්‍යා හා හෝටල් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව යන උපාධි අධ්‍යයන පාඨමාලා ඉදිරිපත් කරන ලදී. ආර්ථික විද්‍යා අධ්‍යයනාංශයේ පශ්චාත් උපාධි සිසුන් හට තම පර්යේෂණ හා ඉදිරිපත් කිරීමේ කුසලතා ප්‍රදර්ශනය කිරීමට අවස්ථාවක් ලබා දීමේ අරමුණින් සංවිධාන කරන ලද 2012 වසරේ පශ්චාත් උපාධි පරිසංවාදය කොළඹ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යයනාංශයේ දී, 2012 අගෝස්තු මස පවත්වන ලදී.

ඉංග්‍රීසි අධ්‍යයනාංශය විසින් 2012 වර්ෂයෙහි දී ද ඉංග්‍රීසි ශාස්ත්‍රපති/දර්ශනපති (පර්යේෂණ) උපාධි අධ්‍යයන වැඩසටහන් තවදුරටත් ඉදිරිපත් කරන ලදී. 2011 අගෝස්තු මස දී භූගෝල විද්‍යා අධ්‍යයනාංශය විසින් පාරිසරික හා කලාපීය සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව අරඹන ලද අතර, 2012 වසරේ දී ද අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. ඉතිහාසය අධ්‍යයනාංශය විසින් ඉතිහාසය පිළිබඳ පශ්චාත් (පර්යේෂණ) උපාධියක් (ශාස්ත්‍රපති හා දර්ශනපති) ඉදිරිපත් කරන ලදී.

ජාත්‍යන්තර සබඳතා පිළිබඳ අධ්‍යයනාංශය විසින් ද ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (එම්. ඒ. අයි. ආර්.) හා ජාත්‍යන්තර සබඳතා පිළිබඳ දර්ශනපති (පර්යේෂණ) උපාධිය තවදුරටත් ඉදිරිපත් කරන ලදී.

දේශපාලන විද්‍යා හා රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනාංශය ශාස්ත්‍රපති පර්යේෂණ උපාධිය වෙත ඉලක්ක වන අධ්‍යයන වැඩසටහන් ක්‍රියාත්මක කළ අතර, නෝර්වේහි ඔස්ලෝ විශ්වවිද්‍යාලය සමග සහසම්බන්ධයෙන් ක්‍රියාත්මක කෙරෙන දේශපාලන විද්‍යාව පිළිබඳ අධ්‍යයන ඒකක හා පර්යේෂණ ශාස්ත්‍රපති පාඨමාලාව තවදුරටත් ඉදිරිපත් කරන ලදී. සිංහල අධ්‍යයනාංශය විසින් 2012 වර්ෂයේ නොවැම්බර් මස සිංහල ශාස්ත්‍රපති උපාධි අධ්‍යයන වැඩසටහන ආරම්භ කරන ලද අතර එය 2012 වසරේ දී ද තවදුරටත් පවත්වන ලදී.

2012 වර්ෂය තුළ සමාජ විද්‍යා අධ්‍යයනාංශය විසින් පශ්චාත් උපාධි අධ්‍යයන වැඩසටහන් තුනක් පවත්වන ලදී. එනම්, ව්‍යවහාරික සමාජ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, සමාජවිද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය හා සමාජවිද්‍යා ශාස්ත්‍රපති උපාධිය යන පශ්චාත් උපාධි අධ්‍යයන වැඩසටහන් වේ.

බෞද්ධ අධ්‍යයන පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හා බෞද්ධ අධ්‍යයන පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලා ආරම්භ කිරීම සඳහා පාලි හා බෞද්ධ අධ්‍යයන ඒකකය විශ්වවිද්‍යාල පාලක සභාවේ හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිපත් සභාවේ අනුමැතිය බලාපොරොත්තුවෙන් සිටියි.

පශ්චාත් උපාධි වැඩසටහන් වෙත ශිෂ්‍ය ඇතුලත් කිරීම් - 2012

අධ්‍යයන වැඩසටහනේ නම	**ශිෂ්‍ය සංඛ්‍යාව**
ජනගහන අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (2010 වසරේ අරඹා 2012 වසරේ දී ද තවදුරටත් පවත්වනු ලැබේ)	14
ආර්ථික විද්‍යා දර්ශනපති/දර්ශන විශාරද (2010 වසරේ අරඹා 2012 වසරේ දී ද තවදුරටත් පවත්වනු ලැබේ)	20
ආර්ථික විද්‍යා ශාස්ත්‍රපති	34
මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති	90
ආර්ථික සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	15
සංචාරක ආර්ථික විද්‍යාව හා හෝටල් කළමනාකරණය (2011 වසරේ අරඹා 2012 වසරේ දී ද තවදුරටත් පවත්වනු ලැබේ)	62
ඉංග්‍රීසි පිළිබඳ ශාස්ත්‍රපති (පර්යේෂණ) උපාධිය	04
ඉංග්‍රීසි දර්ශනපති (පර්යේෂණ) උපාධිය	01
පාරිසරික හා කලාපීය සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (2011 වසරේ අරඹා 2012 වසරේ දී ද තවදුරටත් පවත්වනු ලැබේ)	35
ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - 1 කොටස (2011 වසරේ අරඹා 2012 වසරේ දී ද තවදුරටත් පවත්වනු ලැබේ)	40
ජාත්‍යන්තර සබඳතා පිළිබඳ දර්ශනපති	01
සිංහල ශාස්ත්‍රපති (2011 වසරේ අරඹා 2012 වසරේ දී ද තවදුරටත් පවත්වනු ලැබේ)	66
සමාජවිද්‍යා ශාස්ත්‍රපති (2011 වසරේ අරඹා 2012 වසරේ දී ද තවදුරටත් පවත්වනු ලැබේ)	32
ව්‍යවහාරික සමාජවිද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (2011 වසරේ අරඹා 2012 වසරේ දී ද තවදුරටත් පවත්වනු ලැබේ)	25
එකතුව	**439**

යටිතල පහසුකම් සංවර්ධනය - 2012

පීඨයෙහි පහත සඳහන් ප්‍රධාන යටිතල පහසුකම් සංවර්ධන කටයුතු 2012 වසරේ දී අවසන් විය.

1. එච්. ඒ. ටී. සී. ව්‍යාපෘතිය යටතේ නව පරිගණක **50** කින් යුත් නව පරිගණක විද්‍යාගාරයක් ස්ථාපිත කරන ලදී.
2. සිසුන්ගේ හා අමුත්තන්ගේ ප්‍රයෝජනය සඳහා ප්‍රධාන දොරටුව අබියස ප්‍රදේශය සඳහා ගෘහභාණ්ඩ ප්‍රසම්පාදනය හා සවිකිරීම.
3. ජල ටැංකියේ හා ජල ටැංකි කුළුණෙහි සුළු අළුත්වැඩියා කටයුතු හා බාහිර පින්තාරු කිරීම්.
4. නව කලාගාරයේ අළුත්වැඩියා කිරීම් හා වැඩි දියුණු කිරීම්.
5. දැන්වීම් පුවරු ප්‍රසම්පාදනය හා සවිකිරීම්.
6. ප්‍රධාන දේශනාගාර **03** ක් සඳහා බහු මාධ්‍ය ප්‍රක්ෂේපක (Multimedia projectors) ප්‍රසම්පාදනය හා සවි කිරීම.
7. සිසුන්ගේ පරිහරණය සඳහා කොන්ක්‍රීට් ආසන **60** ක් ප්‍රසම්පාදනය කොට සවි කිරීම.
8. ගොඩනැගිල්ලේ **01** වන ඒකකය සඳහා වයි-ෆයි පහසුකම් ප්‍රසම්පාදනය හා සවි කිරීම.
9. ප්‍රධාන දේශනාගාරයට තිර රෙදි ප්‍රසම්පාදනය හා සවි කිරීම.
10. නව දේශනාගාර අංක 1 - 2 හා එල්-**35**-**36** කාමර විභාග ශාලා බවට පරිවර්තනය කර වෙනස් කිරීම.
11. ප්‍රධාන දොරටුවෙහි බැම්මෙහි ඉදි කිරීම් කටයුතු.
12. සභා ශාලාව නවීකරණය කිරීම.

ඉහත කී කටයුතුවලට අමතර ව, දේශපාලන විද්‍යා හා රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ අධ්‍යයනාංශය විසින් නවීන පන්නයේ සම්මන්ත්‍රණ ශාලාවක් ඉදි කෙරෙමින් පවතී. ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් ඒකකය විසින්

ද තම කාර්යමණ්ඩල විවේකාගාරය කුඩා ශ්‍රවණාගාරයක් බවට පරිවර්තනය කර ගැනීම සඳහා එච්. ඒ. ටී. සී. ව්‍යාපෘති අරමුදල් භාවිතා කරන ලදී. එච්. ඒ. ටී. සී. ව්‍යාපෘතිය යටතේ නොයෙකුත් අධ්‍යයනාංශයනට අයත් මධ්‍ය පරිමාණ දේශනාගාර බොහොමයක් නවීකරණය කරන ලදී. පීඨ ගොඩනැගිල්ලෙහි සියලු කාමර දෘශ්‍යාබාධිත කාර්යමණ්ඩල සාමාජිකයන් හා සිසුන්ගේ යහපත සඳහා බ්‍රේල් අකුරින් නම් කරන ලදී.

2.1.1 සම්පත් හා ශිෂ්‍ය තොරතුරු:

පීඨය	පාඨමාලාව	මූළු ශිෂ්‍ය සංඛ්‍යාව	මූළු අධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව (ස්ථිර)	මූළු අනධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව (ස්ථිර)
ශාස්ත්‍ර	ශාස්ත්‍රවේදී (සාමාන්‍ය හා විශේෂ උපාධි)	2261	139	53

2.1.2 දේශීය සිසුන් පිළිබඳ තොරතුරු

පීඨය	පාඨමාලාව	මාධ්‍යය	2012 ඇතුලත් කිරීම්	පළමු වසර සිසුන්	දෙවන වසර සිසුන්	තෙවන වසර සිසුන්	සිව්වන වසර සිසුන්	උපාධිලාභී සංඛ්‍යාව
ශාස්ත්‍ර	ජන සංඛ්‍යා	සි/ඉ		197	285	266	23	
	ආර්ථික විද්‍යා	සි/ඉ/දෙ		128	134	156	93	
	ඉංග්‍රීසි	ඉ		40	30	36	09	
	භූගෝල්විද්‍යාව	සි/ඉ/දෙ		115	133	146	33	
	ඉතිහාසය	සි/ඉ		39	34	56	13	
	ජාත්‍යන්තර සබඳතා	සි/ඉ/දෙ		263	264	239	37	
	දේශපාලන විද්‍යා හා රාජ්‍ය ප්‍රතිපත්ති	සි/ඉ/දෙ		186	97	138	38	
	සිංහල	සි		297	233	201	43	
	පාලි හා බෞද්ධ අධ්‍යයන	සි/ඉ		47	27	42	05	
	සමාජ විද්‍යා	සි/ඉ/දෙ		254	241	211	24	
	ජන මාධ්‍ය	සි/ඉ		295	394	360	-	
	අයි. සී. ටී. ඒකකය	දෙ		20	30	24	-	
	ගණිත ඒකකය	සි/ඉ		253	-	-	-	
	පරිගණක ඉගැන්වීම් ඒකකය	සි/ඉ/දෙ		-	358	-	-	
	ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් ඒකකය **	ඉ		1224	1425	1064	300	

**** ශාස්ත්‍ර, නීති හා කළමනාකරණ පීඨයන්හි ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන්හට ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් ඒකකය විසින් ඉංග්‍රීසි භාෂා වැඩසටහන් පැවැත්වේ.**

2.1.3 විදේශීය ශිෂ්‍යයන් පිළිබඳ තොරතුරු:

පීඨය/ කේන්ද්‍රය	පාඨමාලාව	මාධ්‍යය	2012 ඇතුලත් කිරීම්	පළමු වසර සිසුන්	දෙවන වසර සිසුන්	තෙවන වසර සිසුන්	සිව්වන වසර සිසුන්	උපාධිලාභී සංඛ්‍යාව
ශාස්ත්‍ර	ආර්ථික විද්‍යා	ඉ			02			
	ඉංග්‍රීසි	ඉ					03	

2.1.4 අධ්‍යයන කාර්යමණ්ඩල තොරතුරු: ශාස්ත්‍ර පීඨය (ස්ථිර හා තාවකාලික)

අධ්‍යයනාංශය /විෂයය	මාධ්‍යය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය	කථිකාචාර්ය	සහය කථිකාචාර්ය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය	කථිකාචාර්ය පරිවාස හා කථිකාචාර්ය	තාවකාලික සහය කථිකාචාර්ය	උපදේශක/පද්ධති විශ්ලේෂක හි විශ්ලේෂක	නිෂ්පාදක
ජන සංඛ්‍යා	සි/ඉ	01	02	-	02	03	01	-	04
ආර්ථික විද්‍යා	සි/ඉ/දෙ	-	07	-	11	06	05	-	-
ඉංග්‍රීසි	ඉ	-	02	-	02	03	01	-	-
භූගෝලවිද්‍යාව	සි/දෙ	-	01	-	07	03	05	01 (පද්ධති විශ්ලේෂක)	-
ඉතිහාසය	සි/ඉ	-	-	-	04	01	-	-	02
ජාත්‍යන්තර සබඳතා	සි/ඉ/දෙ	01	01	-	01	03	02	-	01
දේශපාලන විද්‍යා හා රාජ්‍ය ප්‍රතිපත්ති	සි/ඉ/දෙ	-	02	-	07	-	05	-	-
සිංහල	සි	01	02	-	05	05	02	-	03
සමාජ විද්‍යා	සි/ඉ/දෙ	01	01	02	11	05	03	-	03
ජන මාධ්‍ය	සි/ඉ	-	03	-	-	-	01	-	-
ඒ. එල්. ටී. යූ. - ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් ඒකකය	ඉ	-	-	-	-	21	09	04 (ස්ථිර)	-
පාලි හා බෞද්ධ අධ්‍යයන ඒකකය	සි/ඉ	-	01	-	02	01	-	-	-
අයි. සී. ටී. ඒකකය	දෙ	-	-	-	-	02	-	-	-
ගණිත ඒකකය	සි/ඉ/දෙ	-	-	-	-	-	01	-	-
පරිගණක ඉගැන්වීම් ඒකකය	සි/ඉ/දෙ	-	-	-	-	-	-	05 04 තාව. සහය කථි. + 01 පද්ධති ව්.	-
එකතුව		**04**	**24**	**02**	**52**	**53**	**35**	**10**	**13**

2.1.5 අනධ්‍යයන කාර්යමණ්ඩල තොරතුරු:

පීඨය/අංශය	අනධ්‍යයන කාර්ය මණ්ඩල තොරතුරු	ඉතා ජ්‍යෙෂ්ඨ	ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල	කනිෂ්ඨ කාර්ය මණ්ඩල	සුළු සේවක	එකතුව
ශාස්ත්‍ර පීඨය		06	21	08	18	**53**

2.1.6 පර්යේෂණ, නව්‍ය ජනන හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු

විෂයය	ප්‍රකාශිත	වෙළඳ පොළට ඉදිරිපත් කළ	ඉදිරිපත් කළ
පර්යේෂණ සංඛ්‍යාව	31	-	17
නව්‍ය ජනන සංඛ්‍යාව	-	-	-
වාර සඟරා සංඛ්‍යාව	14	-	-
පොත් සංඛ්‍යාව	35	01	02
ලේඛන සංඛ්‍යාව	49	-	12
වෙනත්	24	-	05
එකතුව	**153**	**01**	**36**

2.1.7 (කාර්යමණ්ඩල සාමාජිකයන් විසින්) සහභාගී වූ වැඩසටහන්, සම්මන්ත්‍රණ හා වැඩමුළු පිළිබඳ තොරතුරු

විෂයය	සහභාගිත්වය	සම්පූර්ණ කරන ලද	ඉදිරිපත් කරන ලද
පශ්චාත් උපාධි අධ්‍යයන වැඩසටහන් සංඛ්‍යාව	08	03	-
පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන් සංඛ්‍යාව	03	02	-
උපාධි පාඨමාලා සංඛ්‍යාව	01	02	-
ඩිප්ලෝමා වැඩසටහන් සංඛ්‍යාව	-	01	01
සහතිකපත් අධ්‍යයන වැඩසටහන් සංඛ්‍යාව	11	07	01
වෙනත් (සම්මන්ත්‍රණ/වැඩමුළු)	61	10	40
එකතුව	**84**	**25**	**42**

2.1.8 ලැබූ සම්මාන පිළිබඳ තොරතුරු

විෂයය	ත්‍යාග සංඛ්‍යාව	අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව	ශිෂ්‍ය සංඛ්‍යාව
දේශීය සම්මාන	08	02	06
ජාතික මට්ටමේ සම්මාන	-	-	-
ජාත්‍යන්තර මට්ටමේ සම්මාන	07	04	03
වෙනත්	-	-	-
එකතුව	**15**	**06**	**09**

2.1.9 ආරම්භ කරන ලද පාඨමාලා පිළිබඳ තොරතුරු - නව පාඨමාලා - ශාස්ත්‍ර පීඨය

අධ්‍යයනාංශය	පාඨමාලාව	මාධ්‍යය	සහතිකපත්	ඩිප්ලෝමා	පශ්චාත් උපාධි ඩිප්ලෝමා	ශාස්ත්‍රපති	දර්ශනපති	දර්ශන සූරී
සිංහල **දේශපාලන විද්‍යා හා රාජ්‍ය ප්‍රතිපත්ති**	සිංහල ඩිප්ලෝමාව දේශපාලනය හා පාලනය පිළිබඳ සහතිකපත් පාඨමාලාව	සිංහල සිංහල	 සහතික පත්‍රය	ඩිප්ලෝමා				

2.1.10 ව්‍යාපෘති පිළිබඳ තොරතුරු (දේශීය/විදේශීය ප්‍රතිපාදන ලද): ශාස්ත්‍ර පීඨය - පර්යේෂණ

අධ්‍යයනාංශය	ව්‍යාපෘතියේ නම	ප්‍රතිපාදන (රු.)	අරමුදල් ලබා දෙන ආයතනය	වී සී ඒ රු.	ආර්. එස්. ජී. රු.	ඩී. එස්. රු.
සමාජ විද්‍යා අධ්‍යයනාංශය	වැද්දන් පිළිබඳ ව්‍යාපෘතිය		සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය			
සමාජ ප්‍රතිපත්ති විශ්ලේෂණ හා පර්යේෂණ කේන්ද්‍රය	සංක්‍රමණික කම්කරුවන් අතර මානව ප්‍රවාහනයේ ස්වභාවය හා ප්‍රමාණය	1,991,680	අන්තර්ජාතික කම්කරු සංවිධානය			
	ප්‍රාදේශීය සහා සේවා පිළිබඳ පුරවැසි නියමු වාර්තාව	2,898,405.00	ආසියා පදනම			
	ස්වකීය ප්‍රජාව සමග යළි එක් කිරීම: යළි පැමිණෙන සංක්‍රමණික කම්කරුවන්ගේ ජීවිත පිළිබඳ පර්යාලෝක	1,368,594	අන්තර්ජාතික කම්කරු සංවිධානය			

2.2 අධ්‍යාපන පීඨය

2.2.1 සම්පත් හා ශිෂ්‍ය තොරතුරු

පාඨමාලාව	මුළු ශිෂ්‍ය සංඛ්‍යාව	මුළු අධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව	මුළු අතධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව
පූර්ණ කාලීන පාඨමාලා			
අධ්‍යාපනවේදී I	103		
අධ්‍යාපනවේදී II	108		
අධ්‍යාපනවේදී III	100		
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව	146		
ද්විතීයික භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	20		
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව - නාට්‍ය හා රංග කලාව	-		
අධ්‍යාපනපති - සාමාන්‍ය	33		
අධ්‍යාපනපති - සංවර්ධන මනෝවිද්‍යාව	18		
දර්ශනපති	21		
දර්ශන සූරි	01	29	14
අර්ධ කාලීන පාඨමාලා පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව	1088		
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව	100		
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව - නාට්‍ය හා රංග කලාව	97		
අධ්‍යාපනපති	65		
අධ්‍යාපනපති	45		
උපදේශනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව			

2.2.2 දේශීය සිසුන් පිළිබඳ තොරතුරු:

පාඨමාලාව	මාධ්‍යය	2012 ඇතුළත් කිරීම්	I වසර (ශාස්ත්‍ර පීඨ- 2වන වසර)	II වසර (ශාස්ත්‍ර පීඨ - 3වන වසර)	III වසර (අධ්‍යාපන පීඨ අවසන් වසර)	උපාධිලාභී සංඛ්‍යාව
ප්‍රථම උපාධි ශිෂ්‍ය අධ්‍යාපනවේදී (B.Ed)	සිංහල		59	67	56	
	දෙමළ		24	24	23	
	ඉංග්‍රීසි		20	17	21	
පූර්ණ කාලීන පශ්චාත් උපාධි පාඨමාලා පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව	සිංහල	129				ප්‍රතිඵල නිකුත් කළ යුතු ව ඇත.
	දෙමළ	18				
ද්විතීයික භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම	ඉංග්‍රීසි	20				2012.11.07 දින ආරම්භ කරන ලදී.
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව නාට්‍ය හා රංග කලාව	සිංහල	2012 වසරට ඇතුළත් කරගෙන නොමැත				
අධ්‍යාපනපති - සාමාන්‍ය	සිංහල	33				නිබන්ධය ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ප්‍රතිඵල නිකුත් කෙරෙනු ඇත
අධ්‍යාපනපති - සංවර්ධන මනෝවිද්‍යාව	සිංහල	18				
දර්ශනපති	සිංහල	18				
	දෙමළ	03				
දර්ශන සූරී		01				
පශ්චාත් උපාධි අර්ධ කාලීන පාඨමාලා පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව	සිංහල	1088				ප්‍රතිඵල නිකුත්කිරීමට නියමිත ය
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව	ඉංග්‍රීසි	100				-
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව නාට්‍ය හා රංග කලාව	සිංහල	97				2012.06.16 දින ආරම්භ කරන ලදී.
අධ්‍යාපනපති	සිංහල	65				නිබන්ධය ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ප්‍රතිඵල නිකුත් කෙරෙනු ඇත
අධ්‍යාපනපති	ඉංග්‍රීසි	45				
උපදේශනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	සිංහල	72				

2.2.3 අධ්‍යයන කාර්යමණ්ඩල තොරතුරු

විෂයය	මාධ්‍යය	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	මහාචාර්ය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය	කථිකාචාර්ය	සහය කථිකාචාර්ය	උපදේශක
ව්‍යවහාරික වාග් විද්‍යාව	සි		✓				
පර්යේෂණ විධික්‍රම	සි ඉ		✓	✓	✓		
අධ්‍යාපනයේ මූලධර්ම	සි			✓			
අධ්‍යාපන විද්‍යාවේ දාර්ශනික මූල	සි ඉ			✓	✓		
අධ්‍යාපන විද්‍යාවේ ගති ලක්ෂණ	සි			✓			

ප්‍රජා අධ්‍යාපනය	සි ඉ			✓	✓		
වැඩිහිටි හා අඛණ්ඩ අධ්‍යාපනය	සි			✓			
ඉගැන්වීම් විධික්‍රම	සි			✓			
යාවජීව අධ්‍යාපනය	සි ඉ				✓		
භාෂා කලාවේ විධික්‍රම	ඉ				✓		
බුද්ධ ධර්මය	සි ඉ				✓		
බෞද්ධ අධ්‍යාපනය	සි ඉ				✓		
අධ්‍යාපන දර්ශනය	සි ඉ				✓		
ඉංග්‍රීසි සාහිත්‍යය ඉගැන්වීම	ඉ				✓		
ඉගැන්වීම් ක්‍රමවේද	ඉ				✓		
පොදු ක්‍රමවේද	සි ඉ			✓			
විද්‍යාව ඉගැන්වීමේ ක්‍රමවේද	සි ඉ			✓			
භෞතික විද්‍යා ඉගැන්වීම් ක්‍රමවේද	සි ඉ			✓			
ජනගහන අධ්‍යාපනය	සි ඉ			✓			
විද්‍යාත්මක පදනම්	සි ඉ			✓			
විද්‍යාව හා විද්‍යා අධ්‍යාපනයේ ස්වභාවය	සි ඉ			✓			
විද්‍යාවේ උපදේශන සැකැස්ම හා ඇගයීම	සි ඉ			✓			
විපයමාලා ක්‍රියාවලිය හා විද්‍යාවේ සංවර්ධනය	සි ඉ			✓			
ගණිත ඉගැන්වීම් ක්‍රමවේද	සි ඉ			✓			
අධ්‍යාපනික තාක්ෂණය	සි ඉ			✓			
විපයමාලා සිද්ධාන්ත	සි ඉ			✓			
අධ්‍යාපනයේ මූල - විද්‍යාත්මක අත්තිවාරම්	සි ඉ			✓			
ඉගැන්වීම් ක්‍රමවේද - නොරතුරු තාක්ෂණය	සි ඉ			✓			
පරිගණක අධ්‍යාපනය	සි ඉ			✓	✓		✓
නොරතුරු තාක්ෂණය	සි ඉ				✓		✓
ජීව විද්‍යා විශේෂ ඉගැන්වීම් ක්‍රමවේද	සි ඉ				✓		
විද්‍යාව විශේෂ ඉගැන්වීම් ක්‍රමවේද	සි ඉ				✓		
පාරිසරික අධ්‍යාපනය	සි ඉ				✓		
විපයමාලා සිද්ධාන්ත හා සංවර්ධනය	සි ඉ				✓		
අධ්‍යාපනික මැනීම් හා ඇගයීම්	සි ඉ දෙ			✓	✓	✓	
අධ්‍යාපනික සංඛ්‍යානය	සි ඉ			✓			
අධ්‍යාපනික හා මනෝවිද්‍යාත්මක පරීක්ෂාව	සි ඉ			✓	✓		
මනෝවිද්‍යාත්මක පදනම්	සි ඉ			✓			
අධ්‍යාපනයේ මනෝවිද්‍යාත්මක මූලයන්	සි ඉ		✓	✓		✓	
පූර්ව ළමාවිය අධ්‍යාපනය	සි ඉ දෙ		✓			✓	
ළමාවිය හා නවයොවුන් විය සංවර්ධනය	සි ඉ		✓	✓			

ඉගෙනීමේ මනෝවිද්‍යාව	සි ඉ		✓	✓			
මනෝවිද්‍යාත්මක පරීක්ෂාව	සි		✓				
පාඨශාලා උපදේශනය	සි ඉ දෙ		✓	✓	✓	✓	
අධ්‍යාපනික මග පෙන්වීම හා උපදේශනය	සි ඉ			✓		✓	
අධ්‍යාපනයේ සමාජවිද්‍යාත්මක මූල	සි ඉ දෙ		✓	✓	✓		
ඉගැන්වීමේ පොදු ක්‍රමවේද	ඉ දෙ		✓				
ඉගැන්වීමේ විශේෂ උපක්‍රම	ඉ දෙ		✓				
ඉගැන්වීමේ විශේෂ ක්ෂේත්‍ර (සමාජවිද්‍යා අධ්‍යාපනය)	සි ඉ දෙ		✓	✓			
අධ්‍යාපනයේ පදනම	සි ඉ			✓			
තුලනාත්මක අධ්‍යාපනය	සි ඉ දෙ			✓	✓		
අධ්‍යාපනික නීතිය	සි ඉ			✓			
අධ්‍යාපනයේ මානව හිමිකම්	සි ඉ			✓			
ප්‍රජාචාර අධ්‍යාපනය	සි ඉ දෙ			✓	✓		
ප්‍රාථමික අධ්‍යාපනය	සි ඉ			✓	✓		
සමකාලීන සමාජ ප්‍රශ්න හා අධ්‍යාපනයේ ගැටලු	සි ඉ			✓	✓		
ඉගැන්වීම් ක්‍රමවේදයන්හි ඉතිහාසය	සි			✓			
අධ්‍යාපනයේ සමාජවිද්‍යාත්මක සන්දර්භය	සි ඉ			✓	✓		
අධ්‍යාපනික පරිපාලනය	සි ඉ			✓			
අධ්‍යාපනික සැලසුම්කරණය	සි ඉ			✓			
පාඨශාලා මට්ටමෙහි සැලසුම්කරණය හා කළමනාකරණය	සි ඉ			✓			
දේශපාලන විද්‍යා ක්‍රමවේද	සි			✓			
තෘතියක අධ්‍යාපනය	සි ඉ			✓	✓		
පාසල් පාදක කළමනාකරණය	සි ඉ දෙ			✓	✓		
ආර්ථික විද්‍යා ඉගැන්වීම් ක්‍රමවේද	සි ඉ			✓			
වාණිජ්‍යය ඉගැන්වීම් ක්‍රමවේද	සි ඉ			✓			
පර්යේෂණ විධික්‍රම	සි ඉ			✓			
භූගෝලවිද්‍යා ඉගැන්වීම් ක්‍රමවේද	සි ඉ				✓		

- මහාචාර්යවරු 4
- සහාය මහාචාර්යවරු 2
- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු I ශ්‍රේණිය 5
- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු II ශ්‍රේණිය 6
- කථිකාචාර්යවරු 9
- පරිවාස කථිකාචාර්යවරු 3

මුළු කථිකාචාර්යවරු සංඛ්‍යාව 29

- උපදේශක 01
- සහකාර ලේඛකාධිකාරී 01

2.2.4 අනධ්‍යයන කාර්ය මණ්ඩල තොරතුරු:

ජ්‍යෙෂ්ඨතම	ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල	කනිෂ්ඨ කාර්ය මණ්ඩල	සුළු සේවකයන්
04	04		06

2.2.5 පර්යේෂණ, නව්‍යජනන හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු:

විෂයය	මූද්‍රිත	වෙළඳ පොළට ඉදිරිපත් කළ	ඉදිරිපත් කළ
අ. පර්යේෂණ සංඛ්‍යාව	15		21
ආ. නව්‍යජනන සංඛ්‍යාව	-		
ඇ. වාරසඟරා සංඛ්‍යාව	02		
ඈ. ග්‍රන්ථ සංඛ්‍යාව	07		
ඉ. ලේඛන සංඛ්‍යාව	17		06
ඊ. වෙනත්	05		

2.2.6 (කාර්යමණ්ඩලය විසින්) සහභාගී වන ලද වැඩසටහන්, සම්මන්ත්‍රණ හා වැඩමුළු පිළිබඳ තොරතුරු:

විෂයය	සහභාගීත්වය	සම්පූර්ණ කළ	ඉදිරිපත් කරන ලද
අ. පශ්චාත් උපාධි අධ්‍යයන වැඩසටහන් සංඛ්‍යාව	08	01	
ආ. පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන් සංඛ්‍යාව			
ඇ. උපාධි පාඨමාලා සංඛ්‍යාව	02		
ඈ. ඩිප්ලෝමා වැඩසටහන් සංඛ්‍යාව			
ඉ. සහතිකපත් අධ්‍යයන වැඩසටහන් සංඛ්‍යාව			
ඊ. වෙනත් (කා.ම.ස.කේ. වැඩමුළු හා දේශීය සහ විදේශීය ප්‍රහුණු ක්‍රියාකාරකම්)	12	01	

2.2.7 ආරම්භ කරන ලද නව පාඨමාලා පිළිබඳ තොරතුරු:

පාඨමාලාව	මාධ්‍යය	සහතිකපත්	ඩිප්ලෝමා	පශ්චාත් උපාධි ඩිප්ලෝමා	ශාස්ත්‍රපති	දර්ශනපති	දර්ශනසූරී
දර්ශන ශූරී/ දර්ශන පති	සිංහල ඉංග්‍රීසි				**<u>දර්ශන සූරී/දර්ශනපති පාඨමාලාව</u>** අතුරු ව්‍යවස්ථාවන් හා විෂය නිර්දේශ කෙටුම්පත් කොට සනාතන සභා අනුමැතිය ලබා ගෙන ඇත. පාඨමාලාව හැදෑරීම් සඳහා සුදුසු අයදුම්කරුවන් තෝරා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වන ලදී.		

2.2.8 පුනරාවර්තන වියදම් පිළිබඳ තොරතුරු:

විෂයය	අයවැය 2011-රු.	අයවැය 2012-රු.
අ. පුද්ගල පඩිනඩි - අධ්‍යයන. අනධ්‍යයන	23,391,739 30,582,084	34,438,700 41,194,900
ආ. ගමන් වියදම් දේශීය හා විදේශීය	506,000	5,000
ඇ. සැපයීම්	400,000	350,000
ඈ. නඩත්තු කටයුතු	250,000	250,000
ඉ. කොන්ත්‍රාත් පදනම් සේවාවන්	885,000	885,000
ඊ. වෙනත්	1,583,514	22,999,057

වැඩසටහන් අයවැය 2012

2.2.9 ව්‍යාපෘති පිළිබඳ තොරතුරු (දේශීය/විදේශීය ප්‍රතිපාදන වලින්):

නම සහ විස්තරය	ප්‍රතිපාදන	අරමුදල් ලබා දෙන ආයතනය	ටී. ඒ. සී. රු.	ආර්. එෆ්. ඒ. රු.	සී. එෆ්. රු.
පශ්චාත් උපාධි අධ්‍යයන වැඩිදියුණු කිරීම සඳහා එච්. ඒ. ටී. සී. කිව්. අයි. පී. 3 ප්‍රදානය ලැබිය.	මිලියන 30	එච්. ඒ. ටී. සී.			

2.2.10 2012 වර්ෂයේ දී ලැබූ යටිතල පහසුකම් පිළිබඳ තොරතුරු:

යටිතල පහසුකම් තොරතුරු	වියදම් රු.	භෞතික ප්‍රගතිය
අධ්‍යාපන පීඨයේ පවත්නා නව ගොඩනැගිල්ලට අලුතා යාබද ව දිගුවක් ඉදිකිරීම		

2.3 උපාධි අධ්‍යයන පීඨය

කොළඹ විශ්වවිද්‍යාලයේ උපාධි අධ්‍යයන පීඨය ශ්‍රී ලංකාවේ පශ්චාත් උපාධි අධ්‍යයනායතන අතර ප්‍රධානතම එකකි. 1977 දී විවෘත ප්‍රතිපත්ති හඳුන්වාදීමත් සමග, උසස් අධ්‍යාපනය සඳහා වූ වෙළඳ පොල සැලකිය යුතු අන්දමින් වෙනස් විය. ඇත්ත වශයෙන් ම, අද වන විට අධ්‍යයන හෝ වෘත්තීමය අවස්ථාවන් සඳහා මූලික සුදුසුකමක් ලෙස ප්‍රථම උපාධියක් අවශ්‍ය ලෙස සැලකෙන අතර වෘත්තීමය සංවර්ධනය සඳහා පශ්චාත් උපාධි පුහුණුව අත්‍යවශ්‍ය අංගයක් බවට පත් වී තිබේ. 1987 අංක 3 දරන උපාධි අධ්‍යයන පීඨ පනතින් උපාධි අධ්‍යයන පීඨය ස්ථාපනය කරන ලදී. පීඨයේ පීඨාධිපතිගේ ප්‍රධානත්වයෙන් යුතු එහි කළමනාකාරිත්වය උපාධි අධ්‍යයන මණ්ඩලය විසින් සිදුකෙරෙන අතර එම මණ්ඩලය කොළඹ විශ්වවිද්‍යාලයේ සනාතන සභාවට හා පාලක සභාවට වගකිව යුතු වේ. පනත යටතේ ස්ථාපනය කරන ලද අධ්‍යයන මණ්ඩල වන සංවර්ධන අධ්‍යයන සඳහා අධ්‍යයන මණ්ඩලය ද වෘත්තීමය අධ්‍යයන සඳහා වන අධ්‍යයන මණ්ඩලය ද ප්‍රතිපත්ති සැලසුම්කිරීමේ පළමු තලය ලෙසින් ක්‍රියාත්මක වෙමින් තම නිර්දේශයන් පීඨ සභාව වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කරයි. පීඨ සභාව මෙම තිරණ ඇගැයීමකට ලක් කර සනාතන සභා අනුමැතිය සඳහා නිර්දේශ කරයි.

මෙම වසරේ දී උපාධි අධ්‍යයන පීඨ සභාවේ සංයුතිය මෙසේ විය;

පීඨාධිපති - උපාධි අධ්‍යයන පීඨය (සභාපති) - මහාචාර්ය සුනිල් චන්දසිරි

පීඨාධිපතිවරු

පීඨාධිපති/ශාස්ත්‍ර - මහාචාර්ය අතුල රණසිංහ
පීඨාධිපති/අධ්‍යාපන - මහාචාර්ය මාරි ඒ. එස්. පෙරේරා
පීඨාධිපති/නීති - එන්. සෙල්වක්කුමාරන් මයා - 2012 ජූනි දක්වා
වී. ටී. තම්ල්මාරන් - 2012 ජූනි සිට
පීඨාධිපති/කළමනාකරණ හා මූල්‍ය - මහාචාර්ය එච්. ඩී. කරුණාරත්න
පීඨාධිපති/වෛද්‍ය - මහාචාර්ය රොහාන් ජයසේකර
පීඨාධිපති/ විද්‍යා - මහාචාර්ය ටී. ආර්. ආරියරත්න
අධ්‍යක්ෂ/පශ්චාත් උපාධි
වෛද්‍ය විද්‍යා ආයතනය - මහාචාර්ය ජේ. ජයවර්ධන

පාලක සභා නාමිකයින් - ආචාර්ය රංජනී ගමගේ
- සී. මාලියැද්ද මයා
- තිලක් කරුණාරත්න මයා

සනාතන සභා නාමිකයින් - මහාචාර්ය බී. එල්. පණ්ඩිතරත්න
- මහාචාර්ය නිමල් කේ. දංගල්ල

ලේකම් - එච්. එම්. ඩබ්. ජී. පී. ආර්. ඒ. බණ්ඩාර මයා,
ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී


පහත සඳහන් අය පීඨ සහා රැස්වීම්වලට ආරාධිතයින් වශයෙන් සහභාගි විය.

සභාපතිනි/ BSDS - මහාචාර්ය ජී. අයි. සී. ගුණවර්ධන

වැඩබලන සභාපති /BSPS - රනිල් අයි. සේනාරත්න මයා

2.3.1 සම්පත් හා ශිෂ්‍යයන් පිළිබඳ තොරතුරු

රූපය 3: උ.අපී. - ශිෂ්‍ය ඇතුළත්කිරීම් 2012



2007 වසරේ දී ජාලගත උගැන්වීම් ක්‍රමය හඳුන්වාදීම වනාහි පාඨමාලා නෝරාගැනීම, ඒවායේ කාලපරාසයන්, ඉගැන්වීමේන් ඉගෙනීමෙන් ඇගයීමෙන් නව ක්‍රමවේද. යන මේවා සම්බන්ධයෙන් ශිෂ්‍යයන්ට වැඩි නම්‍යශීලී බවක් ලබා දීමෙහි ප්‍රබල පියවරක් විය. අනෙක් වැදගත් වර්ධනීය අවස්ථාව වූයේ බහු ක්ෂේත්‍ර අධ්‍යයනයන් කෙරෙහි කැමැත්තක් දක්වන සිසුන්ගේ ප්‍රයෝජනය සඳහා 2011 වර්ෂයේ දී අතිශයින් ම ව්‍යුහගත දර්ශනපති/දර්ශන විශාරද වැඩසටහන් හඳුන්වා දීමයි.

උපාධි අධ්‍යයන පීඨය විසින් සමාලෝචිත වසර තුළ විධායක ඩිප්ලෝමා දෙකක් (02) ද, පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන් පහලොවක් (15) ද ශාස්ත්‍රපති වැඩසටහන් දහහතක් (17) ද පවත්වන ලදී. පීඨය සායනික මනෝවිද්‍යාව පිළිබඳ තම දර්ශනපති උපාධිය අඛණ්ඩ ව ඉදිරිපත් කළ අතර, තම අතුරු ව්‍යවස්ථාවනට සුළු සුළු සංශෝධන එක් කරමින් දර්ශනපති/දර්ශන විශාරද අධ්‍යයන වැඩසටහන් ප්‍රතිව්‍යුහගත කළුන ලදී. ව්‍යාපාර කළමනාකරණය සඳහා වන පශ්චාත් උපාධි ඩිප්ලෝමාවට (PgD. BM). ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියටත් (MBS). සංවර්ධන අධ්‍යයන පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවටත් (PgD.DS) ඇතුළත් වීම සඳහා ඇති ඉහළ ඉල්ලුම කරණ කොටගෙන පීඨය විසින් මෙම වසරේ දී කණ්ඩායම් දෙකක් (සතියේ දින හා සති අන්ත) මෙම එක් එක් අධ්‍යයන වැඩසටහන් සඳහා බඳවා ගැනීමට තීරණය කළේ ය.

පීඨයේ එක් මූඛ්‍ය අරමුණක් වන්නේ තත්ත්ව වර්ධනය වන අතර මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රමවේද දෙකක් (02) පීඨය විසින් යොදාගෙන ඇත. ඒවා නම්:

- පවත්නා අධ්‍යයන වැඩසටහන් පුනරීක්ෂණය කිරීම හා යතාවත් කිරීම මගින් විෂයමාලා සංවර්ධනය
- විශ්වවිද්‍යාලයීය හා කර්මාන්ත ක්ෂේත්‍රයෙන් ලබාගත් ඉහළ සුදුසුකම්ලාභී කාර්ය මණ්ඩලය යොදාගනිමින් ශිෂ්‍යයන්ට දැනුම ලබාදීම

මෙවැනි ක්‍රමවේදයන් මගින් කර්මාන්තයත්, විශ්වවිද්‍යාලයත් අතර ඇති සම්බන්ධතාව ද ශක්තිමත් වේ. රාජ්‍ය හා පුද්ගලික ක්ෂේත්‍රයන් වෙතින් එල්ල වූ තරගකාරී පීඩනය මධ්‍යයේ වුව ද, 2012 වසරේ දී, උපාධි අධ්‍යයන පීඨය තම ශිෂ්‍ය ඇතුළත් කිරීමේ මට්ටම් එක ලෙස පවත්වා ගැනීමට සමත් විය.

පශ්චාත් උපාධි අධ්‍යයන වැඩසටහන්

දර්ශනපති/දර්ශන විශාරද උපාධි වැඩසටහන්
දර්ශනපති/දර්ශන විශාරද උපාධි (බහු ක්ෂේත්‍රමය අධ්‍යයනයන්)
සායනික මනෝ විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය

පශ්චාත් උපාධි ඩිප්ලෝමා/ශාස්ත්‍රපති උපාධි
මානව හිමිකම්
ගැටුම් නිරාකරණය
කම්කරු අධ්‍යයන
ජපන් අධ්‍යයන
තොරතුරු පද්ධති කළමනාකරණය
සංවර්ධන අධ්‍යයන
උපදේශනය හා මනෝ-සමාජයීය සහායවීම
නිප්පාදන කළමනාකරණය
ගැටුම් හා සාම අධ්‍යයන
කාන්තා අධ්‍යයනය
කම්කරු සබඳතා හා මානව සම්පත් කළමනාකරණය
රාජ්‍ය පරිපාලනය/පොදු ජන කළමනාකරණය - එම්. ඉගෙනුම් ක්‍රමවේදය (m- Learning mode)
ව්‍යාපාර කළමනාකරණය
ව්‍යාපාර කළමනාකරණය - එම්. ඉගෙනුම් ක්‍රමවේදය (m- Learning mode)
ව්‍යාපාර අධ්‍යයනය
කලාපීය සංවර්ධනය හා සැලසුම්කරණය
පරිසර කළමනාකරණය

විධායක ඩිප්ලෝමා
අලෙවිකරණය පිළිබඳ විධායක ඩිප්ලෝමාව
අලෙවිකරණය පිළිබඳ විධායක ඩිප්ලෝමාව - එම් ඉගෙනුම් ක්‍රමවේදය (m-Learning mode)

2.3.2 ශිෂ්‍ය තොරතුරු

දර්ශනපති, දර්ශන සූරී, ශාස්ත්‍රපති, පශ්චාත් උපාධි ඩිප්ලෝමා හා විධායක ඩිප්ලෝමා වැඩසටහන් නියෝජනය වෙන පරිදි ගත් කල, 2012 වසර සඳහා මුළු ශිෂ්‍ය ඇතුළත් කිරීම් සංඛ්‍යාව 1020 දෙනෙකු විය. සමාලෝචිත වසර තුළ උපාධිලාභී මුළු ප්‍රතිදානය උපාධිධාරීන් 345 දෙනෙකු විය.

2.3.3 අධ්‍යයන හා අනධ්‍යයන කාර්යමණ්ඩල තොරතුරු

පීඨයේ පීඨාධිපති ලෙසින් මහාචාර්ය සුනිල් චන්ද්‍රසිරි කටයුතු කළ අතර, එච්. එම්. ඩබ්. පී. පී. ආර්. ඒ. බණ්ඩාර මහතා පීඨයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී ලෙස වසර මුළුල්ලේ ම තව දුරටත් කටයුතු කලේය. එම්. ඒ. පී. පී. චන්ද්‍රදාස මිය ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරිනිය ලෙස කටයුතු කළාය. උපාධි අධ්‍යයන පීඨය ස්ථීර සේවකයන් නව දෙනෙකු ද කොන්ත්‍රාත් පදනම මත සේවකයන් දහ තුන් දෙනෙකු ද සේවයෙහි යොදවා ඇත.

පශ්චාත් උපාධි අධ්‍යයන වැඩසටහන්වල සම්බන්ධීකාරකවරු

අධ්‍යයන වැඩසටහන	සම්බන්ධීකාරක
බහු ශ්‍රේෂ්ඨමය අධ්‍යයනයන් සඳහා දර්ශනපති/දර්ශන විශාරද	ආචාර්ය එස්. පී. ප්‍රේමරත්න සරත් විදානගම මයා (පැරණි) ආචාර්ය ඒ. ඒ. සී. අබේසිංහ ආචාර්ය එම්. සුමනදාස
සායනික මනෝවිද්‍යාව පිළිබඳ දර්ශනපති	ආචාර්ය චන්ද්‍රිකා ඉස්මයිල්
ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති	මහාචාර්ය පී. රත්දිවෙල
තොරතුරු පද්ධති කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා/ශාස්ත්‍රපති	ආචාර්ය සී. සී. ජයසුන්දර
කාන්තා අධ්‍යයන පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා/ශාස්ත්‍රපති/ කාන්තා අධ්‍යයන පිළිබඳ ශාස්ත්‍රපති	සරත් එස්. විදානගම මයා
මානව හිමිකම් පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා/ශාස්ත්‍රපති/ මානව හිමිකම් පිළිබඳ ශාස්ත්‍රපති	වසන්තා සෙනෙවිරත්න මිය
ගැටුම් නිරාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා/ශාස්ත්‍රපති/ගැටුම් නිරාකරණය පිළිබඳ ශාස්ත්‍රපති	සරත් එස්. විදානගම මයා
ජපන් අධ්‍යයන පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා/ශාස්ත්‍රපති/ ජපන් අධ්‍යයන පිළිබඳ ශාස්ත්‍රපති	ආචාර්ය එන්. එන්. ජේ. නවරත්න
කම්කරු අධ්‍යයන පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා/ශාස්ත්‍රපති/කම්කරු අධ්‍යයන පිළිබඳ ශාස්ත්‍රපති	සරත් එස්. විදානගම මයා
සංවර්ධන අධ්‍යයන පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා/ශාස්ත්‍රපති	ආචාර්ය ඩී. ඩී. පී. එම්. දුනුසිංහ ආචාර්ය ඩී. ඒ. අයි. දයාරත්න
ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	ආචාර්ය එම්. පී. පී. ධර්මදාස ආචාර්ය ඒ. ඒ. අසිස්
උපදේශනය හා මනෝ-සමාජයීය සහාය වීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	ආචාර්ය ගම්ලා සමරසිංහ
කම්කරු සබඳතා හා මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	සරත් එස්. විදානගම මයා
රාජ්‍ය පරිපාලනය හා පොදු ජන කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	ආචාර්ය එම්. සුමනදාස
අලෙවිකරණය පිළිබඳ විධායක ඩිප්ලෝමාව	සරත් එස්. විදානගම මයා
නිප්පාදන කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව/නිප්පාදන කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති	ආර්. අයි. සේනාරත්න මයා

කලාපීය සංවර්ධනය හා සැලසුම්කරණය පිළිබඳ ශාස්ත්‍රපති	මහාචාර්ය එස්. ඒ. නෝබට්
ගැටුම් හා සාම අධ්‍යයන පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව/ගැටුම් හා සාම අධ්‍යයන පිළිබඳ ශාස්ත්‍රපති	ඒ. සර්වේස්වරන් මයා
අලෙවිකරණය පිළිබඳ විධායක ඩිප්ලෝමාව (එම්-ඉගෙනුම් ක්‍රමවේදය මගින්)	සරත් එස්. විදානගම මයා

2.3.4 ආරම්භ කරන ලද නව පාඨමාලා පිළිබඳ තොරතුරු

2012 මැයි මස ආරම්භ කරන ලද පරිසර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, උපාධි අධ්‍යයන පීඨයේ අධ්‍යයන වැඩසටහන් අතරට එක් වූ නවතම අධ්‍යයන වැඩසටහනයි.

2.3.5 ව්‍යාපෘති පිළිබඳ තොරතුරු

ඉඩකඩ, පීඨයට ඇති තදබල ගැටලුවක් වන අතර උපාධි අධ්‍යයන පීඨය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදි කරීමට දැනටමත් කටයුතු යොදා ඇත. සැලසුම්, නිර්මාණ, හා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියා පටිපාටීන් සම්බන්ධ මූලික කටයුතු දැනටමත් සම්පූර්ණ කර ඇති අතර **2013** වසරේ ජනවාරි මාසයේ දී එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.

2.4 නීති පීඨය

2.4.1 සම්පත් හා ශිෂ්‍ය තොරතුරු

පීඨය	**අධ්‍යයන පාඨමාලාව**	**මුළු ශිෂ්‍ය සංඛ්‍යාව**	**මුළු අධ්‍යයන කාර්යමණ්ඩල සංඛ්‍යාව**	**මුළු අනධ්‍යයන කාර්යමණ්ඩල සංඛ්‍යාව**
නීති පීඨය	නීතිවේදී උපාධිය	752	31	12
	නීතිපති උපාධිය	123	09	03
එකතුව		875	40	15

2.4.2 දේශීය ශිෂ්‍යයන් පිළිබඳ තොරතුරු

පීඨය	**අධ්‍යයන පාඨමාලාව**	**මාධ්‍යය**	**2012 ඇතුළත් කිරීම්**	**1වන වසර ශිෂ්‍යයන්**	**2වන වසර ශිෂ්‍යයන්**	**3වන වසර ශිෂ්‍යයන්**	**4වන වසර ශිෂ්‍යයන්**	**උපාධිලාභී සංඛ්‍යා**
නීති පීඨය	නීතිවේදී උපාධිය	සිංහල			187	214	206	209
		දෙමළ			28	10	7	
		ඉංග්‍රීසි			32	31	37	
	නීතිපති උපාධිය	ඉංග්‍රීසි	123					
එකතුව			123		247	255	280	209

2.4.3 පොදු හා ජාත්‍යන්තර නීතිය පිළිබඳ අධ්‍යයනාංශය : අධ්‍යයන කාර්යමණ්ඩල තොරතුරු 2011/2012

අංකය	නම	විෂයය	මාධ්‍යය	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	මහාචාර්ය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය	කථිකාචාර්ය	තාවකාලික කථිකාචාර්ය	උපදේශක	තාවකාලික නිලධාරික
1.	එන්. සෙල්වක්කුමාරන් මයා	බුද්ධිමය දේපල නීතිය	ඉංග්‍රීසි/දෙමළ	-	-	X	-	-	-	-
2.	වී. ටී. තම්ල්මාරන් මයා	ව්‍යවස්ථාදායක නීතිය II	ඉංග්‍රීසි/දෙමළ ඉංග්‍රීසි	-	-	X	-	-	-	-
3.	ජේ. නිරිඇල්ල මිය	අපරාධ නීතිය සාක්ෂ්‍ය හා පටිපාටිය	සිංහල ”	-	-	X	-	-	-	-
4.	ඩබ්. සෙනෙවිරත්න මිය	පොදු හා ජාත්‍යන්තර නීතිය ජාත්‍යන්තර මානවවාදී නීතිය	සිංහල ”	-	-	X	-	-	-	-
5.	ආර්. එදිරිසිංහ මයා	විදේශ නීවාචූ	-	-	-	-	X	-	-	-
6.	එම්. ඒ. එම්. හකීම් මයා	නීති පද්ධතිය පොදු හා ජාත්‍යන්තර නීතිය ජාත්‍යන්තර මානවවාදී නීතිය	දෙමළ ” ”	-	-	X	-	-	-	-
7.	කේ. කෝනසිංහ මිය	පොදු හා ජාත්‍යන්තර නීතිය පාරිසරික නීතිය මානව හිමිකම්	ඉං./ සිංහල සිංහල ”	-	-	-	X	-	-	-
8.	එන්. මැන්දිස් මිය	විදේශ නීවාචූ	-	-	-	-	X	-	-	-
9.	ඩී. සමරරත්න මිය	පරිපාලන නීතිය	ඉංග්‍රීසි	-	-	-	X	-	-	-
10.	යූ. ඒ. ටී. උදයංගනී මිය	ව්‍යවස්ථාදායක නීතිය II පරිපාලන නීතිය	සිංහල ”	-	-	-	X	-	-	-
11.	එස්. සේගර් මිය	ව්‍යවස්ථාදායක නීතිය I ව්‍යවස්ථාදායක නීතිය II පරිපාලන නීතිය	දෙමළ ” ”	-	-	-	-	X	-	-
12.	පී. අයි. එම්. ලියනගේ මිය	-	-							X
	එකතුව					**5**	**5**	**1**		**1**

2.4.4 පුද්ගලික හා තුලනාත්මක නීතිය: අධ්‍යයන කාර්යමණ්ඩල තොරතුරු 2011/2012

අංකය	නම	විෂයය	මාධ්‍යය	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	මහාචාර්ය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය	කථිකාචාර්ය	තාවකාලික කථිකාචාර්ය	උපදේශක	තාවකාලික නිලධාරික
1.	මහාචාර්ය එස්. ස්කානිවෙල්	නීති පද්ධතිය පවුල් නීතිය කම්කරු නීතිය	ඉංග්‍රීසි ඉංග්‍රීසි සහ සිංහල ඉංග්‍රීසි	-	X	-	-	-	-	-
2.	එන්. පෙරේරා මිය	රෝම නීතිය කම්කරු නීතිය	සිංහල සිංහල	-	-	X	-	-	-	-

3.	එන්. ආර්. විජේසේකර මිය	පවුල් නීතිය නීති විද්‍යාව පවුල් නීතිය	සිංහල සිංහල	-	-	X	-	-	-	-
4.	ඒ. සර්වේස්වරන් මයා	යුක්තිය හා විශ්වාසය කම්කරු නීතිය පාරිසරික නීතිය	දෙමළ දෙමළ දෙමළ	-	-	X	-	-	-	-
5.	එම්. ඩී. එම්. අබේරත්න මෙය	රෝම නීතිය ඉඩම් නීතිය යුක්තිය හා විශ්වාසය	ඉංග්‍රීසි ඉංග්‍රීසි ඉංග්‍රීසි	-	-	X	-	-	-	-
6.	එම්. සිවපාදම් මයා	රෝම නීතිය ඉඩම් නීතිය නීති විද්‍යාව	දෙමළ දෙමළ දෙමළ	-	-	X	-	-	-	-
7.	ආචාර්ය ඒ. සී. පෙරේරා	ඉඩම් නීතිය දීර්ඝ්ත නීතිය	සිංහල ඉංග්‍රීසි	-	-	X	-	-	-	-
8.	යූ. ලියනගේ මිය	දීර්ඝ්ත නීතිය	සිංහල	-	-	X	-	-	-	-
9.	ඩබ්. ඒ. ඩී. ජේ. සුමනදාස මයා	ගිවිසුම් නීතිය නෛතික විධික්‍රම	සිංහල ඉංග්‍රීසි	-	-	-	X	-	-	-
10.	කේ. පතිරණ මිය	නෛතික විධික්‍රම යුක්තිය හා විශ්වාසය	සිංහල සිංහල	-	-	-	-	X	-	-
11.	කේ. අකුරුගොඩ මිය	ආඥාපනත් අර්ථ නිරූපණය නෛතික විධික්‍රම	සිංහල සිංහල	-	-	-	-	X	-	-
12.	ඒ. එච්. එම්. ඒ. රන්ජන් මිය	නෛතික විධික්‍රම රෝම නීතිය ආඥාපනත් අර්ථ නිරූපණය	දෙමළ දෙමළ දෙමළ	-	-	-	-	X	-	-
13.	ආර්. පල්ලියාරච්චි මිය	ගිවිසුම් නීතිය ආඥාපනත් අර්ථ නිරූපණය සාක්ෂ්‍ය හා පටිපාටිය	ඉංග්‍රීසි ඉංග්‍රීසි	-	-	-	-	X	-	-
14.	එන්. සියානා මිය	ගිවිසුම් නීතිය දීර්ඝ්ත නීතිය නිබන්ධන නීති විද්‍යාව	සිංහල සිංහල සිංහල	-	-	-	-	-	-	X
	එකතුව - 14			-	**1**	**7**	**1**	**4**		**1**

2.4.5 වාණිජ නීති අධ්‍යයනාංශය : අධ්‍යයන කාර්යමණ්ඩල තොරතුරු 2011/2012

අංකය	නම	විෂයය	මාධ්‍යය	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	මහාචාර්ය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය	කථිකාචාර්ය	තාවකාලික කථිකාචාර්ය	උපදේශක	තාවකාලික නිලධාරික
1.	ඩබ්. අයි. නානායක්කාර මිය	සමාගම් නීතිය ආයෝජන නීතිය	සිංහල සහ ඉංග්‍රීසි සිංහල සහ ඉංග්‍රීසි	-	-	X	-	-	-	-
2.	එස්. සෙගරාජසිංහම් මිය	සමාගම් නීතිය ව්‍යාපාර නීතිය	දෙමළ සහ ඉංග්‍රීසි දෙමළ	-	-	X	-	-	-	-
3.	මේනක හරන්කව මයා	I. P. නීතිය	සිංහල සහ ඉංග්‍රීසි	-	-	X	-	-	-	-

4.	කේ. සී. ලියනගේ මයා	බදු නීතිය ව්‍යාපාර නීතිය	සිංහල සහ ඉංග්‍රීසි ඉංග්‍රීසි	-	-	-	X	-	-	-
5.	එස්. ඩාවුඩ් මිය	බදු නීතිය ව්‍යාපාර නීතිය	දෙමළ දෙමළ	-	-	-	X	-	-	-
6.	ආර්. පී. ඩී. පතිරණ මිය	ව්‍යාපාර නීතිය	සිංහල	-	-	-	-	X	-	-
7.	අයි. ඩී. එල්. පතිරණ මිය	සමාගම් නීතිය ව්‍යාපාර නීතිය	සිංහල සිංහල	-	-	-	-	X	-	-
	එකතුව - 7					**3**	**2**	**2**		

2.4.6 අනධ්‍යයන කාර්යමණ්ඩල තොරතුරු:

පීඨය/අංශය	**ජ්‍යෙෂ්ඨතම**	**ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල**	**කනිෂ්ඨ කාර්ය මණ්ඩල**	**සුළු සේවක**
පීඨාධිපති කාර්යාලය		01	05	01
වාණිජ නීති අධ්‍යයනාංශය		01		01
පොදු හා ජාත්‍යන්තර නීති අධ්‍යයනාංශය			01	01
පුද්ගලික හා තුලනාත්මක නීති අධ්‍යයනාංශය		01		01
එකතුව		03	06	04

2.4.7 පර්යේෂණ, නව්‍ය ජනන හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු:

විෂයය	**ඉදිරිත**	**වෙළෙඳ පොළට ඉදිරිපත් කළ**	**ඉදිරිපත් කළ**
අ. පර්යේෂණ සංඛ්‍යාව			
ආ. නව්‍යජනන සංඛ්‍යාව			
ඇ. වාරසගරා සංඛ්‍යාව			
ඈ. ග්‍රන්ථ සංඛ්‍යාව	02		01
ඉ. ලේඛන සංඛ්‍යාව	28		
ඊ. වෙනත්	45		
එකතුව	75		01

2.4.8 ලැබූ සම්මාන පිළිබඳ තොරතුරු:

විෂයය	ත්‍යාග සංඛ්‍යාව	අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජික ගණන	ශිෂ්‍යයන් ගණන
අ. දේශීය සම්මාන			
ආ. ජාතික සම්මාන			
ඇ. ජාත්‍යන්තර සම්මාන			
ඈ. වෙනත් - වෘත්තීය හා වෘත්තික කාන්තාවන් (නෛතික) 2012 - WIM වෙතින් පිදෙන ලදී	01		
එකතුව	01		

2.4.9 අළුතින් ආරම්භ කරන ලද පාඨමාලා පිළිබඳ තොරතුරු:

ක්ෂේත්‍රය	පාඨමාලාව	මාධ්‍යය	සහතිකපත්	ඩිප්ලෝමා	පශ්චාත් උපාධි ඩිප්ලෝමා	ශාස්ත්‍රපති	දර්ශනපති	ඉහළ දර්ශන
නීති	නීතිපති	ඉංග්‍රීසි			නව විෂයයන් 02ක් අරඹන ලදී (දිලික්ත නීතිය හා ඉඩම් නීතිය)			

2.4.10 ප්‍රාග්ධන වියදම් පිළිබඳ තොරතුරු:

විෂයය	2011 රු.	2012 රු.
අ. ගෘහ භාණ්ඩ හා කාර්යාලයීය උපකරණ ලබා ගැනීම		4,408,704.48
ආ. යන්ත්‍රෝපකරණ ලබා ගනිම		2,505,470.42
ඇ. ඉදිකිරීම් හා සැකිලි ලබා ගැනීම්		
ඈ. වෙනත්		
එකතුව		

2.4.11 ව්‍යාපෘති පිළිබඳ තොරතුරු (දේශීය/විදේශීය ප්‍රතිපාදනවලින්):

නම සහ විස්තරය	ණය/ප්‍රතිපාදන	අරමුදල් ලබා දෙන ආයතනය #	ටී. සී. ඒ. රු.	ආර්. එෆ්. ඒ. රු.	ඩී. එෆ්. රු.
එච් ඒ ටී සී	ප්‍රදානය				

(ශ්‍රී ලංකාණ්ඩුව/ආසියානු සංවර්ධන බැංකුව/කර්මාන්ත සංවර්ධන අධිකාරිය/ලෝක බැංකුව)

2.5 කළමනාකරණ හා මූල්‍ය පීඨය

හැඳින්වීම

කොළඹ විශ්වවිද්‍යාලය සතු පොහොසත් සම්ප්‍රදායයන්ගෙන් පීවය උකහා ගනිමින් කළමනාකරණ හා මූල්‍ය පීඨය පර්යේෂණයෙහි, ඉගැන්වීමෙහි හා ප්‍රජා සේවාවෙහි අති උත්කෘෂ්ටත්වය කරා ළඟා වන්නට කැප වී සිටිනුයේ ශ්‍රී ලංකාවේ කළමනාකරණ හා මූල්‍ය අධ්‍යාපනයෙහි උත්කෘෂ්ටත්වයේ කේන්ද්‍රස්ථානය බවට පත් වීම සඳහා සියලු යත්න දරමිනි. 1994 දී එහි ආරම්භයෙහි සිට ම පීඨය විසින් එහි අධ්‍යයනාංශ, ඉදිරිපත් කරන ලද උපාධි වැඩසටහන්, අධ්‍යයන කාර්යමණ්ඩලයේ ප්‍රමාණය, හා ශිෂ්‍ය ඇතුලත්කිරීම් ප්‍රමාණය යන කරුණුවල දී පසු ගිය වසර 18 මුළුල්ලේ ම තම ශක්‍යතාවේ වර්ධනයක් පෙන්නුම් කර ඇත. ප්‍රථම හා පශ්චාත් උපාධි යන දෙ අංශයෙන් ම පීඨයේ ක්‍රියාකාරිත්වය වර්ධනය වීම සඳහා ප්‍රබලතම ප්‍රගාමකය වී ඇත්තේ කළමනාකරණ නිපුණතා සඳහා ක්‍රමවත්ව පුළුල් වන කර්මාන්ත අවශ්‍යතාවයි. පීඨය විසින් ඉදිරිපත් කෙරෙන ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සඳහා ඇති, වැඩි වන ඉල්ලුම, වාර්ෂිකව මෙම වැඩසටහනේ ඉඩක් ලබා ගැනීම සඳහා වැඩිවන ඉසෙඩ් එකතුවෙහි අවශ්‍යතාව අනුව පෙනී යනු ඇත. මෑත වර්ෂවලදී ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය සඳහා ද ඉල්ලුම් පත් සංඛ්‍යාවන් වැඩි වූ අතර ඉන් පෙනී යන්නේ ව්‍යාපාර පිළිබඳ කොළඹ විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන සඳහා නිරන්තරව වැඩි වන ඉල්ලුමයි.

2011/2012 අධ්‍යයන වසර සඳහා නව ශිෂ්‍යයන් 426 දෙනෙකු ඇතුලත් කර ගන්නා ලදී. ව්‍යාපාර ලෝකයේ ශීඝ්‍රව වෙනස් වන මුහුණුවරට පිළිතුරු වශයෙන් දෙවසරකට පෙර පීඨය විසින් අවසන් වසර උපාධි අපේක්ෂකයන් සඳහා දැනුම හා දක්ෂතා හඳුන්වාදීමිනි සම්මිශ්‍රණයක් සමග ඉතා පැහැදිලිව ම, සවිස්තරාත්මක සීමාවාසික පුහුණුවක් සහිත නව විෂයමාලාවක් බී. බී. ඒ. අධ්‍යයන වැඩසටහන සඳහා හඳුන්වාදෙන ලදී. සියලුම පළමු වසර සිසුන් 10 දෙනෙකුගෙන් සමන්විත කොටස් තුනකට බෙදෙන අයුරින් නව ශිෂ්‍ය කළමනාකරණ ක්‍රමයක් හඳුන්වාදෙන ලදී. කණ්ඩායම් දෙකකට එක් අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයෙකු බැගින් වෙන් කරන ලද අතර, කණ්ඩායම් කටයුතු සෑම අගහරුවාදා දිනකම පස් වරු 01.00 සිට පස් වරු 04.00 දක්වා සිදු කරන ලදී. මෙම වැඩසටහනේ අරමුණ වූයේ කණ්ඩායම් කටයුතු පිළිබඳ දක්ෂතා හා සමාජයීය සහ ජනවාර්ගික ඒකාබද්ධතාවය වර්ධනය කිරීමයි. සමාලෝචිත වසර තුළ දී බී. බී. ඒ. අධ්‍යයන වැඩසටහනෙහි නව විෂය නිර්දේශයන් හදාරන සිසුන් තෙවන වසරට ඇතුලත් කර ගන්නා ලදී. ජාත්‍යන්තර ව්‍යාපාර හා කළමනාකරණ සංවිධාන අධ්‍යයන යන නව විශේෂිකරණ විෂයයන් ස්ථාපනය කරන ලදී. 2012 වසර තුළ දී නව ව්‍යාපාර පරිපාලනය පිළිබඳ නව විධායක ශාස්ත්‍රපති පාඨමාලාවක් (ඒ. එම්. බී. ඒ.) ආරම්භ කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට පීඨය සමත් විය. පීඨය විසින් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ප්‍රථම උපාධි සිසුන් (බී. බී. ඒ. සිසුන්) වෙනුවෙන් තත්ත්ව වර්ධන ව්‍යාපෘතිය යටතේ පරිගණක විද්‍යාගාරයක් ඇති කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිපත් සභාව වෙත යෝජනාවලියක් ඉදිරිපත් කර ඇති අතර, රුපියල් මිලියන 12 ක් ලැබුණි. යූ. ඩී. ජී. වැඩසටහන යටතේ පීඨය විසින් එවි. ඊ. ටී. සී. ප්‍රතිපාදනය සඳහා ද යෝජනාවලියක් ඉදිරිපත් කරන ලදුව, 2012 වසර තුළ දී රුපියල් මිලියන 20 ක ප්‍රතිපාදනයක් දිනා ගන්නා ලදී. පීඨය විසින් 2012 වසරේ දී, ක්‍රීඩා දිනය, කර්මාන්ත වෙත සංචාර අවස්ථා කිහිපයක්, ආරාධිත දේශන, වැඩමුළු හා අධ්‍යයන කාර්යමණ්ඩල හා අනධ්‍යයන කාර්යමණ්ඩල අන්තර්ක්‍රියාකාරී සැසියක් සංවිධාන කරන ලදී.

පශ්චාත් උපාධි ක්ෂේත්‍රය සලකා බලන විට, ඕනෑම එක් අවස්ථාවක් තුළ 400 කට අධික ශිෂ්‍ය පිරිසක් සඳහා කළමනාකරණ හා මූල්‍ය පීඨයේ පශ්චාත් උපාධි හා මධ්‍ය වෘත්තිය සංවර්ධන ඒකකය විසින් එම්. බී. ඒ. වැඩසටහන් හතරක් ඉදිරිපත් කෙරේ. එම්. බී. ඒ. විෂයමාලාවන් සංශෝධනය කිරීමට කමිටුවක් පත් කිරීම සඳහා පියවර ගෙන ඇත්තේ වැඩ කරන ලෝකයේ අවශ්‍යතාවන් සමග අධ්‍යයන වැඩසටහන සමගාමී කිරීම සඳහාත් තත් වැඩසටහන් වෙනස් කිරීම ඔස්සේ විදේශීය සිසුන් ද ඒවා කෙරෙහි ආකර්ෂණය කරගනු පිණිසත් වේ.

කළමනාකරණ හා මූල්‍ය පීඨය, ගෝලීය වශයෙන් ප්‍රබල මානව සම්පත් ගැටලු විසඳන්නෙකු වන සෙනිඩ් බිස් සමග මෙම වසර තුළ අවබෝධතා ගිවිසුමකට අත්සන් තබන ලද අතර, සෙනිඩ් බිස් තම සම්මානලාභී තොරතුරු පද්ධතිය වන මානව සම්පත් කළමනාකරණ ව්‍යාපාරය පීඨය වෙත ප්‍රදානය

කරන ලදී. පීඨය සීමාසහිත බ්‍රැන්ඩික්ස් ලංකා සමග ද අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබුවේ කළමනාකරණ හා මූල්‍ය පීඨයේ සිසුන්හට සීමාවාසික පුහුණුව ලබා දීමට හා කාර්යමණ්ඩල පුහුණුවට අවස්ථාවක් ලබා ගැනීමටයි. මීට අමතරව, ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති වැඩසටහන් වෙත සිසුන් වැඩි කර ගැනීම සඳහා ජපානයේ සුකුබා විශ්වවිද්‍යාලය සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් තබන ලදී.

කාර්යමණ්ඩල තොරතුරු

පීඨාධිපති ලෙස මහාචාර්ය එච්. ඩී. කරුණාරත්න අඛණ්ඩව කටයුතු කළේ ය. ජාතික පුස්තකාල හා විඥාපන ආයතනයේ සහකාර ලේඛකාධිකාරී ඒ. අබේරත්න මිය 2012.01.19 දින සිට 2012.04.01 දක්වා කටයුතු කළ අතර, එම්. එච්. නෆාර් මයා පීඨයෙහි සහකාර ලේඛකාධිකාරී තනතුරට 2012.04.02 දින සිට ස්ථිර ලෙස පත් කරන ලදී.

ආචාර්ය ඒ. ඒ. සී. අබේසිංහ, ඩබ්. ඒ. එස්. පී. වීරතුංග මයා, ආචාර්ය ඒ. ඒ. අසිස්, ආචාර්ය පවිත්‍රා කෙලාසපති, ආචාර්ය ජේ. ඒ. එස්. කේ. ජයකොඩි හා ආචාර්ය කේ. කපේන්ද්‍රා යන අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයෝ පිළිවෙළින් ගණකාධිකරණ, ව්‍යාපාරික ආර්ථික විද්‍යා, වාණිජ්‍යය හා මූල්‍යය, මානව සම්පත් කළමනාකරණය, කළමනාකරණය හා සංවිධාන අධ්‍යයනය සහ අලෙවිකරණය යන අධ්‍යයනාංශයන්හි අධ්‍යයනාංශ ප්‍රධානීන් ලෙස තවදුරටත් කටයුතු කළහ. 2012.10.01 දින සිට ආචාර්ය ජේ. ඒ. එස්. කේ. ජයකොඩි විදේශ නිවාඩු ලබා සිටි බැවින්, කළමනාකරණ හා සංවිධාන අධ්‍යයන අධ්‍යයනාංශ ප්‍රධානී වෙනුවෙන් වැඩ බැලීමට ආචාර්ය ආර්. සේනාධිරාජා පත්කරන ලදී.

මහාචාර්යවරුන් දෙදෙනෙකු (02), එක් සහාය මහාචාර්යවරයෙකු (01), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් තිස් හත් දෙනෙකු (37), කථිකාචාර්යවරුන් තිදෙනෙකු (03), තාවකාලික කථිකාචාර්යවරුන් දහඅට දෙනෙකු (18) ගෙන් සැදුම් ලත් ස්ථිර අධ්‍යයන කාර්යමණ්ඩලයෙහි සාමාජිකයන් හැට එක් දෙනෙක් (61) වූහ. මීට අමතරව, පීඨයෙහි පරිගණක උපදේශකවරු දෙදෙනෙක් (02) වෙති. 2012 වසර අවසන් වන විට, පීඨයෙහි අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයන් හත් (07) දෙනෙකු ඔවුන්ගේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා විදේශ නිවාඩු ලබා සිටි අතර, අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් හතර (04) දෙනෙකු සප්ත වාර්ෂික නිවාඩු ද එක් (01) අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයෙක් විවේක නිවාඩු ද වශයෙන් නිවාඩු ලබා සිටියහ. සමාලෝචිත වසර තුළ එක් (01) ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු ද (පරිවාස) කථිකාචාර්යවරුන් දෙදෙනෙකු (02) ද පීඨයට බඳවා ගන්නා ලදී.

රැස්වීම්

සමාලෝචිත වර්ෂය තුළ පීඨ සභාව දස (10) වරක් රැස් විය. අධ්‍යයනාංශ රැස්වීම්වලට අමතරව, සමහර නිත්‍ය කරුණු පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා විධිමත් ලෙස ඒකාබද්ධ අධ්‍යයනාංශ කාර්යමණ්ඩල රැස්වීම් පවත්වන ලදී. විපය මාලා සංවර්ධන කමිටුව, පීඨ විභාග කමිටුව, උසස් උපාධි කමිටුව, පීඨ පර්යේෂණ කමිටුව යන කමිටු සඳහා අදාළ නිත්‍ය රැස්වීම් පැවැත්විය.

ජාත්‍යන්තර කටයුතු පිළිබඳ පර්යේෂණ සම්මන්ත්‍රණය හා අනෙකුත් කටයුතු

සමාලෝචිත වර්ෂය තුළ පීඨය ජාත්‍යන්තර පෙරමුණෙහි ද ක්‍රියාකාරී විය. පීඨය විසින් 2012.12.14 වන දින සත් වන වතාවට ද සාර්ථක ලෙස කළමනාකරණය හා මූල්‍යය පිළිබඳ ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණය සංවිධාන කර තිබිණි. ආචාර්ය ඩී. ටී. ඩී. කෝදාගොඩ හා ආචාර්ය එච්. එම්. එන්. පද්මසිරි විසින් සම සභාපතිත්වය දරන ලද මෙම සම්මන්ත්‍රණය දේශීය ලේඛකයන්ට විදේශීය සමකාලීනයන් හමුවේ තම පර්යේෂණ පත්‍රිකා විචාරයට හා විවාදයට ඉදිරිපත් කිරීමට අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රයෝජනවත් අවකාශයක් ලබා දෙන ලදී.

2.5.1 සම්පත් හා ශිෂ්‍යයන් පිළිබඳ තොරතුරු:

පීඨය	පාඨමාලාව	මුළු ශිෂ්‍ය සංඛ්‍යාව	මුළු අධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව	මුළු අනධ්‍යයන කාර්යමණ්ඩල සංඛ්‍යාව
කළමනාකරණ හා මූල්‍ය	බී. බී. ඒ. බී. බී. ඒ. (මූල්‍යය පිළිබඳ) බී. බී. ඒ. (අලෙවිකරණය) බී. බී. ඒ. (මානව සම්පත් කළමනාකරණය)	1674	61	19

	බී. බී. ඒ. (ගණකාධිකරණය) බී. බී. ඒ. (ව්‍යාපාරික ආර්ථික විද්‍යාව) බී. බී. ඒ. (එම්. ඕ. එස්.)			
	එම්. බී. ඒ.	660		10 (පැවරුම් පදනම මත)
	ඒ. ඩී. බී. ඒ.	40		
එකතුව		**2374**	**61 + 02***	**29**

***උපදේශකවරුන් 02**

එම්. බී. ඒ. - ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති
ඒ. ඩී. බී. ඒ. - ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විධායක ඩිප්ලෝමාව

2.5.2 දේශීය ශිෂ්‍යයන් පිළිබඳ තොරතුරු:

පීඨය	අධ්‍යයන වැඩසටහන	මාධ්‍යය	2012 ඇතුලත්වීම්	1වන වසර සිසුන්	2වන වසර සිසුන්	3 වන වසර සිසුන්	4වන වසර සිසුන්	උපාධිලාභී සංඛ්‍යාව
කළමනාකරණ හා මූල්‍ය	බී. බී. ඒ.	ඉංග්‍රීසි		422	433	415	404	347
	එම්. බී. ඒ.	ඉංග්‍රීසි	280	495	131	-	-	-
	ඒ. ඩී. බී. ඒ.	ඉංග්‍රීසි	40	40	-	-	-	-
එකතුව			**320**	**957**	**564**	**415**	**404**	**347**

2.5.3 විදේශීය ශිෂ්‍යයන් පිළිබඳ තොරතුරු:

පීඨය	අධ්‍යයන වැඩසටහන	මාධ්‍යය	2012 ඇතුලත්වීම්	1වන වසර සිසුන්	2වන වසර සිසුන්	3 වන වසර සිසුන්	4වන වසර සිසුන්	උපාධිලාභී සංඛ්‍යාව
කළමනාකරණ හා මූල්‍ය	එම්. බී. ඒ.	ඉංග්‍රීසි	-	-	01	-	-	-
එකතුව	-	-	-	-	**01**	-	-	--

2.5.4 අධ්‍යයන කාර්යමණ්ඩල තොරතුරු:

පීඨය	විෂයය	මාධ්‍යය	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	මහාචාර්ය	සහාය මහාචාර්ය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (සුපිරිසැ)	සහාය කථිකාචාර්ය (සාමාන්‍යලිපි)	උපදේශක
කළමනාකරණ සහ මූල්‍ය	ගණකාධිකරණය	ඉංග්‍රීසි	-	-	-	06	04	01	-
	ව්‍යාපාරික ආර්ථික විද්‍යාව	ඉංග්‍රීසි	-	01	-	07	02	01	-
	මූල්‍යය	ඉංග්‍රීසි	-	01	-	04	06	-	-
	මානව සම්පත් කළමනාකරණය	ඉංග්‍රීසි	-	-	-	05	05	-	-
	කළමනාකරණය හා සංවිධාන අධ්‍යයන	ඉංග්‍රීසි	-	-	01	07	02	-	-
	අලෙවිකරණය	ඉංග්‍රීසි	-	-	-	08	02	01	
	පීඨ කාර්යාලය	ඉංග්‍රීසි	-	-	-	-	-	-	02
එකතුව				**02**	**01**	**37**	**21**	**03**	**02**

2.5.5 අනධ්‍යයන කාර්යමණ්ඩල තොරතුරු:

පීඨය/ඒකකය	ජ්‍යෙෂ්ඨතම	ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල	කනිෂ්ඨ කාර්ය මණ්ඩල	සුළු සේවකයන්
කළමනාකරණ සහ මූල්‍ය	04	01	09	05 + 01*
පශ්චාත් උපාධි මධ්‍ය-වෘත්තීය ඒකකය			09*	01*
එකතුව	**04**	**01**	**09 + 09***	**05+02***

* කොන්ත්‍රාත් පදනම මත

2.5.6 පර්යේෂණ, නව්‍ය ජනන හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු:

විෂයය	ප්‍රකාශයට පත් වූ	වෙළඳ පොලට ඉදිරිපත් කරන ලද	ඉදිරිපත් කරන ලද
α. පර්යේෂණ සංඛ්‍යාව	06	-	14
β. නව්‍යජනන සංඛ්‍යාව	-	-	-
χ. වාර සඟරා සංඛ්‍යාව	08		
δ. ග්‍රන්ථ සංඛ්‍යාව	03	01	06
ε. ලේඛන සංඛ්‍යාව	09	-	13
ϕ. වෙනත්	02	-	-
එකතුව	**28**	**01**	**33**

2.5.7 සහභාගී වූ වැඩසටහන්, සම්මන්ත්‍රණ හා වැඩමුළු පිළිබඳ තොරතුරු:

විෂයය	සහභාගීත්වය	සම්පූර්ණ කරන ලද	ඉදිරිපත් කරන ලද
අ. පශ්චාත් උපාධි පාඨමාලා සංඛ්‍යාව	04	02	
ආ. පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව	02		01
ඇ. උපාධි පාඨමාලා සංඛ්‍යාව			
ඈ. ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව			
ඉ. සහතිකපත් පාඨමාලා සංඛ්‍යාව	05	03	
ඊ. වෙනත්			
එකතුව	**11**	**05**	01

2.5.8 ආරම්භ කරන ලද නව පාඨමාලා පිළිබඳ තොරතුරු:

පීඨය	පාඨමාලාව	මාධ්‍යය	සහතික පත්‍ර	ඩිප්ලෝමා	පශ්චාත් උපාධි	ශාස්ත්‍රපති	දර්ශන සූචි	දර්ශන විශාරද
කළමනාකරණ සහ මූල්‍ය	ඒ. එම්. බී. ඒ. *	ඉංග්‍රීසි				ශාස්ත්‍රපති		

***ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විධායක ශාස්ත්‍රපති**

2.6 වෛද්‍ය පීඨය

වෛද්‍ය පීඨය ආසියාවේ දෙවන පැරණිම වෛද්‍ය පාසල හා මේ රටේ විශ්වවිද්‍යාලයිය අධ්‍යාපනයේ පුරෝගාමී අධ්‍යයනායතනයයි. සිය වසකට ආසන්න කාලයක් පුරා දිවයිනෙහි එකම වෛද්‍ය පාසල ද වූ මෙය සෞඛ්‍ය සේවා, වෛද්‍ය අධ්‍යාපනය හා වෛද්‍ය පර්යේෂණ යනාදිය මගින් ජාතියේ සෞඛ්‍යය වෙනුවෙන් සිදුකරන දායකත්වය අප්‍රමාණය. වර්තමානයේ එහි අධ්‍යයනාංශ 14 ක් වේ. මෙම අධ්‍යයනාංශයනට අමතරව ඒකක 6 කින් ද යුතු අතර ඒවා නම්, මැලේරියා පර්යේෂණ ඒකකය, මානව ජාන ඒකකය, අනුබද්ධ සෞඛ්‍ය විද්‍යා ඒකකය, වෛද්‍ය අධ්‍යාපන සංවර්ධන හා පර්යේෂණ කේන්ද්‍රය (මෙඩාර්ක්), විපය නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ඒකකය හා ශ්‍රව්‍ය-දෘශ්‍ය ඒකකය වේ.

වෛද්‍ය උපාධිධාරීන් පුහුණු කිරීමට අමතරව, විද්‍යුත් ඛන්තු රේඛක පාසලේ ද, භෞතචිකිත්සක හා වෘත්තියික චිකිත්සා පාසලේ ද, ඒ. සී. ජී. වාර්තාකරුවන්ගේ පුහුණු වැඩසටහනෙහිද, අඤ්ඤ වෛද්‍ය සහායකයන්ගේ පුහුණු වැඩසටහනෙහි ද, හෙද පුහුණු පාසලෙහිද, එසේ ම පශ්චාත් මූලික හෙද පුහුණු පාසලෙහි ද පුහුණු වැඩසටහන් වෙත තම දායකත්වය ලබා දීම මගින් වෛද්‍ය විද්‍යා සහායක කාර්යමණ්ඩල සාමාජිකයන් පුහුණු කිරීම ද වෛද්‍ය පීඨය සතු වැදගත් භූමිකාවක් වෙයි.

වෛද්‍ය පීඨය මහාචාර්ය රොහාන් ජයසේකරගේ පීඨාධිපතිත්වය යටතේ ක්‍රියා කළ අතර, පී. එස්. එම්. බණ්ඩාර මහතා, එච්. ජී. ඩී. ශ්‍රියානි මිය, හා කෝලිත බණ්ඩාර මයා පිළිවෙළින් නියෝජ්‍ය ලේඛකාධිකාරී, සහකාර ලේඛකාධිකාරී හා ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී තනතුරුවල තවදුරටත් කටයුතු කරන ලදී.

අදාළ වර්ෂය තුළ දී පීඨයට නවක සිසුන් ඇතුළත් කර නොගන්නා ලද අතර, ඒ අනුව **2013** වසරේ මාර්තු මස දී ඔවුන් ඇතුළත් කර ගැනීම සඳහා සම්පූර්ණ අධ්‍යයන කටයුතු පිළිබඳ සම්පූර්ණ දින දර්ශනය ම යලි පිළියෙල කරන ලදී. අනුබද්ධිත සෞඛ්‍ය විද්‍යා ඒකකයට ඇතුළත් කර ගන්නා ලද ප්‍රථම ශිෂ්‍ය කණ්ඩායම වන **2005** උසස් පෙළ භෞතචිකිත්සක සිසුන් විසි හත් **(27)** දෙනා තම අවසන් වසර විභාග සම්පූර්ණ කරන ලදී.

එක්සත් රාජධානිය, ඇමරිකා එක්සත් ජනපදය, ඔස්ට්‍රේලියාව, නවසීලන්තය, ඉන්දියාව, චීනය, නෝර්වේ වැනි රටවල් ඇතුළු රටවල් පහළොවකින් **(15)** පැමිණි සිසුන් හැත්තෑ නව **(79)** දෙනෙකු සායනික වෛද්‍ය විද්‍යා, ළමාරෝග, ශල්‍ය වෛද්‍ය විද්‍යා, නාරී හා ප්‍රසව වේද, ප්‍රජා වෛද්‍ය විද්‍යා, පරපෝෂවේද හා වෝහාරික වෛද්‍යවේද යන අධ්‍යයනාංශ යටතේ විදේශීය වෛකල්පික විපය ඒකක සඳහා සහභාගී විය.

වෛද්‍ය පීඨයෙහි ව්‍යාප්ති පාඨමාලාවන්හි අධ්‍යයන කොටස් ආකාරයෙන් පශ්චාත් උපාධි පාඨමාලා ක්‍රියාත්මක කරනු ලබයි. පීඨය විසින් පිරිනැමෙන අනෙකුත් පශ්චාත් උපාධි පර්යේෂණ කටයුතු මත පමණක් පදනම් වූ ඒවාට සීමා වේ. වසර තුළ දී, සිසුන් දෙදෙනෙකු තම දර්ශන සූරී උපාධි සම්පූර්ණ කළ අතර එක් සිසුවෙකු දර්ශනපති උපාධිය සම්පූර්ණ කරන ලදී.

එක් දනස් එක සියයකට **(1100)** අධික ශිෂ්‍ය ප්‍රජාවක් හා භාරසිය පනහක් **(450)** පමණ වන අධ්‍යයන හා අනධ්‍යයන කාර්යමණ්ඩලයකින් සමන්විත වෛද්‍ය පීඨයේ උගුතම ගැටළුවක් ව පවත්නේ ඉඩකඩ මද කමයි. පීඨ පරිශ්‍රයෙන් දුරස්ව ස්ථානගත ව ඇති නිසා පැන නගින විවිධ බාධා මධ්‍යයේ භෞතවේද-විද්‍යාවේදී පාඨමාලා කුලියට ගත් නිවෙසක පවත්වාගෙන යනු ලැබේ. සිසුනට අප්‍රමාණවත් තත්ත්වයේ පවත්නා හෝජනාගාර හා පාඩම් කිරීමේ ඉඩ පහසුකම් පිළිබඳ ගැටලු නුදුරු අනාගතයේ දී ම විසඳිය යුතුව ඇත.

සමාලෝචනයට ලක් කර ඇති වර්ෂය තුළ සාධනය කරගත් ප්‍රධාන දෑ හා සිදුවීම් පහත දැක්වෙන පරිදි වේ.

1. **2012** ඔක්තෝබර් මස **14** සිට **17** දක්වා "**2015** වසරට ඔබ්බෙන් සහස්‍රකයේ සංවර්ධන අරමුණු : ප්‍රජා සෞඛ්‍යයට අභියෝගයක්" යන තේමාව යටතේ ප්‍රජා සෞඛ්‍යය සඳහා වන 44 වන ආසියා පැසිෆික් අධ්‍යයන එකමුතුවෙහි ජාත්‍යන්තර සම්මන්ත්‍රණය **2012**, සාර්ථක ලෙස පවත්වන ලදී. ඒ. පී. ඒ. සී. පී. එච්. යනු මහජන සෞඛ්‍යය සම්බන්ධ ආසියා පැසිෆික් කලාපයේ විශාලතම හා ප්‍රමුඛතම පාසල්වලින් සමන්විත ජාත්‍යන්තර සංගමයක් වන අතර, එය මහජන සෞඛ්‍යය වර්ධනය කිරීම සඳහා කැපව සිටියි. ශ්‍රී ලාංකේය විශ්වවිද්‍යාලයක් විසින් සංවිධාන කරන ලද විශාලතම සම්මන්ත්‍රණය වන මෙම

අති දැවැන්ත කර්තව්‍යයට විවෘත දේශන පහක්, ආරාධිත දේශන පහක්, පරිසංවාද විසි දෙකක්, වාචික ඉදිරිපත් කිරීම් හතලිස් හතරක්, පෝස්ටර පන්සිය විසි තුනක් ඇතුළත් වූ අතර, ඒ සඳහා ලියාපදිංචි වූ අටසියයක් දෙන අතරට විදේශීය ලියාපදිංචිකරුවන් හාරසිය හතලිස් දෙනෙක් අයත් වූහ.

2. කොළඹ විශ්වවිද්‍යාලයීය වෛද්‍ය පීඨයේ වාර්ෂික පර්යේෂණ පරිසංවාදය **2012** අගෝස්තු මස **17** වන දින නව ශ්‍රවණාගාර ගොඩනැගිල්ලෙහි දී සාර්ථක ලෙස පවත්වන ලදී. කොළඹ විශ්වවිද්‍යාලයීය පර්යේෂණ පරිසංවාදයට සමගාමී ව මෙම අවස්ථාව සංවිධාන කරන ලදී. මෙම අවස්ථාවේ ප්‍රධාන අමුත්තා ලෙස මහාචාර්ය නාරද වර්ණසූරිය සපැමිණියේය. "ශ්‍රී ලංකාවේ ළදරු මන්දපෝෂණයට එරෙහිව සටන් කිරීම: පිළිගත් පෝෂණ මැදිහත්වීම් තුලනය කිරීමේ ක්‍රමවේද." යන මැයෙන් **2008-2010** පර්යේෂණ විශිෂ්ටත්වය සඳහා වන කොළඹ විශ්වවිද්‍යාලයීය සම්මානලාභී ප්‍රජා වෛද්‍ය විද්‍යා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය එල්. පී. ජේ. උපුල් සෙනරත් විසින් පීඨයේ අභිදේශනය සිදුකරන ලදී. පරිසංවාදයේ දී විද්‍යාත්මක පත්‍රිකා තිස් හතරක් (වාචික ඉදිරිපත් කිරීම් 18ක් නා පෝස්ටර් ඉදිරිපත් කිරීම් **16** ක්) ඉදිරිපත් කරන ලදී.

3. භෞතවේද අධ්‍යයනාංශය විසින් සංවිධාන කරනු ලැබූ ආසියානු කලාපයෙහි විද්‍යාගාර සත්ත්ව විද්‍යාව පිළිබඳ ප්‍රථම ජාත්‍යන්තර සහතිකපත් පාඨමාලාව **2011** නොවැම්බර් මස **28** දා සිට දෙසැම්බර් **9** වන දා තෙක් පීඨයෙහි දී පවත්වන ලදී. නෙදර්ලන්තයේ උට්‍රෙක්ට් විශ්වවිද්‍යාලය සමග සහයෝගිතාවයෙන් මෙය සංවිධාන කරන ලදී.

4. ජාන රෝග නිශ්චය කිරීමේ විද්‍යාගාර පිළිබඳ වැඩමුළුවක් **2012** පෙබරවාරි **6** සහ **7** යන දිනවල දී පවත්වන ලදී. ජාන පරීක්ෂා කිරීමේ යුරෝපා ඇගයීම් ආයතනය - යුරෝජෙන්ටෙස්ටිහි අනුග්‍රාහකත්වය යටතේ යුරෝපීය අණුක තත්ත්ව ජාලය (ඊ. එම්. කිව්. එන්.). සයිටෝජෙනටික් යුරෝපීය තත්ත්ව ඇගයීම (සී. ඊ. කිව්. ඒ.) සහ ජෛව රසායනික ජාන බාහිර තත්ත්ව ඇගයීම (ඊ. කිව්. ඒ.) යන ආයතනයන් වෙතින් පැමිණි සම්පත් දායකයන් විසින් මෙම වැඩමුළුව පවත්වන ලදී. මානව ජාන ඒකකය හා ශ්‍රී ලංකා ජාතික විද්‍යා පදනම මගින් මෙම වැඩමුළුව සංවිධාන කරන ලදී. ශ්‍රී ලංකා අනුබද්ධතා පිළිගැනීමේ මණ්ඩලය විසින් එය පිටසන් කරන ලද අතර ශ්‍රී ලංකාවේ ජාන රෝග විනිශ්ච විද්‍යාගාරවල සාමාජිකයන් **30** දෙනෙක් සහභාගී වූහ.

5. **2012 - 2016** වෙනුවෙන් පීඨයෙහි සාරධර්ම ඇගයීම් කමිටුව විසින් SIDCER/FERCAP පිළිගැනීම අලුත් කර ගන්නා ලදී. සභාපතිනිය හා ඊ. ආර්. සී. හි සාමාජිකයන් වෙත. FERCAP හි සභාපතිනිය වන ආචාර්ය කෙන්පි හිරයාමා සහ කලාපයේ නත් වැදෑරුම් කමිටුවලින් පැමිණි ඊ. ආර්. සී. සාමාජිකයන් ඉදිරියේ දී. **2012** නොවැම්බර් මස **21** වන දින කොළඹ දී පැවැති **ආසියා හා බටහිර පැසිෆික් කලාපයේ සාරධර්මමය ඇගයීම් කමිටු** (FERCAP) සඳහා වූ **12** වන මහා සැසියේ දී අදාළ ත්‍යාගය පිළිගන්වන ලදී.

6. අනුබද්ධිත සෞඛ්‍ය විද්‍යා ඒකකයේ දී භෞතචිකිත්සා ඒකකය ස්ථාපනය කිරීම සිදුකරන ලද්දේ පහත සඳහන් කරුණු සැලකිල්ලට ගනිමිනි;

- **a.** ඒ. එච්. එස්. යූ. හි සිසුන් හට බාහිර රෝගී පදනමක්/සායනික කේවල කේන්ද්‍රීය වූ අධ්‍යාපනයක් ලබා දීම
- **b.** ඔවුන්ගේ භෞත චිකිත්සකවේදිය නිපුණතා, වර්යාත්මක විද්‍යා, කළමනාකරණ නිපුණතා වර්ධනය කිරීම
- **c.** ඒ. එච්. එස්. යූ. හි වර්තමානයෙහි සේවාවේ යෙදී සිටින සුවිදර්ශකවරුන්ගේ/පරිවාස කථිකාචාර්යවරුන්ගේ සායනික හා වෘත්තීයමය නිපුණතා වැඩි දියුණු කිරීම
- **d.** රෝගීන්, ආබාධිත දරුවන් හා වැඩිහිටියන් වෙත වඩා යහපත් හා සාධනීය වූ සේවාවක් ලබාදීම
- **e.** සායන පදනම් වූ පර්යේෂණ පැවැත්වීම

7. **2012** ජූනි මස **18** වන දින ASCEND පර්යේෂණ ජාලය - **2012** පවත්වන ලද අතර එම වැඩසටහනට **2011** වසරේ දී පුහුණුව අරඹන ලද ඔස්ට්‍රේලියාව, මැලේසියාව හා

ඉන්දියාව යන රටවලින් පැමිණි වෘත්තිකයන් 25 දෙනෙකු අතරට. 2012 අගෝස්තු 18 වන දා තවත් නවක පුහුණුවන්නන් 26 දෙනෙකු එක් විය.

8. සම්මාන මහාචාර්ය දුලිතා ප්‍රනාන්දු ප්‍රධාන ආරාධිත වශයෙන් සහභාගි වූ ප්‍රජා වෛද්‍ය විද්‍යා ශිෂ්‍ය විද්‍යාත්මක සැසි 2005 හා 2006 උසස් පෙළ සිසුන්ගේ සහභාගිත්වයෙන් 2012 අගෝස්තු මස 13 වන දින සාර්ථක ලෙස පවත්වා අවසන් විය.

9. **වෘත්තීයමය සෞඛ්‍යයෙහි පුහුණුකිරීම හා පර්යේෂණය පිළිබඳව ලෝක සෞඛ්‍ය සංවිධානයිය ඒකාග්‍රතා කේන්ද්‍රයක්** ලෙස ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය නම් කරන ලදී.

10. පීඨයේ පරපෝපවේද අධ්‍යයනාංශයේ පුරෝගාමී මහාචාර්යවරයා වූ ද. ප්‍රථම මහාචාර්ය/සභාපති/අධ්‍යයනාංශ ප්‍රධානි ව සිට අභාවප්‍රාප්ත වූ දිවංගත මහාචාර්ය වී. සිවලිංගම් මහතාගේ පවුලේ සාමාජිකයන් විසින් පරපෝපවේද විෂයය සඳහා විශිෂ්ටතම ශිෂ්‍යයා හට පිදෙන රන් පදක්කම හා මුදල් ත්‍යාගය වෙනුවෙන් රුපියල් මිලියන එකක පරිත්‍යාගයක් සිදුකරන ලදී.

11. කොළඹ විශ්වවිද්‍යාලයිය කාර්යමණ්ඩල සුභසාධක සංගමය විසින් සංවිධාන කර 2012 පෙබරවාරි 22 වන දා පවත්වන ලද "සෞඛ්‍ය කඳවුර" ට පීඨ සාමාජිකයෝ සහභාගිත්වය හා සහයෝගය දැක් වූහ.

12. බෙන්තොට. බෙන්තොට බීච් හෝටලයේ දී 2012 සැප්තැම්බර් 09 වන දා කොළඹ වෛද්‍ය විද්‍යාලයේ ප්‍රථම ආදී විද්‍යාර්ථී සංගම් විද්‍යාත්මක කොන්ග්‍රසය හා යළිහමුව පවත්වන ලදී.

13. වෛද්‍ය ශිෂ්‍ය බෞද්ධ සංගමය විසින් වාර්ෂික ව පවත්වන වැඩසටහන් අතර එක් වැඩසටහනක් වන **"වස්සාන දියවර 2012"** කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිකවැරටිය. කැලෑගම දී 2012 ජනවාරි 8 වන දා සාර්ථක ලෙස නිමා විය. මෙම ව්‍යාපෘතියට පහත සඳහන් කර්තව්‍යයන් ද ඇතුළු ව. ගමේ පාසලට හා පන්සලට පහසුකම් කිහිපයක් ද. තැලසීමියා රෝග නිශ්චයකිරීම් ඇතුළු කටයුතු සඳහා සෞඛ්‍ය කඳවුරක් ද ඇතුළත් විය.

ක්‍රියාකාරකම	**ගණන/ද්‍රව්‍යය**	**අනුග්‍රාහකත්වය**
පන්සලට. පාසලට හා මධ්‍යම බෙහෙත් ශාලාව සඳහා පානිය ජලය සැපයීම	රු. 900,000.00	වෛද්‍ය හැරිස් පතිරගේ හා ශ්‍රී ලංකා නාවික හමුදාව
ආරක්ෂිත ලාම්පු සැපයීම		වෛද්‍ය විජය ගොඩකුඹුර
පරිගණක විද්‍යාගාරය සඳහා පරිත්‍යාග	උපාංග සහිත පරිගණක 08ක්	පිප්ල්ස් ලීසිං සමාගම හා පීඨයේ සිසුන් 03 දෙනෙක්
පුස්තකාලය නවීකරණය කිරීම හා අවශ්‍ය උපකරණ පරිත්‍යාගය	රු. 30,000	වෛද්‍ය අනිඳු පතිරණ රන් එෆ්. එම්. හා පීඨයේ සිසුන්
නර්තන හා සංගීත කාමර අලුත්වැඩියාව සංගීත හා නර්තන උපකරණ පරිත්‍යාගය		
බටහිර තූර්ය වාදන කණ්ඩායම නිර්මාණය කිරීම (පුහුණු වීම් සති දෙකක් තුළ සිදුකරන ලදී)	භාණ්ඩ හා නිල ඇඳුම්	
පාවහන් පරිත්‍යාගය	තෝරාගත් සිසුන් 24 දෙනෙකුට පාවහන්	ඩී. එස්. අයි.
කමිස හා සාරි	පාසලේ හා දහම් පාසලේ සියලු ගුරුවරුන්	වෛද්‍ය අශ්විනි ද ආබෲ
විද්‍යාගාරය නවීකරණය	රු. 12,000	
ලිපි ද්‍රව්‍ය හා පාසල් බෑග් පරිත්‍යාගය		වෛද්‍ය යුදාර කුලරත්න

ක්‍රීඩා උපකරණ පරිත්‍යාගය	අත් පන්දු, දැල් පන්දු, පා පන්දු හා මළල ක්‍රීඩා	ධර්මසේන කහඳව මයා
එස්. 5 සංකල්පය හඳුන්වාදීම		
පරිගණක විද්‍යාගාරය, නර්තන ශාලාව, සංගීත කාමරය, පුස්තකාලය හා පන්ති කාමර පින්තාරු කිරීම.		
වැසිකිලි පද්ධතියක් ඉදිකිරීම	නවීන පහසුකම් සහිත වැසිකිලි 02ක්	ධර්මසේන කහඳව මයා
දහම් පාසලට ඩෙස්ක් 15 ක් හා බංකු 15 ක් පරිත්‍යාග කිරීම		විශ්ව පාරමී පදනම
දහම් පාසලේ සියලු සිසුනට සුදු නිලඇඳුම් රෙදි පරිත්‍යාගය		වෛද්‍ය එස්. කේ. කොල්ලුරේ
පන්සලේ මල් ආසනය ඉදිකිරීම		යූ. සී. එෆ්. එම්. සිසුවෙක්
බංකු 15 ක් පරිත්‍යාග කිරීම		විශ්ව පාරමී පදනම
අවශ්‍ය ඖෂධ වර්ග ලබා දීම		
තැලසිමියා හඳුනාගැනීමේ වැඩසටහන	පරීක්ෂාවට ලක් වූ ග්‍රාමවාසීන් සංඛ්‍යාව - 900, තැලසිමියා ප්‍රවණතාවක් ඇති බවට ලක්ෂණ පෙන්නුම් කළ පුද්ගලයන් සංඛ්‍යාව - 52	ජාතික තැලසිමියා කේන්ද්‍රය - කුරුණෑගල

14. "නානාගේ එක්සත් රාජධානි වෛද්‍යවරුන් වැඩි දෙනෙකු" ගේ 2010 වසර කණ්ඩායම විසින් ආයෝජනය කිරීම සඳහාත් අනතුරුව, එහි පොලිය එක් අයෙකුට රු. 2,000 බැගින් වන සේ මූල්‍ය සහය අවශ්‍ය වෛද්‍ය සිසුන් දෙදෙනෙකුට මූල්‍ය සහාය ලබා දීමට භාවිතා කිරීම සඳහාත් රුපියල් 581,020ක මුදලක් වෛද්‍ය සිසුන්ගේ මූල්‍ය සහාය යෝජනාක්‍රමය වෙත පරිත්‍යාග කර තිබුණි.

15. කාය ව්‍යවිඡේද අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වෛද්‍ය ඩී. ජේ. ඇන්තනි මහතා විසින් ඉදිරිපත් කර ඇති සංගීත සංයුක්ත තැටියක් "කුරුළු තුඩින්" නමින් ආනන්ද විද්‍යාලයීය කුලරත්න ශාලාවේ දී එළි දක්වන ලදී.

වෛද්‍ය පීඨ ශිෂ්‍ය සංගමය (එම්. එෆ්. එස්. යූ.) හා බෞද්ධ සංගමය එක්ව සංවිධාන කළ පිරිත් පිංකම හා භක්ති ගී වැඩසටහන පිළිවෙලින් 2012 අප්‍රේල් මස 28 හා මැයි 2 යන දිනවල දී පීඨ පරිශ්‍රය තුළ පැවැත්විණි.

17. භෞතවිකිත්සකවේදී විද්‍යාවේදී සිසුන් භක්ති ගී වැඩසටහනකට සහභාගී වූ අතර විශ්වවිද්‍යාලය විසින් 2012 මැයි 5 වන දා සංවිධාන කර තිබූ 2012 වෙසක් කලාපයේ දී විදි නාට්‍යයක් ද රඟ දක්වන ලදී.

18. කලා සංගමය විසින් සංවිධාන කරන ලද "දීප මඤ්ජරී කලා උළෙල" 2012 ජූනි 11 වන දා සිට 15 වන දා දක්වා පීඨ පරිශ්‍රයේ දී පවත්වන ලදී. කේජ් නාට්‍ය, පැදුරු සාද, "අවුරෝරා නාට්‍ය තරගය", සිසුන් හා කාර්යමණ්ඩල සාමාජිකයන් සහභාගී වූ කලාව පිළිබඳ දේශන හා සාකච්ඡා යනාදිය ඊට ඇතුළත් විය.

19. සන්නිවේදන අවශ්‍යතා සඳහා පිළියෙල කරන ලද, පහත සඳහන් පහසුකම්වලින් යුතු "ලේඛන කළමනාකරණ පද්ධතිය" (DMS) මෘදුකාංග පැකේජය හඳුන්වා දීම.

1. සිදුවීම් දින දර්ශනය
2. ශාලා/නිබන්ධන කාමර වෙන් කරගැනීම
3. පීඨ සභා සටහන් ඇතුළු ලේඛන බෙදා හැරීම
4. අනධ්‍යයන කාර්යමණ්ඩල පැමිණීම් සටහන්

20. සියලුම අධ්‍යයනාංශ/ඒකක ඇතුලත් වන පරිදි පීඨයේ වෙබ් අඩවිය නිර්මාණය කිරීම හා පීඨ වෙබ් ජාලයෙහි දෙවන අදියර සම්පූර්ණ කිරීම.

21. පෙබරවාරි 4 වන දා සිට 12 වන දා දක්වා අනුරාධපුරයේ ඔයාමඩුවේ පවත්වන ලද දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනය සඳහා පීඨයේ පීඨාධිපතිතුමාගේ මග පෙන්වීම හා නියෝජ්‍ය ලේඛකාධිකාරි විසින් ලබා දුන් නායකත්වය යටතේ කාය ව්‍යවච්ඡේද, සායනික වෛද්‍ය විද්‍යා හා භෞතවේද යන අධ්‍යයනාංශ, පීඨාධිපති කාර්යාලය හා අනුබද්ධ සෞඛ්‍ය විද්‍යා ඒකක විසින් ප්‍රදර්ශන කුටියක් සංවිධාන කරන ලදී. මෙය සුවිශාල ලෙස ජනතා ආකර්ශනය දිනාගත් අතර අදාළ කාල සීමාව තුළ පාසල් ළමුන් ද ඇතුළු ව **300,000** කට අධික පිරිසක් ප්‍රදර්ශනය නැරඹීමට පැමිණියහ.

2.6.1 සම්පත් හා ශිෂ්‍ය තොරතුරු

පීඨය	අධ්‍යයන වැඩසටහන	ඒකතුව	මූළු අධ්‍යයන කාර්යමණ්ඩල සංඛ්‍යාව	මූළු අනධ්‍යයන කාර්යමණ්ඩල සංඛ්‍යාව
වෛද්‍ය	වෛද්‍ය විද්‍යාවේදී	1007	136	217
	භෞතවිකිත්සක-විද්‍යාවේදී	134	05	04

2.6.2 දේශීය ශිෂ්‍යයින් පිළිබඳ තොරතුරු

පීඨය	අධ්‍යයන වැඩසටහන	මාධ්‍යය	1 වන වසර (2011 ශිෂ්‍යයන් ඌස්ස් පෙළ)	2 වන වසර (2010 ශිෂ්‍යයන් ඌස්ස් පෙළ)	3 වන වසර (2009 ශිෂ්‍යයන් ඌස්ස් පෙළ)	4 වන වසර (2008 ශිෂ්‍යයන් ඌස්ස් පෙළ)	5 වන වසර (උපෙ ශිෂ්‍යයන් 2007) (ක)	5 වන වසර (උපෙ ශිෂ්‍යයන් 2006) (ජෙ)	උපාධිලාභී සංඛ්‍යාවන්
වෛද්‍ය	වෛද්‍ය විද්‍යාවේදී	ඉ	නැත	189	192	190	194	191	202
	භෞතවිකිත්සකවේදී	ඉ		25	26	36	28	19	27

ක = කනිෂ්ඨ ජෙ = ජ්‍යෙෂ්ඨ

2.6.3 විදේශීය ශිෂ්‍ය තොරතුරු

පීඨය	අධ්‍යයන වැඩසටහන	මාධ්‍යය	1 වන වසර (2011 ශිෂ්‍යයන් ඌස්ස් පෙළ)	2 වන වසර (2010 ශිෂ්‍යයන් ඌස්ස් පෙළ)	3 වන වසර (2009 ශිෂ්‍යයන් ඌස්ස් පෙළ)	4 වන වසර (2008 ශිෂ්‍යයන් ඌස්ස් පෙළ)	5 වන වසර (උපෙ ශිෂ්‍යයන් 2007) (ක)	5 වන වසර (උපෙ ශිෂ්‍යයන් 2006) (ජෙ)	උපාධිලාභී සංඛ්‍යාවන්
වෛද්‍ය	වෛද්‍ය විද්‍යාවේදී	ඉ	නැත	11	12	06	08	02	03

2.6.4 අධ්‍යයන හා අනධ්‍යයන කාර්යමණ්ඩල තොරතුරු

- **අධ්‍යයන කාර්යමණ්ඩලය**

පීඨය	විෂයය	මාධ්‍යය	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	මහාචාර්ය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය	කථිකාචාර්ය	ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී
වෛද්‍ය	වෛද්‍ය විද්‍යාවේදී	ඉංග්‍රීසි	06	26	54	50	01

- **අනධ්‍යයන කාර්යමණ්ඩලය**

පීඨය	ජ්‍යෙෂ්ඨතම	ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල	කනිෂ්ඨ කාර්ය මණ්ඩල	සුළු සේවක
වෛද්‍ය	20	60	87	50

2.6.5 පර්යේෂණ, නව්‍යජනන හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු

විෂයය	මුදුණය කළ	වෙළඳ පොළට ඉදිරිපත් කරන ලද	ඉදිරිපත් කරන ලද
අ. පර්යේෂණ සංඛ්‍යාව	91	07	188
ආ. නව්‍යජනන සංඛ්‍යාව	--	02	02
ඇ. වාරසඟරා සංඛ්‍යාව	05	01	04
ඈ. ග්‍රන්ථ සංඛ්‍යාව	26	09	01
ඉ. ලේඛන සංඛ්‍යාව	152	--	68
ඊ. වෙනත්	09	--	01
එකතුව	283	19	264

2.6.6 වැඩසටහන්, සම්මන්ත්‍රණ හා වැඩමුළුවල කාර්යමණ්ඩල සහභාගිත්වය පිළිබඳ තොරතුරු

විෂයය	සහභාගීත්වය	සම්පූර්ණ කරන ලද	ඉදිරිපත් කරන ලද
අ. උපාධි පාඨමාලා සංඛ්‍යාව	27	2	8
ආ. පශ්චාත් උපාධි ඩිප්ලෝමා සංඛ්‍යාව	1	2	1
ඇ. උපාධි පාඨමාලා සංඛ්‍යාව	4	4	
ඈ. ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව	29	26	1
ඉ. සහතිකපත් පාඨමාලා සංඛ්‍යාව		1	1
ඊ. වෙනත් (වැඩමුළු)	194	4	5
එකතුව	**255**	**39**	**16**

2.6.7 ලබාගත් ත්‍යාග පිළිබඳ තොරතුරු

විෂයය	ත්‍යාග සංඛ්‍යාව	අධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යා	ශිෂ්‍ය සංඛ්‍යාව
අ. දේශීය ත්‍යාග	01	--	--
ආ. ජාතික ත්‍යාග	05	02	--
ඇ. ජාත්‍යන්තර ත්‍යාග	04	02	--
ඈ. වෙනත්	--	--	--
එකතුව	10	04	--

2.6.8 ප්‍රථම උපාධි ශිෂ්‍ය ප්‍රජාව - 2012

(පීඨය හා ස්ත්‍රී පුරුෂ භාවය මත වර්ගීකරණය කර ඇත)

	ශිෂ්‍ය සංඛ්‍යාව		එකතුව
	පී	ගැ	
වෛද්‍ය	517	490	1007
භෞතවිකිත්සකවේද	58	76	134

2.6.9 (ප්‍රථම උපාධි) ශිෂ්‍ය ප්‍රජාව - 2012

(පීඨය හා ජනවර්ගය අනුව වර්ගීකරණය කර ඇත)

	සිංහල	දෙමළ	මුස්ලිම්	වෙනත්	එකතුව
වෛද්‍ය	**916**	**24**	**28**	**39**	**1007**
භෞතවිකිත්සකවේද	119	10	05	--	134

2.6.10 ප්‍රථම උපාධි ශිෂ්‍ය ප්‍රජාව - 2012

(පීඨය හා ආගම අනුව වර්ගීකරණය කර ඇත)

	බෞද්ධ	රෝ. ක.	ක්‍රිස්තියානි	හින්දු	ඉස්ලාම්	වෙනත්	එකතුව
වෛද්‍ය	**880**	**38**	**37**	**24**	**28**	--	**1007**
භෞතවිකිත්සකවේද	112	--	08	09	05	--	134

(ප්‍රථම උපාධි අපේක්ෂක) නවක සිසුන් ඇතුලත් කිරීම් 2012

(අදාළ දිස්ත්‍රික්කය හා පීඨය අනුව වර්ගීකරණය කර ඇත)

දිස්ත්‍රික්කය	වෛද්‍ය විද්‍යාවේදී	භෞතවිකිත්සකවේද
කොළඹ	764	23
ගම්පහ	26	11
කළුතර	16	09
මාතලේ	01	01
මහනුවර	06	05
නුවරඑලිය	-	-
ගාල්ල	19	13
මාතර	14	20
හම්බන්තොට	13	05
යාපනය	15	03
කිලිනොච්චිය	-	01
මන්නාරම	-	01
මුලතිව්	02	01
වවුනියා	03	01
ත්‍රිකුණාමලය	03	01
මඩකලපුව	05	01
අම්පාර	02	02
පුත්තලම	16	03
කුරුණෑගල	13	11
අනුරාධපුර	03	02
පොළොන්නරුව	03	04
බදුල්ල	11	--
මොනරාගල	08	02
කෑගල්ල	13	07
රත්නපුර	12	07
විදේශිය	39	--
එකතුව	**1007**	**134**

2.7 විද්‍යා පීඨය

හැදින්වීම

අනධ්‍යයන හා අධ්‍යයන කාර්යමණ්ඩල වෘත්තිය සමිති විසින් ගන්නා ලද වැඩ වර්ජන වෘත්තිය ක්‍රියා මාර්ගය හමුවේ ද. සමාලෝචිත වර්පයට අදාළ අධ්‍යයන ක්‍රියාකාරකම් හා අනෙකුත් කටයුතු පීඨය විසින් සම්පූර්ණ කරන ලදී. එච්. ජ්. ටී. සී. ව්‍යාපෘතිය යටතේ. තම ඉගැන්වීම් හා පර්යේපණ කටයුතුවලට අදාළ ක්‍රියාකාරකම්හි තත්ත්වය උසස් කිරීම සඳහා පීඨය වෙත ප්‍රබල ප්‍රතිපාදන 04 ක් ලබා දී තිබේ. 2012 නොවැම්බර් මස 28 වන දා පීඨයේ වාර්ෂික පර්යේපණ පරිසංවාදය පවත්වන ලදී. පැරණි රසායනවිද්‍යා/භෞතික විද්‍යා/ගණිත ගොඩනැගිල්ල නවීකරණය කිරීමේ කටයුතු ආරම්භ කරන ලද අතර. චතුරස්‍රයේ ගෙවතු නිර්මාණ කටයුතු සම්පූර්ණ කරන ලදී.

2.7.1 සම්පත් හා ශිෂ්‍යයන් පිළිබඳ තොරතුරු:

පීඨය	අධ්‍යයන පාඨමාලාව	මුළු ශිෂ්‍ය සංඛ්‍යාව	මුළු අධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව	මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව
විද්‍යා	සාමාන්‍ය - අවුරුදු 03	1311	108	92
	සාමාන්‍ය - අවුරුදු 04	19		
	විශේෂ - 3වන වසර	167		
	විශේෂ - 4වන වසර	178		
එකතුව		**1675**	**108**	**92**

2.7.2 දේශීය ශිෂ්‍යයන් පිළිබඳ තොරතුරු: 1675

පීඨය	අධ්‍යයන වැඩසටහන	මාධ්‍යය	2012 සිටම ඇතුළත්	1 වන වසර	2වන වසර	3 වන වසර ශිෂ්‍යයන්		4 වන වසර ශිෂ්‍යයින්		උපාධිලාභී සංඛ්‍යාව
						සාමාන්‍ය	විශේෂ	සාමාන්‍ය	විශේෂ	
විද්‍යා	භෞතික විද්‍යා	ඉංග්‍රීසි		231	236	212	167	7	178	
	ජීව විද්‍යා			127	115	77		1		
	කාර්මික සංඛ්‍යාන හා ගණිත මූල්‍යය			62	64	53		6		
	අණුක ජීව විද්‍යාව හා ප්‍රේව රසායන විද්‍යාව			55	43	36		5		
එකතුව				**475**	**458**	**545**		**197**		

2.7.3 අධ්‍යයන කාර්යමණ්ඩල: 108 (ස්ථිර කාර්යමණ්ඩලය): 74 (තාවකාලික)

පීඨය	විෂයය	මාධ්‍යය	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	මහාචාර්ය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය	කථිකාචාර්ය	සහාය කථිකාචාර්ය	උපදේශක/ පංදේශක
විද්‍යා	ජීව විද්‍යා	ඉංග්‍රිසි	1	7	9		2	4
	භෞතික විද්‍යා			7	7	1	1	12
	ගණිත				13	7	7	6
	ශාක විද්‍යා		2		8	3	3	9
	න්‍යෂ්ටික විද්‍යා		1	1	1	1		2
	රසායන විද්‍යා		2	7	11	2		10
	සංඛ්‍යානය			1	7	9	5	7
	පීඨාධිපති කාර්යාලය							6
එකතුව (මුළු එකතුව - 182)			**6**	**23**	**56**	**23**	**18**	**56**

2.7.4 අනධ්‍යයන කාර්යමණ්ඩල තොරතුරු: 92

පීඨය/අංශය	ජ්‍යෙෂ්ඨතම	ජ්‍යෙෂ්ඨ	කනිෂ්ඨ	සුළු සේවක
ජීව විද්‍යා	2	3	2	8
භෞතික විද්‍යා	1	5	4	13
ගණිත	-	1	-	2
ශාක විද්‍යා	2	-	5	9
න්‍යෂ්ටික විද්‍යා	-	4	-	1
රසායන විද්‍යා	3	-	5	12
සංඛ්‍යානය	-	2	1	-
පීඨාධිපති කාර්යාලය	-	3	1	3
එකතුව	**8**	**18**	**18**	**48**

2.7.5 පර්යේෂණ, නව්‍යජනන හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු:

විෂයය	ප්‍රකාශයට පත් කළ	වෙළඳ පොළට නිකුත් කළ	ඉදිරිපත් කළ	කෙරෙමින් පවත්නා
අ. පර්යේෂණ සංඛ්‍යාව	56	1	84	17
ආ. නව්‍යජනන සංඛ්‍යාව	-	-	-	-
ඇ. වාරසඟරා සංඛ්‍යාව	15	-	-	-
ඈ. ග්‍රන්ථ සංඛ්‍යාව	9	-	5	-
ඉ. ලේඛන සංඛ්‍යාව	33	-	13	1
ඊ. වෙනත්	13	-	2	-
එකතුව	**126**	**1**	**104**	**18**

2.7.6 වැඩසටහන්, සම්මන්ත්‍රණ හා වැඩමුළු පිළිබඳ තොරතුරු:

විෂයය	සහභාගීත්වය	සම්පූර්ණ	ඉදිරිපත් කරන
අ. පශ්චාත් උපාධි වැඩසටහන් සංඛ්‍යාව	28	13	11
ආ. පශ්චාත් උපාධි ඩිප්ලෝමා සංඛ්‍යාව	3	-	2
ඇ. උපාධි අධ්‍යයන වැඩසටහන් සංඛ්‍යාව	-	-	1
ඈ. ඩිප්ලෝමා සංඛ්‍යාව	8	-	-
ඉ. සහතික පත් පාඨමාලා සංඛ්‍යාව	3	3	-
ඊ. වෙනත්	4	10	2
එකතුව	**46**	**26**	**16**

2.7.7 ලැබූ ත්‍යාග පිළිබඳ තොරතුරු:

විෂයය	ත්‍යාග	අධ්‍යයන කාර්ය	ශිෂ්‍යයන්
අ) දේශීය ත්‍යාග	6	3	2
ආ) ජාතික ත්‍යාග	6	-	-
ඇ) ජාත්‍යන්තර ත්‍යාග	2	2	2
ඈ) වෙනත්	-	-	2
එකතුව	**14**	**5**	**6**

2.7.8 එච්. ඒ. ටී. සී. ව්‍යාපෘති පිළිබඳ තොරතුරු

නම සහ තොරතුරු	ණය/ ප්‍රතිපාදන	අරමුදල් ලබා දෙන ආයතන	වී සී ඒ	ආර් එස් ඒ	ඒ එස් රු.
1. HETC – QIG/ Window 2 ප්‍රථම උපාධි වැඩසටහන සඳහා	රු. 25,000,000/- ප්‍රතිපාදන	ලෝක බැංකුව			
2. HETC – QIG/ Window 3 පශ්චාත් උපාධි පර්යේෂණ වැඩසටහන් සඳහා	රු.30,000,000/- ප්‍රතිපාදන	ලෝක බැංකුව			
3. HETC – UDG –EDP බාහිර උපාධි වැඩසටහන්වල අදාළත්වය හා තත්ත්වය වර්ධනය කිරීම	රු. 8,000,000/- ප්‍රතිපාදන	ලෝක බැංකුව			
4. තොරතුරු තාක්ෂණ නිපුණතා හා ඉංග්‍රීසි භාෂා නිපුණතා පුළුල් කිරීම. මෘදුක නිපුණතා වර්ධනය හා ජනවාර්ගික සබැඳියාව වැඩිදියුණු කිරීම සඳහා ලබා දී ඇති	රු.10,000,000/- ප්‍රතිපාදන	ලෝක බැංකුව			

විශ්වවිද්‍යාලයීය සංවර්ධන ප්‍රතිපාදනය					
5. HETC – QIG/ Window 4 පර්යේෂණ බෙදා හැරීම හා වාණිජකරණ වැඩසටහන	ප්‍රතිඵල තවම නිකුත් වී නොමැත	ලෝක බැංකුව			

නම සහ තොරතුරු	**ණය/ ප්‍රතිපාදන**	**අරමුදල් ලබා දෙන ආයතන අංකය #**	**ටී සී ඒ රු.**	**ආර් එස් ඒ රු.**	**ඩී එස් රු.**
NSF පර්යේෂණ ප්‍රදානය NSF/2011/HS/19	රු. 2,997,625.00	ජාතික විද්‍යා පදනම			
US හි NIH ප්‍රදාන	ප්‍රතිපාදන	දේශීය සෞඛ්‍ය ආයතනය			
ස්වයං ජනිත ප්‍රතිපාදන ව්‍යාපෘතිය	ප්‍රතිපාදන				
NSF/Fellow/2011/01	ප්‍රතිපාදන	ජාතික විද්‍යා පදනම			
NRC පර්යේෂණ ප්‍රදානය NRC-12-077	රු. 5,228,735.73	ජාතික පර්යේෂණ පාලක සභාව			
CRI	රු. මිලියන 1.605	පොල් පර්යේෂණ ආයතනය			
APMEN	රු. මිලියන 3.72	APMEN			
HETC-UDG (ඉහත වගුවේ HETC-UDG-EDP බලන්න)	රු. මිලියන 2	උසස් අධ්‍යාපන අමාත්‍යාංශය			
HETC-W2 (ඉහත වගුවේ HETC-QIG-W2 බලන්න)	රු. මිලියන 1.23	උසස් අධ්‍යාපන අමාත්‍යාංශය			
HETC-W3 (ඉහත වගුවේ HETC-QIG-W3 බලන්න)	රු. මිලියන 7	උසස් අධ්‍යාපන අමාත්‍යාංශය			
කොළඹ විශ්වවිද්‍යාලය AP/3/2/2010/S/7	රු. 150,000	කොළඹ විශ්වවිද්‍යාලය			
NSF පර්යේෂණ ප්‍රදානය RG/2012/NRB/02	රු. 1,010,875.00	ජාතික විද්‍යා පදනම			
ඒ. ඒ. සුනේත්‍රා මිය පශ්චාත් උපාධි පර්යේෂණ ප්‍රදානය	ප්‍රතිපාදන	UOC			1,290,000.00
ආචාර්ය සී. ඩී. තිලකරත්න-සහයෝගිතා පර්යේෂණ ප්‍රදානය	ප්‍රතිපාදන	UOC			2,992,600.00
ආචාර්ය එම්. ඩී. ටී. ආටිගල	ප්‍රතිපාදන	කොළඹ විශ්වවිද්‍යාලය			2,899,500.00
ආර්. ඒ. බී. අබේගුණවර්ධන මයා	ප්‍රතිපාදන	කොළඹ විශ්වවිද්‍යාලය			798,000.00
ආචාර්ය ටී. එල්. එස්. තිරිමාන්න	පර්යේෂණ ප්‍රදානය	NRC රු. මිලියන 3.2			
මහාචාර්ය ආර්. එල්. සී. විජේසුන්දර	පර්යේෂණ ප්‍රදාන **3**	NRC – රු. මිලියන 7.4, NSF- රු. මිලියන 4.1			

		සහ රු. මිලියන 3.9			
ආචාර්ය ටී. ඩී. සිල්වා	පර්යේෂණ ප්‍රදානය	NSF- රු. මිලියන 3			
ආචාර්ය සී. එම්. නානායක්කාර	පර්යේෂණ ප්‍රදාන 5	3 NRC (සම සේවක) 1 NRC රු. මිලියන 7.4 1 NSF රු. මිලියන 1.9			
ආචාර්ය එස්. රත්වල	පර්යේෂණ ප්‍රදානය	1 NSF			
එම්. කේ. ඒ. සී. මහසිංහ මයා ප්‍රස්තාර මත ක්වොන්ටම ගමන්කිරීම් පිළිබඳ මෑත කාලීන පර්යේෂණ ප්‍රතිඵල පිළිබඳව සිදු කළ ගණිතමය අධ්‍යයනයක්	2011 AP/3/2011/PG/16				
ඩබ්. පී. ටී. එම්. වික්‍රමාරච්චි මයා ඩෙංගු වසංගතය හා ඩෙංගු රෝගය පැතිරීම පාලනය පිළිබඳ ගණිතමය ආදර්ශයක් සැදීම	HETC QIG – W3 ක්‍රියාකාරකම 5 (ඉහත වගුවේ HETC-QIG-W3 බලන්න)				
කේ. ඩී. එන්. කුමාරි මිය සූර්ය ශක්ති ජල තාපකයක සංවාහී උණුසුම් ප්‍රවාහ පිළිබඳ සංඛ්‍යාත්මක සමකරණය	HETC QIG –W3 ක්‍රියාකාරකම 5 (ඉහත වගුවේ HETC-QIG-W3 බලන්න)				
අයි. ටී. එස්. පියතිලක මිය ශ්‍රී ලංකාවේ වායුගෝලීය තත්ත්වය සංඛ්‍යාත්මකව බැලීම සඳහා ගණිතමය ආකෘතියක් සැදීම හා එය වලංගු කර තහවුරු කිරීම	HETC QIG –W3 ක්‍රියාකාරකම 5 (ඉහත වගුවේ HETC-QIG-W3 බලන්න)				
ආචාර්ය ජේ. කේ. විජේරත්න (2)	12:115 AP/3/2/2012/RG/SC/02	NRC කොළඹ විශ්වවිද්‍යාලය			
ආචාර්ය එස්. එස්. එන්. පෙරේරා (2)	කොළඹ විශ්වවිද්‍යාලය NSF				

ආචාර්ය ටී. එල්. එස්. තිරිමාන්න *ඇසෝරයිසෝබියානු කැන්ලිනෝඩන හඳුන්වාදීම සඳහා වී ගසේ මූල වෙත නයිට්‍රජන් යෙදවීම පුළුල් කිරීම*	පර්යේෂණ ප්‍රදානය	NRC රු. මිලියන 3.2			
මහාචාර්ය ආර්. එල්. සී. විජේසුන්දර. *සෙලියුලෝස්මය ජෛව ස්කන්ධයන් එතනෝල්හි සයිකෝ-ජානමය ශර්කරීකරණය හා සාජු පැසවීමක් සිදුකිරීම සඳහා ට්‍රයිකොඩර්මාවන්ගේ සෙලියුලෝස් හා සිලනේය ප්‍රවේණ්‍යණු යිස්ට් පද්ධතියක් තුළ ක්ලෝනිකරණය කිරීම හා ප්‍රකාශනය*	පර්යේෂණ ප්‍රදාන 3	NRC රු. මිලියන 7.4 NSF රු. මිලියන 4.1 NSF රු. මිලියන 3.9			
ආචාර්ය ටී. ඩී. සිල්වා	පර්යේෂණ ප්‍රදාන	NSF රු. මිලියන 3			
ආචාර්ය සී. එම්. නානායක්කාර	පර්යේෂණ ප්‍රදාන 5	3 NRC (සම සේවක) NRC රු. මිලියන 7.4 NSF රු. මිලියන 1.9			
ආචාර්ය එස්. ඩබ්. රත්වල	පර්යේෂණ ප්‍රදාන	NSF රු. Rs.800,000/-			
මහාචාර්ය ටී. ආර්. ආරියරත්න AP/3/2012/CG/13	පර්යේෂණ ප්‍රදාන රු. 2,960,000/-	කොළඹ විශ්වවිද්‍යාලය			
මහාචාර්ය ඩී. යූ. ජේ. සොන්නාදර AP/3/2012/CG/14	පර්යේෂණ ප්‍රදාන රු. 600,000/-	කොළඹ විශ්වවිද්‍යාලය			
මහාචාර්ය එස්. ඩබ්. කොටගම AP/3/2012/CG/15	සහයෝගිතා ප්‍රදාන Rs.3,000,000/-	කොළඹ විශ්වවිද්‍යාලය			
මහචාර්ය කේ. ආර්. ආර්. මහානාම AP/3/2012/IDG/21	යටිතල පහසුකම් ප්‍රතිපාදන රු. 2,000,000/-	කොළඹ විශ්වවිද්‍යාලය			
මහාචාර්ය ආර්. එස්. දසනායක AP/3/2012/IDG/22	යටිතල පහසුකම් ප්‍රතිපාදන රු. 3,000,000/-	කොළඹ විශ්වවිද්‍යාලය			
ආචාර්ය එන්. පල්ලෙවත්ත AP/3/2012/IDG/23	යටිතල පහසුකම් ප්‍රතිපාදන රු. 2,000,000/-	කොළඹ විශ්වවිද්‍යාලය			

2.7.9 ව්‍යාපෘති වියදම් තොරතුරු (දේශීය/විදේශීය ප්‍රතිපාදන)

නම	ටී. සී. ඒ. රු.	2010 වර්ෂයේ වියදම් රු.	2011 වර්ෂයේ වියදම් රු.	2012.12.31 දිනට සමුච්චිත වියදම රු.	භෞතික ප්‍රගතියෙහි ප්‍රතිශත අගය %
ඒ. ඒ. සුනේත්‍රා මිය පශ්චාත් උපාධි පර්යේෂණ ප්‍රදානය				-	
ආචාර්ය සී. ඩී. තිලකරත්න සහයෝගිතා පර්යේෂණ ප්‍රදානය				-	
ආචාර්ය එම්. ඩී. ටී. ආටිගල				487,595/-	20%
ආර්. ඒ. බී. අබේගුණවර්ධන				125,000/-	
NRC-11-04	4,300,000/-		1,300,000/-	1,300,000/-	30%
CID					
විදුලි සැර ආරක්ෂණය - සන්නිවේදනය					
2012/CG/14	600,000/-				
TG/Tech – D/03	375,000/-		300,000/-	300,000/-	80%
HETC 1/3	6,000,000/-		500,000./-	500,000/-	8.3%
විශ්වවිද්‍යාලයීය පර්යේෂණ ප්‍රදානය 2012 AP/3/2012/CG/13	2,960,000/-		45,000/-	45,000/-	1.52%
NSF පර්යේෂණ ප්‍රදානය RG/2008/EB/03			287,120/-		සම්පූර්ණ කර ඇත
හොංකොං විශ්වවිද්‍යාලයීය ප්‍රදානය: HKU/SL/B/01			250,000/-		සම්පූර්ණ කර ඇත
කොළඹ විශ්වවිද්‍යාලය AP/3/2/2010/S/7				150,000/-	සම්පූර්ණ කර ඇත
NSF පර්යේෂණ ප්‍රදානය RG/2012/NRB/02				-	0%
CRI				160,500,000 /-	සම්පූර්ණ කර ඇත
APMEN				35,700,000/-	75%
HETC-1				461,240/-	25%
NSF/Fellow/2011/01				797,689/-	50%

2.7.10 මෙම වාර්තාවට අදාළ වෙනත් තොරතුරු/ක්‍රියාකාරිත්වයන්

ගණිත අධ්‍යයනාංශයේ ගණිත මාදිලිකරණය සඳහා පර්යේෂණ හා සංවර්ධන කේන්ද්‍රයක් ස්ථාපනය කරන ලදී. පළාතේ පශ්චාත් උපාධි පර්යේෂණ සිසුන් 5 දෙනෙකු සමග උපාධි මට්ටමේ පර්යේෂණ අරඹන ලදී.

ජීව විද්‍යා අධ්‍යයනාංශය වෙත නව ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් දෙදෙනෙකු බඳවා ගන්නා ලදී. ඒ ආචාර්ය එරන්දති ලොකුපිටිය (පර්යේෂණ ක්ෂේත්‍රය : කාලගුණ වෙනස්වීම්) සහ ආචාර්ය සම්පත් සෙනෙවිරත්න (පර්යේෂණ ක්ෂේත්‍රය : පරිණාමීය පරිසර විද්‍යාව) යන දෙදෙනා යි. ඔවුන් ප්‍රථම උපාධි මෙන් ම පශ්චාත් උපාධි අධ්‍යයන වැඩසටහන් සඳහා නව පාඨමාලා ගොඩනගන අතර ම, තම තම පර්යේෂණ කාර්ය ක්ෂේත්‍රයන්හි පර්යේෂණ කටයුතු අරඹනු ඇත.

සත්ත්ව විද්‍යා අධ්‍යයනාංශය සඳහා නාවලපිටියේ ඩිල්මා සංරක්ෂණය (ඩිල්මා සමූහයේ ඒකකයකි) සතුව පවත්නා තේ වතු අතරින් එකක ඩිල්මා සංරක්ෂණය විසින් කාලගුණ වෙනස්වීම් පිළිබඳ පර්යේෂණ කේන්ද්‍රයක් ගොඩනැගීම සඳහා කැමැත්ත පළ කර ඇත. 2013 වසරේ ප්‍රථම කාර්තුවේ දී මෙම ස්ථානය ඉදිකෙරෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2.8 ශ්‍රී පාලි මණ්ඩපය

කෙටි හැඳින්වීමක්

1996 දී බටහිර මණ්ඩපය ලෙසින් ස්ථාපිත වූ ශ්‍රී පාලි මණ්ඩපය ඉන් අනතුරුව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය ප්‍රකාර 1998 වසරේ දී කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධ වෙමින් තම නාමය "ශ්‍රී පාලි මණ්ඩපය" ලෙස වෙනස් කිරීමකට ලක් කර ගන්නා ලදී.

මණ්ඩපය අධ්‍යයනාංශ දෙකකි. එනම් ජන මාධ්‍ය හා ප්‍රාසාංගික කලා යන මේ අධ්‍යයනාංශ සමග තව දුරටත් 2012 වර්ෂය තුළ දී ද ක්‍රියාත්මක විය. මෙම අධ්‍යයනාංශ දෙක පිළිබඳව උසස් කිරීමේ කර්තව්‍යය, ප්‍රමාණවත් නොවන ජ්‍යෙෂ්ඨ අධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යා කරණ කොටගෙන ව්‍යර්ථ විය. සමාලෝචිත වසර තුළ ඒකක දෙකක් ලෙසින් භාෂා ඒකකය හා පරිගණක ඒකකය තව දුරටත් ක්‍රියාත්මක වූ අතර මෙම ඒකක දෙක ද අනාගතයේ දී වෙන් වෙන් අධ්‍යයනාංශ වශයෙන් ගොඩනැගීමට අපේක්ෂා කෙරේ.

ආචාර්ය ටියුඩර් වීරසිංහ විසින් මණ්ඩපයේ මණ්ඩපාධිපති ධුරයෙහි තම කාර්යයන් 2012 වර්ෂය තුළ දී ද අඛණ්ඩ ව සිදුකරගෙන යන ලදී.

සියලු අධ්‍යයන හා පරිපාලනමය තීරණ මණ්ඩප සභාවේ උපදෙස් ලබාගනිමින් ගන්නා ලද අතර වසර තුළ මණ්ඩප සභාවේ සංයුතිය පහත දැක්වෙන පරිදි විය:

මණ්ඩපාධිපති - ආචාර්ය එල්. ටියුඩර් වීරසිංහ

පාලක සභාවෙන් නිර්දේශිත සාමාජිකයන් -

රෝහන වීරසිංහ මයා - 2014.09.13 දක්වා
ජනදාස පීරිස් මයා - 2014.09.13 දක්වා

සනාතන සභාවෙන් නිර්දේශිත සාමාජිකයන් -

පූජ්‍ය අගලකඩ සිරිසුමන හිමි - 2012.05.26 සිට 2013.05.25 දක්වා
මහාචාර්ය ජේ. උයන්ගොඩ - 2012.12.01 සිට 2013.11.31

අධ්‍යයනාංශ ප්‍රධානීන් -
ආචාර්ය ආර්. සී. කේ. හෙට්ටිආරච්චි - ජන මාධ්‍ය අධ්‍යයනාංශය
ජේ. එම්. ආර්. සී. බණ්ඩාර මයා - ප්‍රාසාංගික කලා අධ්‍යයනාංශය

කාර්යමණ්ඩල තොරතුරු

	කාර්මික සංඛ්‍යාන හා ගණිත මූල්‍යය	ඉ		62	64	53	6		1 (නැවත පෙනී සිටීම)
	විද්‍යාවේදී විශේෂ උපාධිය			_	_	167	178		_

වගුව 2 - ශිෂ්‍ය ප්‍රජාව (පීඨය හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව වර්ගීකරණය කර ඇත)

පීඨය	ශිෂ්‍ය සංඛ්‍යාව			එකතුව
	පි	පි (පූජ්‍ය පක්ෂය)	ගැ	
ශාස්ත්‍ර	401	37	1744	2182
අධ්‍යාපන	15	01	288	304
නීති	175	_	779	954
කළමනාකරණ හා මූල්‍ය	720	_	961	1681
වෛද්‍ය	575	_	566	1141
විද්‍යා	815	_	870	1685
එකතුව	2701	38	5208	7947

වගුව 3 - 2012/01/01 - 2012/12/31 කාලය තුළ නිකුත් කරන ලද ප්‍රතිඵල අනුව උපාධිලාභී වූවන්

උපාධියේ නම	පෙනී සිටි සංඛ්‍යාව	සමත් සංඛ්‍යාව		එකතුව
		පි	ගැ	
ශාස්ත්‍රවේදී (සාමාන්‍ය)	225	37	117	154
ශාස්ත්‍රවේදී (විශේෂ)	391	83	288	371
නීතිවේදී	199	28	159	199 (යාපනයෙන් පැමිණි සිසුන් 22 දෙනා ඇතුළුව)
වෛද්‍ය විද්‍යාවේදී				205
ව්‍යාපාර කළමනාකරණවේදී	388	140	207	347
විද්‍යාවේදී (සාමාන්‍ය)		1	10	11 (නැවත පෙනී සිටින සිසුන්)
විද්‍යාවේදී (විශේෂ)				_

වගුව 4 - පශ්චාත් උපාධි ශිෂ්‍ය ප්‍රතිදානය (/01/01 - 2012/12/31 කාලය තුළ නිකුත් කරන ලද ප්‍රතිඵල අනුව)

පශ්චාත් උපාධි ශිෂ්‍ය ප්‍රතිදානය
2012/01/01 - 2012/12/31 කාලය තුළ නිකුත් කරන ලද ප්‍රතිඵල අනුව

පීඨය	උපාධිලාභී සංඛ්‍යාව											
	පද. ඩිප්ලෝමා			ශාස්ත්‍රපති උපාධි			දර්ශනපති උපාධි			දර්ශන සූරී උපාධි		
	පි	ගැ	ඵ	පි	ගැ	ඵ	පි	ගැ	ඵ	පි	ගැ	ඵ
ශාස්ත්‍ර	13	22	**35**	73	88	161	_	_	_	_	_	_
අධ්‍යාපන	321	953	**1274**	5	5	10	_	_	_	_	_	_
නීති	_	_	_	_	_	_	_	1	3	_	_	_
කළමනාකරණ හා මූල්‍ය	_	_	_	83	34	117	_	_	_	_	_	_
විද්‍යා	16	26	**42**	21	25	46	_	3	3	4	3	7
උපාධි අධ්‍යයන	111	72	**183**	77	72	149	1	4	5	1	_	_

2012 වසරේ උපාධි ප්‍රදානෝත්සව

I. උපාධි ප්‍රදානෝත්සවය - 2011

2011 වසර සඳහා උපාධි ප්‍රදානෝත්සවය 2012 මැයි මස 23 හා 24 යන දෙදින දී. ඔණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවෙහි දී පවත්වන්නට යෙදුණි. දෙදහස් පන්සිය පනස් පස් (2555) දෙනෙක් එහි දී උපාධිලාභී වූහ.

වගුව 5 - 2011 උපාධි ප්‍රදානෝත්සවයේ දී (2012 දී පවත්වන ලද) පිරිනමන ලද උපාධි

පීඨය/අධ්‍යයනායතනය	උපාධියේ නම	උපාධිලාභී සංඛ්‍යා
ශාස්ත්‍ර	ශාස්ත්‍රවේදී (සාමාන්‍ය)	233
	ශාස්ත්‍රවේදී (විශේෂ)	371
අධ්‍යාපන	අධ්‍යාපනවේදී	179
නීති	නීතිවේදී	197
කළමනාකරණ හා මූල්‍ය	ව්‍යාපාර කළමනාකරණවේදී	348
වෛද්‍ය	වෛද්‍ය විද්‍යාවේදී හා ශල්‍ය වෛද්‍ය විද්‍යාවේදී	195
	භෞතවිකිත්සා විද්‍යාවේදී	27
විද්‍යා	විද්‍යාවේදී	460
ශ්‍රී පාලි මණ්ඩපය	ශාස්ත්‍රවේදී (විශේෂ) - ජන මාධ්‍යවේදය	57
	ශාස්ත්‍රවේදී (විශේෂ) - ප්‍රාසාංගික කලා	48
පරිගණක පාසල	පරිගණක විද්‍යාවේදී	103
	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී	59
	පරිගණක විද්‍යාවේදී	39
	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී	18
දේශීය වෛද්‍ය විද්‍යායතනය	ආයුර්වේද වෛද්‍යවිද්‍යාව හා ශල්‍ය වෛද්‍යවේදී	63
	යුනානි වෛද්‍යවිද්‍යාව හා ශල්‍ය වෛද්‍යවේදී	9
මානව සම්පත් අභිවර්ධන ආයතනය	ශ්‍රම අධ්‍යයනවේදී	149
එකතුව		**2555**

2012 වසරේ පවත්වන ලද ප්‍රථම උපාධි විභාග

	දි	මා	වර්ෂය	දි	මා	වර්ෂය	පි	ගැ	පෙනී සිටි සිසුන් සං.
ශාස්ත්‍ර පීඨය									
කොටස I - සෙමෙස්තරය I (විශේෂ)	12	3	2012	31	3	2012	***57***	***249***	***306 RR***
කොටස II - සෙමෙස්තරය I (විශේෂ)	12	3	2012	31	3	2012	***61***	***249***	***310 RR***
කොටස III - සෙමෙස්තරය I (විශේෂ)	12	3	2012	31	3	2012	***65***	***250***	***315 RR***
කොටස I - සෙමෙස්තරය I (සාමාන්‍ය)	12	3	2012	31	3	2012	***210***	***59***	***269 RR***
කොටස II - සෙමෙස්තරය I (සාමාන්‍ය)	12	3	2012	31	3	2012	***61***	***192***	***253 RR***
කොටස I - සෙමෙස්තරය II (විශේෂ)	3	12	2012	20	12	2012	***57***	***249***	***306 RNR***
කොටස II - සෙමෙස්තරය II (විශේෂ)	3	12	2012	20	12	2012	***61***	***249***	***310 RNR***
කොටස III - සෙමෙස්තරය II (විශේෂ)	3	12	2012	20	12	2012	***67***	***251***	***318 RNR***
කොටස I - සෙමෙස්තරය II (සාමාන්‍ය)	3	12	2012	20	12	2012	***224***	***68***	***292 RNR***
කොටස II - සෙමෙස්තරය II (සාමාන්‍ය)	3	12	2012	20	12	2012	***68***	***202***	***270 RNR***
01 වසර සෙමෙස්තරය I	12	3	2012	31	3	2012	***117***	***511***	***628 RR***
01 වසර සෙමෙස්තරය II	3	12	2012	20	12	2012	***117***	***511***	***628 RNR***
අධ්‍යාපන පීඨය									
BED කොටස I සෙමෙස්තරය II	3	12	2012	20	12	2012	***8***	***86***	***94 RNR***
BED කොටස II සෙමෙස්තරය II	3	12	2012	20	12	2012	***6***	***2***	***8 RNR***
BED කොටස III සෙමෙස්තරය II	3	12	2012	6	12	2012	***2***	***98***	***100 RNR***
BED කොටස I සෙමෙස්තරය I	12	3	2012	31	12	2012	***8***	***86***	***94 RR***
BED කොටස II සෙමෙස්තරය I	12	3	2012	31	12	2012	***6***	***102***	***108 RR***
BED කොටස III සෙමෙස්තරය I	26	3	2012	5	4	2012	***2***	***98***	***100 RNR***
කළමනාකරණ හා මූල්‍ය පීඨය									
BBA-මට්ටම I සෙමෙස්තරය I (සාමාන්‍ය) නව	17	2	2012	28	3	2012	***175***	***240***	***415 RNR***
BBA- මට්ටම I සෙමෙස්තරය I (නැවත) නව	9	4	2012	17	5	2012	***55***	***23***	***78 RNR***
BBA- මට්ටම I සෙමෙස්තරය III (සාමාන්‍ය) New	3	4	2012	21	5	2012	***192***	***244***	***436 RNR***
BBA - මට්ටම 1 සෙමෙස්තරය III (නැවත) New	3	4	2012	21	5	2012	***98***	***51***	***149 RNR***
BBA- මට්ටම I සෙමෙස්තරය I (නැවත) - පැරණි	2	4	2012	17	5	2012	***10***	***7***	***17 RNR***
BBA- මට්ටම I සෙමෙස්තරය III (නැවත) - පැරණි	3	4	2012	21	5	2012	***33***	***9***	***42 RNR***
BBA- මට්ටම I සෙමෙස්තරය II (සාමාන්‍ය) - New	15	11	2012	3	12	2012	***172***	***238***	***410 RNR***
BBA- මට්ටම I සෙමෙස්තරය III (නැවත)- New	15	11	2012	3	12	2012	***92***	***34***	***126 RNR***
BBA- මට්ටම II සෙමෙස්තරය V (නැවත) 2012	2	4	2012	17	5	2012	***90***	***25***	***115 RNR***
BBA- මට්ටම II සෙමෙස්තරය VII (නැවත) 2012	3	4	2012	18	5	2012	***43***	***13***	***56 RNR***
BBA - මට්ටම II සෙමෙස්තරය V (සාමාන්‍ය)	2	4	2012	17	5	2012	***167***	***222***	***389 RNR***
BBA - මට්ටම II සෙමෙස්තරය VII (සාමාන්‍ය)	3	4	2012	18	5	2012	***156***	***230***	***386 RNR***
නීති පීඨය									
1 වන වසර	22	6	2012	16	11	2012	***44***	***204***	***248 RNR***
2 වන වසර	22	6	2012	16	11	2012	***37***	***217***	***245 RNR***
3 වන වසර	22	6	2012	16	11	2012	***53***	***197***	***250 RNR***
4 වන වසර	5	6	2012	22	6	2012	***33***	***169***	***202 RR***
4 වන වසර යාපන සරසවි සිසුන්	5	6	2012	22	6	2012	***4***	***20***	***24 RR***
විද්‍යා පීඨය									

මට්ටම I - සෙමෙස්තරය I	6	3	2012	5	4	2012	***448***	***337***	***785 RR***
මට්ටම I - සෙමෙස්තරය II	3	12	2012	21	12	2012	***387***	***279***	***666 RNR***
මට්ටම II - සෙමෙස්තරය I	5	3	2012	5	4	2012	***404***	***291***	***695 RR***
මට්ටම II - සෙමෙස්තරය II	3	12	2012	21	12	2012	***358***	***251***	***609 RNR***
මට්ටම 3 - සෙමෙස්තරය I (සාමාන්‍ය)	5	3	2012	10	4	2012	***209***	***126***	***335 RR***
මට්ටම 3 - සෙමෙස්තරය II (සාමාන්‍ය)	3	12	2012	22	12	2012	***60***	***107***	***167 RNR***
මට්ටම 4 - සෙමෙස්තරය I (විශේෂ)	5	3	2012	5	4	2012	***64***	***117***	***181 RR***
මට්ටම 4 - සෙමෙස්තරය II (විශේෂ)	3	12	2012	22	12	2012	***64***	***117***	***181 RNR***
මට්ටම 3 - සෙමෙස්තරය I (විශේෂ)	5	3	2012	10	4	2012	***60***	***107***	***167 RR***
මට්ටම 3 - සෙමෙස්තරය II (විශේෂ)	3	12	2012	22	12	2012	***60***	***107***	***167 RNR***
මට්ටම 4 - සෙමෙස්තරය I (සාමාන්‍ය)	5	3	2012	5	4	2012	***15***	***5***	***20RR***
මට්ටම 4 - සෙමෙස්තරය II (සාමාන්‍ය)	3	12	2012	22	2	2012	***15***	***5***	***20 RNR***

1. **පශ්චාත් උපාධි ප්‍රදානෝත්සවය**

2011 වසරේ සුදුසුකම් සපිරි පශ්චාත් උපාධි හා ඩිප්ලෝමා පිරිනැමීම සඳහා පශ්චාත් උපාධි ප්‍රදානෝත්සවය **2012** ජූලි මස **31** වන දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවෙහි දී පවත්වන ලදී.

වගුව 7 : 2011 පශ්චාත් උපාධි ප්‍රදානෝත්සවයේ දී (2012 වසරේ පවත්වන ලද) පිළිගන්වන ලද උපාධි/ඩිප්ලෝමා

පීඨය/අධ්‍යයනායතනය	**ප.උ. ඩිප්ලෝමා**	**ශාස්ත්‍රපති**	**දර්ශනපති**	**දර්ශන සූරී**
ශාස්ත්‍ර	36	137	1	1
අධ්‍යාපන	177	20	_	_
නීති	_	82	2	_
කළමනාකරණ හා මූල්‍ය	_	132	_	_
වෛද්‍ය	13		1	1
විද්‍යා	52	67	3	6
උපාධි අධ්‍යයන	220	152	1	_
දේශීය වෛද්‍ය විද්‍යායතනය IIM	1	_	_	_
ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය NILIS	8	7	_	_
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය PGIM	269	338	_	_
මානව සම්පත් අභිවර්ධන ආයතනය IHRA	36		_	_
කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක පාසල UCSC	34	122	2	_
ජෛව රසායනික, අණුක ජීව විද්‍යා හා ජෛව තාක්ෂණ අධ්‍යයනායතනය IBBMB	_	17	_	1
	846	1074	10	9

කොළඹ විශ්වවිද්‍යාලයීය පර්යේෂණ ප්‍රදාන

2011 වසරේ ජයග්‍රාහකයින් වනුයේ ;

මහාචාර්ය සේනක රාජපක්ෂ (වෛද්‍ය පීඨය)
මහාචාර්ය ඩබ්. ඩී. රත්නසූරිය (විද්‍යා පීඨය)
ආචාර්ය කේ. පී. හේවාගමගේ (කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක පාසල)

2012 වසරේ පවත්වන ලද විභාග

වෛද්‍ය පීඨයේ විභාග හැර අනෙකුත් සියලු ප්‍රථම උපාධි. පශ්චාත් උපාධි හා වෙනත් සහතික පත් හා ඩිප්ලෝමා මට්ටම්වල විභාග. විභාග අංශය විසින් පවත්වන ලදී.

RR – ප්‍රතිඵල නිකුත්කරන ලද RNR - ප්‍රතිඵල නිකුත් කර නැත

3.2 පවත්වන ලද පශ්චාත් උපාධි හා ශාස්ත්‍රපති විභාග - 2012

පාඨමාලාවේ නම	විභාග දින		පෙනී සිටි සංඛ්‍යා
	සිට	දක්වා	
ශාස්ත්‍ර පීඨය			
ව්‍යවහාරික සමාජ විද්‍යාව පිළිබඳ ප.උ. ඩිප්ලෝමාව 2011/2012	3/1/2012	16/1/2012	26 RR
පාරිසරික හා කලාපීය සංවර්ධනය පිළිබඳ ප.උ. ඩිප්ලෝමාව 2011/2012	3/3/2012	17/3/2012	33 RNR
පාරිසරික හා කලාපීය සංවර්ධනය පිළිබඳ ප.උ. ඩිප්ලෝමාව 2011/2012	3/3/2012		33 RNR
සංචාරක ආර්ථික විද්‍යා හා හෝටල් කළමනාකරණය පිළිබඳ ප.උ. ඩිප්ලෝමාව 2011/2012 (සෙමෙස්තරය I)	26/8/2012	2/9/2012	55 RNR
ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය I කොටස 2010 (II කණ්ඩායම)	14/01/2012	21/01/2012	43 RR
ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - කොටස I 2010/2011	11/2/2012	19/02/2012	35 RR
ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය 2011 කොටස I	7/1/2012	11/2/2012	43 RR
ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය 2011- කොටස II	20/10/2012	3/11/2012	39 RNR
සිංහල පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (1st සෙමෙස්තරය I)	26/05/2012	27/05/2012	60 RNR
මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (සෙමෙස්තරය I)	9/6/2012	30/06/2012	76 RR
ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ශාස්ත්‍රපති (නැවත පෙනී සිටීම) - කොටස I	7/11/2012	17/11/2012	13 RR
සූක්ෂ්ම මූල්‍යය - 2011/2012	7/1/2012	11/2/2012	25 RR
සූක්ෂ්ම මූල්‍යය පිළිබඳ ඩිප්ලෝමාව 2012 (සෙමෙස්තරය I)	11/8/2012	1/9/2012	15 RNR
සංචාරක ආර්ථික විද්‍යාව හා හෝටල් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව 2011/ 2012 (සෙමෙස්තරය I)	11/8/2012	12/8/2012	20 RNR
ජන සන්නිවේදන ඩිප්ලෝමාව - 2012	26/11/2012	30/11/2012	103 RNR
අධ්‍යාපන පීඨය			
ප.උ. අධ්‍යාපන ඩිප්ලෝමාව (පූර්ණ කාලීන)	17/10/2011	16/11/2011	148 RNR

ප.උ. අධ්‍යාපන ඩිප්ලෝමාව (සති අන්ත) නැවත පෙනී සිටීමේ විභාගය	2/6/2012	23/6/2012	RNR
ප.උ. අධ්‍යාපන ඩිප්ලෝමාව (නාට්‍ය හා රංගකලාව ඉගැන්වීම/අර්ධ කාලීන)	12/2/2012	27/2/2012	54 RR
උපදේශනය පිළිබඳ ප.උ. අධ්‍යාපන ඩිප්ලෝමාව	24/10/2011	12/10/2011	79 RR
ප.උ. අධ්‍යාපන ඩිප්ලෝමාව (නාට්‍ය හා රංගකලාව ඉගැන්වීම අර්ධ කාලීන/පූර්ණ කාලීන) නැවත පෙනී සිටීමේ විභාගය	19/11/2012	13/11/2012	RNR
ප.උ. අධ්‍යාපන ඩිප්ලෝමාව (ඉංග්‍රීසි මාධ්‍යය) අර්ධ කාලීන	22/4/2012	20/5/2012	85 RNR
ප.උ. අධ්‍යාපන ඩිප්ලෝමාව (ඉංග්‍රීසි දෙවන භාෂාවක් ලෙස ඉගැන්වීම TESL)	3/6/2012	14/3/2012	28 RNR
අධ්‍යාපනපති අර්ධ කාලීන (සිංහල)	2/6/2012	16/6/2012	64 RNR
අධ්‍යාපනපති අර්ධ කාලීන (ඉංග්‍රීසි)	2/6/2012	16/6/2012	43 RNR
අධ්‍යාපනපති පූර්ණ කාලීන	22/2/2012	24/2/2012	48 RNR
කළමනාකරණ හා මූල්‍ය පීඨය			
ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විධායක ඩිප්ලෝමාව - 2010/2011, සෙමෙස්තරය II	18/3/2012	25/3/2012	33 RR
ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විධායක ඩිප්ලෝමාව - 2011/2012, සෙමෙස්තරය I	6/10/2012	14/10/2012	44 RNR
මුද්‍රණ තාක්ෂණය හා කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව - 2011/2013 සෙමෙස්තරය II	14/7/2012	28/7/2012	8 RNR
දෘශ්‍ය සන්නිවේදනය හා කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව - 2011/2013, සෙමෙස්තරය II	14/7/2012	28/7/2012	12 RNR
ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සතියේ දින අධ්‍යයන වැඩසටහන - 2011-2013, සෙමෙස්තරය I, ද්විතීය භාගය	29/03/2012	01/04/2012	65 RR
ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සතියේ දින අධ්‍යයන වැඩසටහන - 2011-2013, සෙමෙස්තරය II, ප්‍රථම භාගය	07/07/2012	13/07/2012	64 RNR
ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය 2010/2012 (සති අන්ත - WE), (සෙමෙස්තරය II, ද්විතීය භාගය)	14/01/2012	21/01/2012	
ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය			107 RR
මූල්‍ය ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය			51 RR
අලෙවිකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති උපාධිය			30 RR
මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති උපාධිය			17 RR
ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය 2009/2011 (සති අන්ත - WE) (සෙමෙස්තරය IV, ද්විතීය භාගය)	14/01/2012	28/01/2012	
ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය			61 RR
මූල්‍ය ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය			38 RR
අලෙවිකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති උපාධිය			23 RR
මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති උපාධිය			11 RR
ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය 2010/2012 (සති අන්ත -WE), (සෙමෙස්තරය III, ප්‍රථම භාගය)	03/04/2012	11/04/2012	
ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය			71 RR
මූල්‍ය ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය			41 RR

අලෙවිකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති උපාධිය			18 RR
මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති උපාධිය			10 RR
ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය 2011/2013 (සති අන්ත -WE) (සෙමෙස්තරය I, ප්‍රථම භාගය)	07/04/2012	10/04/2012	
ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය			75 RR
මූල්‍ය ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය			35 RR
අලෙවිකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති උපාධිය			16 RR
මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති උපාධිය			12 RR
ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය 2010/2012 (සති අන්ත -WE), (සෙමෙස්තරය III, ද්විතිය භාගය)	07/07/2012	15/07/2012	
ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය			86 RR
මූල්‍ය ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය			52 RR
අලෙවිකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති උපාධිය			19 RR
මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති උපාධිය			11 RR
ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය 2011/2013 (සති අන්ත -WE) (සෙමෙස්තරය I, ද්විතිය භාගය)	08/07/2012	15/07/2012	
ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය			84 RNR
මූල්‍ය ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය			41 RNR
අලෙවිකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති උපාධිය			22 RNR
මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති උපාධිය			16 RNR
ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය 2010/2012 (සති අන්ත -WE), (සෙමෙස්තරය IV, ප්‍රථම භාගය)	17/11/2012	02/12/2012	
ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය			76 RNR
මූල්‍ය ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය			45 RNR
අලෙවිකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති උපාධිය			22 RNR
මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති උපාධිය			7 RNR
ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය 2011/2013 (සති අන්ත -WE) (සෙමෙස්තරය II, ප්‍රථම භාගය)	18/11/2012	08/12/2012	
ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය			88 RNR
මූල්‍ය ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය			38 RNR
අලෙවිකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති උපාධිය			21 RNR
මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති උපාධිය			15 RNR

නීති පීඨය			
නීතිපති උපාධිය	17/11/2012	22/12/2012	135 RNR
විද්‍යා පීඨය			
ව්‍යවහාරික ඉලෙක්ට්‍රෝනික විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය සෙමෙස්තරය I	7/1/2012	14/1/2012	26 RR
ව්‍යවහාරික ඕගැනික රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය සෙමෙස්තරය I	10/3/2012	25//2/2012	19RR
වායුගෝලීය භෞතිකවිද්‍යාව. ගතික කාලගුණවිද්‍යාව හා ස්වාභාවික ව්‍යසන වෙත සූදානම් බව	18/2/2012	02/03/2012	5RR
ගණිත අධ්‍යාපන විද්‍යාපති උපාධිය සෙමෙස්තරය II	18/3/2012	07/04/2012	20 RR
පැළැටි සෛල හා පටක රෝපණය පිළිබඳ විද්‍යාපති උපාධිය සෙමෙස්තරය I	10/3/2012	31/3/2012	11 RR
ව්‍යවහාරික ඉලෙක්ට්‍රෝනික විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය සෙමෙස්තරය IV	17/3/2012	17/3/2012	19 RR
පාරිසරික විද්‍යා පිළිබඳ විද්‍යාපති උපාධිය	21/4/2012	21/4/2012	14 RR
ව්‍යවාහාරික සංඛ්‍යානය පිළිබඳ විද්‍යාපති උපාධිය සෙමෙස්තරය III	28/4/2012	12/05/2012	25 RR
වායුගෝලීය භෞතිකවිද්‍යාව. ගතික කාලගුණවිද්‍යාව හා ස්වාභාවික ව්‍යසන වෙත සූදානම් බව	2/5/2012	02/05/2012	6 RR
ව්‍යවහාරික ඉලෙක්ට්‍රෝනික විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය සෙමෙස්තරය II	12/5/2012	19/5/2012	24 RR
මූල්‍ය ගණිතය පිළිබඳ විද්‍යාපති උපාධිය සෙමෙස්තරය III	10/6/2012	08/07/2012	36 RR
මූල්‍ය ගණිතය පිළිබඳ විද්‍යාපති උපාධිය නැවත පෙනී සිටීමේ විභාගය	10/6/2012	08/07/2012	4 RR
ව්‍යවාහාරික සංඛ්‍යානය පිළිබඳ විද්‍යාපති උපාධිය සෙමෙස්තරය I	14/7/2012	28/7/2012	33 RR
මූල්‍ය ගණිතය පිළිබඳ විද්‍යාපති උපාධිය සෙමෙස්තරය I	19/8/2012	02/09/2012	31 RNR
මූල්‍ය ගණිතය පිළිබඳ විද්‍යාපති උපාධිය සෙමෙස්තරය I කණ්ඩායම III	5/1/2012	20/1/2013	40 RNR
ගණිත අධ්‍යාපන විද්‍යාපති උපාධිය කණ්ඩායම II	8/12/2012	12/01/2013	29 RNR
ව්‍යවහාරික කාබනික රසායනය පිළිබඳ විද්‍යාපති උපාධිය සෙමෙස්තරය I	8/12/2012	15/12/2012	19 RNR
උපාධි අධ්‍යයන පීඨය			
නිප්පාදන කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - 2011/2012, සෙමෙස්තරය II	25/5/2012	12/05/2012	34 RR
කම්කරු සබඳතා හා මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - 2011/2012, සෙමෙස්තරය I	04/03/2012	11/03/2012	55 RR
කම්කරු සබඳතා හා මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - 2011/2012, සෙමෙස්තරය II	22/09/2012	30/09/2012	52 RNR
කම්කරු සබඳතා හා මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - 2011/2012, සෙමෙස්තරය I, නැවත පෙනී සිටීමේ විභාගය	14/10/2012	15/10/2012	10 RNR

රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - 2011/2012, සෙමෙස්තරය I	11/02/2012	19/02/2012	21 RR
රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - 2011/2012, සෙමෙස්තරය II	04/08/2012	12/08/2012	20 RNR
රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - 2011/2012, සෙමෙස්තරය I	11/02/2012	19/02/2012	16 RR
රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - 2011/2012, සෙමෙස්තරය II	04/08/2012	12/08/2012	11 RNR
පාරිසරික කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - 2012/2013, සෙමෙස්තරය I	10/11/2012	22/12/2012	66 RNR
මානව හිමිකම් පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - 2011/2012, සෙමෙස්තරය I	08/12/2012	15/12/2012	41 RNR
ගැටුම් හා සාම අධ්‍යයන පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - 2008/2009, නැවත පෙනී සිටීමේ විභාගය	11/2/2012	04/03/2012	5 RR
තොරතුරු පද්ධති කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - 2011/2012, සෙමෙස්තරය I	7/1/2012	24/01/2012	99 RR
ජපන් අධ්‍යයන පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - 2011/2012, සෙමෙස්තරය II	21/04/2012	22/04/2012	11 RNR
ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - 2011/2012, සෙමෙස්තරය I	25/02/2012	04/03/2012	77 RR
ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - 2011/2012, සෙමෙස්තරය II	21/07/2012	05/08/2012	72 RNR
ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - එම්. ඉගෙනුම් - mLearning - 2011/2012, සෙමෙස්තරය I	10/3/2012	18/03/2012	51 RR
තොරතුරු පද්ධති කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - 2011/2012, සෙමෙස්තරය II	22/09/2012	30/09/2012	102 RNR
තොරතුරු පද්ධති කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - 2011/2012, සෙමෙස්තරය I (නැවත පෙනී සිටීමේ විභාගය)	13/10/2012	27/10/2012	17 RNR
ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (ජාලගත) සෙමෙස්තරය II 2011/12	20/10/2012	04/11/2012	36 RNR
ගැටුම් හා සාම අධ්‍යයන පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව 2011/2012	8/9/2012	09/12/2021	42 RNR
සංවර්ධන අධ්‍යයන පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව 2012/2013 සෙමෙස්තරය I	22/12/2012	23/12/2012	RNR
නිප්පාදන කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - 2011/2012, සෙමෙස්තරය II	26/05/2012	30/05/2012	29 RNR
ව්‍යාපාර අධ්‍යයන පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - 2010/2011, සෙමෙස්තරය I, II සහ III, නැවත පෙනී සිටීමේ විභාගය	15/05/2012	18/05/2012	27 RR
ව්‍යාපාර අධ්‍යයන පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - 2012/2013, සෙමෙස්තරය I	09/06/2012	17/06/2012	79 RR
කලාපීය සංවර්ධනය හා සැලසුම්කරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - 2010/2011, සෙමෙස්තරය II	21/07/2012	04/08/2012	80 RNR
සංවර්ධන අධ්‍යයන පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - 2011/2012, ලිඛිත විභාගය	11/02/2012	19/02/2012	35RR
ව්‍යාපාර අධ්‍යයන පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - 2012/2013, සෙමෙස්තරය II	25/10/2012	04/11/2012	76 RNR
සංවර්ධන අධ්‍යයන පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - 2011/2012 (නැවත පෙනී සිටීමේ විභාගය) ලිඛිත විභාගය	18/11/2012	16/12/2012	3 RNR

සංවර්ධන අධ්‍යයන පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - 2012/2013	18/11/2012	16/12/2013	38 RNR
කලාපීය සංවර්ධනය හා සැලසුම්කරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය 2012/2013 සෙමෙස්තරය I	1/12/2012	09/12/2012	29 RNR
අලෙවිකරණය පිළිබඳ විධායක ඩිප්ලෝමාව - 2010/2011, සෙමෙස්තරය I	21/1/2012	29/01/2012	18 RR
අලෙවිකරණය පිළිබඳ විධායක ඩිප්ලෝමාව - 2010/2011, සෙමෙස්තරය II	11/08/2012	26/08/2012	14 RNR
අලෙවිකරණය පිළිබඳ විධායක ඩිප්ලෝමාව - එම්. ඉගෙනුම් ඔස්සේ - 2010/2011, සෙමෙස්තරය I, Repeat Exam	21/01/2012	29/01/2012	3 RR
අලෙවිකරණය පිළිබඳ විධායක ඩිප්ලෝමාව - එම්. ඉගෙනුම් ඔස්සේ - 2011/2012, සෙමෙස්තරය I	19/05/2012	26/05/2012	16 RR


RR- ප්‍රතිඵල නිකුත් කර ඇත RNR - ප්‍රතිඵල නිකුත් කර නැත

3.3. කාර්යමණ්ඩල තොරතුරු:


කාර්යමණ්ඩලය විශ්වවිද්‍යාලයේ තදාත්මික ඒකකයක් වන අතර, 2012 වර්ෂයේ දී පූර්ණ කාලීන කාර්ය මණ්ඩලය 1328 දෙනෙකුගෙන් සැදුම් ලද්දේ විය. 2 හා 3 රූප මගින් හා 111-01, 111-02 හා 111 - 03 යන වගුවලින් විශ්වවිද්‍යාලයේ කාර්යමණ්ඩලය පිළිබඳ විශ්ලේෂණයක් ද, කාර්යමණ්ඩල වර්ගීකරණයක් හා රැකියා වර්ගීකරණයක් ද ලබා දේ.

අධ්‍යයන කාර්යමණ්ඩලය	500
පරිපාලන කාර්යමණ්ඩලය	34
අනධ්‍යයන කාර්යමණ්ඩලය	694

රූපය **III**-01
කාර්ය මණ්ඩලය



රූපය **III**-02
අධ්‍යයන කාර්ය මණ්ඩලය



3.4 අධ්‍යයන කාර්යමණ්ඩල තොරතුරු

අංශය	විෂය	මාධ්‍යය	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	මහාචාර්ය	සහාය මහාචාර්ය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I හා II	කථිකාචාර්ය	නාවකාචිය කථිකාචාර්ය	උපදේශක	පර්යේෂණ නිලධාරී	එකතුව
විද්‍යා	ශාක විද්‍යා	ඉංග්‍රීසි	2			8		3			13
	රසායන විද්‍යා	ඉංග්‍රීසි	2	7		9		4			22
	ගණිතය	ඉංග්‍රීසි				13	1	6			20
	සංඛ්‍යානය	ඉංග්‍රීසි		1		7		10			18
	භෞතික විද්‍යාව	ඉංග්‍රීසි		4	3	6		1			14
	න්‍යෂ්ටික විද්‍යාව	ඉංග්‍රීසි	1		1	1		1			4
	සත්ත්ව විද්‍යාව	ඉංග්‍රීසි	1	7		7	2				17
			6	**19**	**4**	**51**	**3**	**25**	**0**		**108**
වෛද්‍ය	කාය ව්‍යවච්ඡේද	ඉංග්‍රීසි	1	1		4	1	1			8
	ජේව රසායන හා අණුක ජීව විද්‍යා	ඉංග්‍රීසි		3		3	1	1			8
	ප්‍රජා වෛද්‍ය විද්‍යා	ඉංග්‍රීසි		2		5	2	1	1		11
	අධිකරණ වෛද්‍ය විද්‍යා	ඉංග්‍රීසි	1	1		3		2			7
	ඝායනික වෛද්‍ය විද්‍යා	ඉංග්‍රීසි	1	4		5	1	2			13
	ක්ෂුද්‍ර ජීව විද්‍යා	ඉංග්‍රීසි	1			2		2			5
	ප්‍රසව හා නාරීවේද	ඉංග්‍රීසි		4	1	1		1			7
	ළමා රෝග	ඉංග්‍රීසි		1		4	1	2	1		9
	පරපෝෂවේද	ඉංග්‍රීසි		2		4		-		1	7
	ව්‍යාධිවේද	ඉංග්‍රීසි		3		3		4			10
	ඖෂධවේද	ඉංග්‍රීසි		2	1	3		3			9
	භෞතවේද	ඉංග්‍රීසි			1	6		1			8
	මනෝ වෛද්‍ය විද්‍යා	ඉංග්‍රීසි		1	1	4	1	2	2		11
	ශල්‍ය වෛද්‍ය විද්‍යා හා නිර්විඳ්දන විද්‍යා	ඉංග්‍රීසි		4		3	1	1			9
	MEDARC	ඉංග්‍රීසි				2		2			4
	වර්යාතමක විද්‍යා	ඉංග්‍රීසි					1				1
	කුටුම්බ වෛද්‍ය විද්‍යා	ඉංග්‍රීසි						2			2
	භෞත චිකිත්සා ඒකකය	ඉංග්‍රීසි						4			4
			4	**28**	**4**	**52**	**9**	**31**	**4**	**1**	**133**
ශාස්ත්‍ර	ආර්ථික විද්‍යා	සිංහල/ඉංග්‍රීසි/දෙමළ		7		11	2	4			24
	ඉංග්‍රීසි	ඉංග්‍රීසි		2		2	1	2			7
	ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් ඒකකය	ඉංග්‍රීසි					3	18	4		25

	ELTU										
	භූගෝල විද්‍යාව	දෙමළ/සිංහල		2	1	7	2	1			13
	ඉතිහාසය	ඉංග්‍රීසි/සිංහල				4		1			5
	ජාත්‍යන්තර සබඳතා	ඉංග්‍රීසි/සිංහල/දෙමළ		1		1		3			5
	දේශපාලන විද්‍යා හා රාජ්‍ය ප්‍රතිපත්ති	ඉංග්‍රීසි/සිංහල/දෙමළ		2		7					9
	සමාජ විද්‍යාව	ඉංග්‍රීසි/සිංහල/දෙමළ	1	1	2	11		5			20
	සිංහල	සිංහල		2		5	1	4			12
	සිංහල/පාලි හා බෞද්ධ අධ්‍යයන	ඉංග්‍රීසි/සිංහල		1		2	1				4
	ප්‍රජා විද්‍යා	ඉංග්‍රීසි/සිංහල	1	2		2	3				8
	ජනමාධ්‍ය ඒකකය	ඉංග්‍රීසි/සිංහල		3							3
	අරාබි හා ඉස්ලාමීය ශිල්පාචාරය	දෙමළ					1	1			2
			2	**23**	**3**	**52**	**14**	**39**	**4**	**0**	**137**
අධ්‍යාපන	අධ්‍යාපන මනෝ විද්‍යාව	සිංහල/ඉංග්‍රීසි		1	2	1	2	2			8
	මානව ශාස්ත්‍ර විද්‍යා	සිංහල/දෙමළ/ඉංග්‍රීසි		1		4					5
	විද්‍යා හා තාක්ෂණික අධ්‍යාපන	ඉංග්‍රීසි/සිංහල				3	2				5
	සමාජ විද්‍යා අධ්‍යාපන	සිංහල/දෙමළ/ඉංග්‍රීසි		1		7	1	1			10
			0	**3**	**2**	**15**	**5**	**3**	**0**	**0**	28
නීති	පුද්ගලික හා තුලනාත්මක නීතිය	සිංහල/දෙමළ/ඉංග්‍රීසි		1		7		1			9
	පොදු හා ජාත්‍යන්තර නීතිය	සිංහල/දෙමළ/ඉංග්‍රීසි				5	2	3			10
	වාණිජ නීතිය	සිංහල/දෙමළ/ඉංග්‍රීසි				4	3	3			10
	පරිගණක තාක්ෂණික උපදේශක								1		1
			0	**1**	**0**	**16**	**5**	**7**	**1**	**0**	**30**
කළමනාකරණ හා මූල්‍ය	ගණකාධිකරණය	ඉංග්‍රීසි				6	1	3			10
	ව්‍යාපාරික ආර්ථික විද්‍යාව	ඉංග්‍රීසි		1		6	1	1			9
	වාණිජ්‍යය හා මූල්‍යය	ඉංග්‍රීසි		1		4		6			11
	මානව සම්පත් කළමනාකරණය	ඉංග්‍රීසි				5	1	4			10
	කළමනාකරණය හා සමාගම් අධ්‍යයනය	ඉංග්‍රීසි			1	7		2			10
	අලෙවිකරණය	ඉංග්‍රීසි				8		2			10

	පරිගණක තාක්ෂණික උපදේශක								2		2
			0	**2**	**1**	**36**	**3**	**18**	**2**	**0**	**62**
	කාර්යමණ්ඩල සංවර්ධන කේන්ද්‍රය	ඉංග්‍රීසි				1					1
	අධ්‍යයන සාමාජික එකතුව		**12**	**76**	**14**	**223**	**39**	**123**	**11**	**1**	**499**
වෛද්‍ය		විද්‍යාත්මක සහායක									**1**
විද්‍යා		විද්‍යාත්මක සහායක									**1**
විද්‍යා		ඉංජිනේරු සහායක ආචාර්ය									**1**
ශාස්ත්‍ර		වැසටහන්කරු/පද්ධති විශ්ලේපක/									**1**
පුස්තකාල	ප්‍රධාන පුස්තකාලය	නියෝජ්‍ය පුස්තකාලයාධිපති									2
	ප්‍රධාන පුස්තකාලය	ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති									3
	ප්‍රධාන පුස්තකාලය	සහකාර පුස්තකාලයාධිපති									**4**
විද්‍යා	විද්‍යා පුස්තකාලය	ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති									**1**
වෛද්‍ය	පුස්තකාල	සහකාර පුස්තකාලයාධිපති									**1**
වෘත්තිය මාර්ගෝපදේශ ඒකකය		වෘත්තිය මාර්ගෝපදේශක									**1**
ශිෂ්‍ය හා කාර්ය මණ්ඩල සුභසාධනය		සහකාර ශිෂ්‍ය අනුශාසක									**1**
ශාරීරික අධ්‍යාපනය		පරිගණක තාක්ෂණ උපදේශක									**2**
වෘත්තිය මාර්ගෝපදේශ ඒකකය		වෘත්තිය උපදේශක									**1**
එකතුව			**12**	**76**	**14**	**222**	**39**	**123**	**11**	**1**	**519**

3.5 අනධ්‍යයන කාර්යමණ්ඩල තොරතුරු:

පීඨය/අංශය	ඉතා ජ්‍යෙෂ්ඨ	ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල	කනිෂ්ඨ කාර්ය මණ්ඩල	සුළු සේවක	එකතුව
වෛද්‍ය පීඨය	34	14	64	72	184
නීති පීඨය	-	2	6	4	12
විද්‍යා පීඨය	15	6	21	47	89
උපාධි අධ්‍යයන පීඨය	2	-	2	2	6
ශාස්ත්‍ර පීඨය	7	3	23	21	54
අධ්‍යාපන පීඨය	2	-	6	5	13
කළමනාකරණ හා මූල්‍ය පීඨය	4	-	10	5	19
විද්‍යාල මන්දිරය	25	10	60	69	164
වෙනත්	16	9	33	81	139
නේවාසිකාගාර	2	6	-	6	14
එකතුව	**107**	**50**	**225**	**312**	**694**

4. පර්යේෂණ හා ප්‍රකාශන පිළිබඳ විස්තර:

ක්ෂේත්‍ර කිහිපයක ම තම ප්‍රතිදානය පුළුල් කරමින් විශ්වවිද්‍යාලය පර්යේෂණ ක්ෂේත්‍රය තුළ තම ප්‍රමුඛත්වය රඳවා ගැනීමට අඛණ්ඩ ව කටයුතු කළේය. පර්යේෂණ සිදුකිරීම සඳහා විශේෂයෙන් ම විද්‍යා අංශයන් පාදක කොට ගත් අධ්‍යයනාංශයන්හි උපකරණ, මෙවලම්, රසායන ද්‍රව්‍ය, මූලික අවශ්‍යතා හා උපයෝගිතා වැනි යටිතල පහසුකම් තිබේ.

සුවිශාල ප්‍රමාණයක පර්යේෂණයන් සිදුකෙරෙමින් පවතින අතර, සමකාලීන ඇගයීම් වාර සඟරා, දේශීය හා විදේශීය වාර සඟරා, සාරාංශ, නිබන්ධ හා පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීම් හා සන්නිවේදන මීට අයත් වේ. මේ පිළිබඳ වැඩි විස්තර පහත ලබා දී තිබේ.

විෂයය	**ප්‍රකාශිත**	**වෙළඳපොළට ඉදිරිපත් කරනලද**	**ඉදිරිපත් කරනලද**
අ. පර්යේෂණ සංඛ්‍යාව	52		52
ආ. නව්‍යජනන සංඛ්‍යාව			
ඇ. වාර සඟරා සංඛ්‍යාව	24		6
ඈ. ග්‍රන්ථ සංඛ්‍යාව	48	**02**	10
ඉ. ලිපිලේඛන සංඛ්‍යාව	103		33
ඊ. වෙනත්	76		5
එකතුව	303	**02**	106

අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයන්හට තරගකාරී ඉල්ලුම් ක්‍රමවේද මගින් ලැබෙන රාජ්‍ය හා විදේශීය ප්‍රතිපාදන ඇත

UDG, QIG, HRD සහ EDP ප්‍රතිපාදන ඇතුළු විසිඑක් වන සියවසේ උසස් අධ්‍යාපනය ප්‍රතිපාදන 7ක් (HETC) විශ්වවිද්‍යාලය විසින් ලබා ගන්නා ලදී.

තවද, පර්යේෂණ ප්‍රදානයක් ලෙස රුපියල් මිලියන 5ක මුදලක් මහා භාණ්ඩාගාරයෙන් විශ්වවිද්‍යාලය වෙත ලැබිණ. විශ්වවිද්‍යාලය විසින් පශ්චාත් උපාධි පර්යේෂණ ශිෂ්‍යත්ව, සහයෝගිතා පර්යේෂණ ප්‍රදාන හා යටිතල පහසුකම් සංවර්ධන ප්‍රදාන සහ විශ්වවිද්‍යාලයීය හා පීඨයන්හි පර්යේෂණ ප්‍රවර්ධන ක්‍රියාකාරකම් වෙනුවෙන් ප්‍රදානය කිරීම් සඳහා අදාළ අරමුදල් භාවිත කරන ලදී.

2012 අගෝස්තු 16 දින කොළඹ විශ්වවිද්‍යාලයීය සභාතන සභා ශාලාවේ දී, "අභිසාරී තාක්ෂණයන් හා නිරතුරු පවත්නා ප්‍රජාවන්" යන තේමාව යටතේ විශ්වවිද්‍යාලයීය වාර්ෂික පර්යේෂණ පරිසංවාදය සාර්ථක ලෙස පැවැත්වුණි. ජාත්‍යන්තර අධිකරණයේ හිටපු උප සභාපති සහ ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ගරු මහාචාර්ය විනිසුරු සී. ජී. වීරමන්ත්‍රී විසින් ප්‍රධාන දේශනය සිදුකරන ලදී. සිංගප්පුරුවේ ජාතික විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ පීඨාධිපති මහාචාර්ය සිමොන් වෙස්ටර්මන්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාවේ උප සභාපති මහාචාර්ය රංජිත් සේනාරත්න, සහ මොබිටෙල් ශ්‍රී ලංකා පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂ ජානක ජයලත් මහතා විසින් ආරාධිත දේශන ඉදිරිපත් කරන ලදී.

පීඨ විසින් තම තම පීඨයට අදාළ පර්යේෂණ පරිසංවාදයන් වෙන වෙනම පවත්වන ලද අතර, ඒවායේ දී පර්යේෂණ පත්‍රිකා රැසක් ඉදිරිපත් කරන ලදී.

විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන.

"විශ්වවිද්‍යාල සයක් (06) ජාත්‍යන්තර තලයට ගෙන එම" යන උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන වැඩසටහන යටතේ අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයින් තිස් (30) දෙනෙකු වෙත පශ්චාත් උපාධි පර්යේෂණ ශිෂ්‍යත්ව, සහයෝගිතා පර්යේෂණ ප්‍රදාන හා යටිතල පහසුකම් සංවර්ධන ප්‍රතිපාදන ප්‍රදානය කරන ලදී.

පර්යේෂණ සැසි

සමාලෝචිත වර්ෂය තුළ, කළමනාකරණ හා මූල්‍ය පීඨය කළමනාකරණය හා මූල්‍යය පිළිබඳ තම 7 වන ජාත්‍යන්තර පර්යේෂණ සම්මේලනය 2012-12-14 වන දින සාර්ථක ලෙස පීඨය විසින් සංවිධානය කර තිබුණි. ආචාර්ය ඩී. ටී. ඩී. කෝදාගොඩ හා ආචාර්ය එච්. එම්. එන්. පද්මසිරි විසින් සම්මේලනයේ සම සභාපතිත්වය දරන ලද අතර, දේශීය ලේඛකයනට තම ජාත්‍යන්තර සමකාලීනයන් හමු වීමට හා අන්‍යෝන්‍ය වශයෙන් ඵලදායී රාමුවක් තුළ තම පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීමට හා විවාදයට ලක් කිරීමට සුවිශේෂී වේදිකාවක් මෙමගින් නිර්මාණය විය.

ශාස්ත්‍ර පීඨයේ ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය විසින් ද තම ප්‍රථම වාර්ෂික ජාත්‍යන්තර සම්මන්ත්‍රණය - විශ්වවිද්‍යාලයීය ආර්ථික විද්‍යාඥයන්ගේ ශ්‍රී ලංකා සැසියෙහි ශ්‍රී ලංකා ආර්ථික පර්යේෂණ සම්මන්ත්‍රණය 2012 නොවැම්බර් මස 30 වන දා පවත්වන්නට යෙදුණි.

ශාස්ත්‍ර පීඨයේ සිංහල අධ්‍යයනාංශයේ දෙවන වාර්ෂික පර්යේෂණ පරිසංවාදය 2012 දෙසැම්බර් මස 10 වන දා එම්. බී. ආරියපාල ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදී. ශ්‍රී ලංකාවේ සියලුම විශ්වවිද්‍යාල නියෝජනය කරමින්, විද්වතුන් කිහිප දෙනෙක් විසින් "සිංහල අධ්‍යයනයේ නව ප්‍රවණතා" යන පොදු තේමාව යටතේ අධ්‍යයන පත්‍රිකා ඉදිරිපත් කරන ලදී.

කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨ වාර්ෂික පර්යේෂණ පරිසංවාද සැසි නව ගොඩනැගිල්ලේ දේශනාගාරයේ දී සාර්ථක ලෙස 2012 අගෝස්තු මස 16 වන දින පවත්වන ලදී. කොළඹ විශ්වවිද්‍යාලයීය පරිසංවාද හා සමගාමීව මෙම අවස්ථාව සංවිධාන කරන ලදී. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ හිටපු උප කුලපති හා ළමා රෝග පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ආචාර්ය නාරද වර්ණසූරිය ප්‍රධාන අමුත්තා වශයෙන් මෙම අවස්ථාව හෙබවීය. විද්‍යාත්මක වැඩසටහන ඉතා ඉහළ මට්ටමක වූ අතර, කෘෂිකාර්මික ජීව විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය හා කෘෂිකර්ම පශ්චාත් උපාධි අධ්‍යයනායතනයේ අධ්‍යක්ෂ මහාචාර්ය අතුල පෙරේරා සහ සරේ විශ්වවිද්‍යාලයේ උසස් තාක්ෂණික ආයතනයේ (ATI)හි නැනෝ ඉලෙක්ට්‍රොනික කේන්ද්‍රයේ ප්‍රධානී, උසස් තාක්ෂණික ආයතනයේ අධ්‍යක්ෂ මහාචාර්ය රවි සිල්වා වැනි වියත් ආරාධිත අමුත්තන්ගේ දේශන ද ඇතුළත් විය.

ප්‍රජා සෞඛ්‍ය ක්ෂේත්‍රය හා ඊට සම්බන්ධ වෛද්‍ය විශේෂඥතා ද එසේම ඊට අනුබද්ධිත සෞඛ්‍ය වෘත්තීන් ද සමග සම්බන්ධ ලොවෙහි අති දක්ෂයින්ගේ සහභාගීත්වයෙන් යුතුව 2012 ඔක්තෝබර් 13 වන දා සිට 18 වන දා දක්වා ප්‍රජා සෞඛ්‍යය පිළිබඳ 44 වන ආසියා පැසිෆික් විද්වත් සමූඵව (APACPH) වෛද්‍ය පීඨයේ සත්කාරයෙන් යුතුව පවත්වන ලදී. විශ්වවිද්‍යාලයීය සභාපති රැස්වීම කොළඹ විශ්වවිද්‍යාලයීය සභාතන සභා ශාලාවේ දී පවත්වන ලද අතර, එම අති උත්කර්ෂවත් අවස්ථාවෙහි මූලසුන ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයේ උපකුලපතිනිය විසින් හොබවන ලදී. ආසියා පැසිෆික් කලාපයේ ප්‍රමුඛ විශ්වවිද්‍යාලයන්ගේ සභාපතිවරුන්, උප සභාපතිවරුන්, උප කුලපතිවරුන් හා පීඨාධිපතිවරුන් 43 දෙනෙක් ඊට සහභාගී වූහ.

2012 නොවැම්බර් මස 17 හා 18 යන දෙදින තුළ කොළඹ විශ්වවිද්‍යාලයීය සභාතන සභා ශාලාවේ දී, සාකල්‍ය වෛද්‍ය විද්‍යාව පිළිබඳ 3 වන ජාත්‍යන්තර සම්මන්ත්‍රණය පවත්වන ලද අතර, එම ක්ෂේත්‍රයේ ලොව ප්‍රමුඛ විද්වතුන් කිහිප දෙනෙක් ද ඊට සහභාගී වූහ. සම්මන්ත්‍රණය සමාරම්භය නොවැම්බර් 17 වන දින උසස් අධ්‍යාපන අමාත්‍ය, ගරු එස්. බී. දිසානායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත් වූ අතර, ආසියානු සංවර්ධන බැංකුවේ මෙරට අධ්‍යක්ෂ රීටා ම' සලිවන් මෙම අවස්ථාවට සහභාගී වූවාය. ඔස්ට්‍රේලියාවේ ක්වින්ස්ලන්ත විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ජාත්‍යන්තර උපාධි පර්යේෂණ අධ්‍යක්ෂ මහාචාර්ය අකුම් තාපී; කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ මහාචාර්ය වසන්ත ගුණතුංග, හනෙමේනියානු හෝමියෝපති (Hahnemannian Homoeopathy) පිළිබඳ ඔස්ට්‍රේලියානු විද්‍යාලයේ නිර්මාතෘ සහ රජරට විශ්වවිද්‍යාලයේ වෛද්‍ය හා අනුබද්ධ විද්‍යා පීඨයේ වෛද්‍ය සේනක පිළපිටිය යන විද්වතුන් විසින් ප්‍රධාන දේශන පවත්වන ලදී. නේපාලයේ කත්මන්ඩු නුවර 2012 දෙසැම්බර් මස 17 වන දින සිට 22 වන දා දක්වා පවත්වන ලද දකුණු ආසියානු ශිෂ්‍ය තරග සඳහා ආර්ථික විද්‍යා අධ්‍යයනාංශ සිසුනු ද සහභාගී වූහ.

හිටපු ඉන්දීය ජනාධිපති ආචාර්ය අබ්දුල් කලාම් විසින් "අධ්‍යාපන ගතිකත්ව හා ශිෂ්ටාචාරයේ ඒකාග්‍රතාව" පිළිබඳ දේශනයක් පවත්වන ලදී.

4.1 ලැබූ ත්‍යාග පිළිබඳ තොරතුරු

කාන්තාවන් සඳහා වන ජාත්‍යන්තර සන්දානය (TIAW) විසින් 'වෙනස් ඔවෙහි ලොවක් සම්මාන 2012' සඳහා ලොව වටා සුවිශේෂී කාන්තාවන් 100 දෙනෙකු අතුරින් එක් අයෙකු ලෙස විශ්වවිද්‍යාලයේ උපකුලපතිනිය මහාචාර්ය ක්ෂණිකා හිරිඹුරේගම තෝරා ගනිමින් සම්භාවනාවට පාත්‍ර කරනු ලැබුවාය.

පශ්චාත් උපාධි ප්‍රදානෝත්සවයේ දී, විද්‍යා පීඨයේ මහාචාර්ය ඩබ්. ඩී. රත්නසූරිය, වෛද්‍ය පීඨයේ මහාචාර්ය සේනක රාජපක්ෂ සහ කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක පාසලේ ආචාර්ය කේ. පී. හේවාගමගේ යන විද්වතුන් වෙත කොළඹ විශ්වවිද්‍යාලයීය පර්යේෂණ සම්මාන පිළිගන්වන ලදී.

කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ වෛද්‍ය චතුරිකා රුද්‍රිගු වෙත 4 වන CVCD විශිෂ්ඨත්වයේ ත්‍යාග ප්‍රදානෝත්සවයේ දී සෞඛ්‍ය විද්‍යාවන්හි විශිෂ්ටතම තරුණ පර්යේෂකයාට හිමි CVCD ත්‍යාගය හිමි වන ලදී.

2012 - 2016 දක්වා කාලය සඳහා වෛද්‍ය පීඨ සාරධර්ම ඇගයීම් කමිටුව සඳහා SIDCER/FERCAP පිළිගැනීම් සහතිකය නැවත ලබා ඇත. කලාපයේ නොයෙකුත් කමිටු නියෝජනය කරමින් සපැමිණි ERC සාමාජිකයන් හා FERCAP සභාපතිනිය ආචාර්ය කෙන්පී හිරයාමා අභිමුවදී 2012 නොවැම්බර් 21 වන දා කොළඹ දී පවත්වන ලද FERCAP හි 12 වන මහා සභාවේ දී එම සම්මානය පිරිනමන ලදී.

කේ-12 සහ ලෝක අධ්‍යාපනය සඳහා විවෘත හා දුරස්ථ අධ්‍යාපනයෙහි නොදම නව්‍යජනනයෙහි නොදම පියවර සඳහා වන ත්‍යාගය කොළඹ විශ්වවිද්‍යාලයේ කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය වෙත 2012 ජූලි මස 23 සිට 24 තෙක් නව දිල්ලියේ ලෙ මෙරිඩියන් හෝටලයේ දී පැවති 2012 ලෝක අධ්‍යාපන සමූඵවෙහි දී ප්‍රදානය කරන ලදී.

ආසියාවේ දෙවන නොදම ව්‍යාපාර පාසලට හිමි නායකත්ව සම්මානය උපාධි අධ්‍යයන පීඨය වෙත දෙවන වරට ද ප්‍රදානය කරන ලදී.

නීති පීඨයේ පොදු හා ජාත්‍යන්තර නීති අධ්‍යයනාංශයේ අංශ ප්‍රධානී ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පීවා නිරිඇල්ල මහත්මිය විසින් නීති අංශයෙන්, *කළමනාකරණයේ කාන්තාවන්* විසින් සංවිධාන කරන ලද 2011/2012 වෘත්තික හා වෘත්තීන්හි නියැලී කාන්තාවන් සඳහා වන ත්‍යාගය දිනා ගන්නා ලදී.

5. ශිෂ්‍ය හා කාර්යමණ්ඩල සුභසාධනය

මූල්‍ය සහාය

ශිෂ්‍යාධාර හා මහපොළ ශිෂ්‍යත්ව ලෙසින් සිසුන්ට මූල්‍යාධාර සලසන ලදී. ඒ ටී එම් මගින් සියලු පීඨ සඳහා මෙම ගෙවීම් සිදුකරන ලදී.

මහපොළ ශිෂ්‍යත්ව

2012 වර්ෂයේ දී නවක සිසුන් හා ජ්‍යෙෂ්ඨ සිසුන් වෙත (මසකට එක් සිසුවෙකුට විශ්වවිද්‍යාල රු. 350/- බැගින් විශ්වවි දායකත්වය) මහපොළ ශිෂ්‍යත්ව ලබා දුන් ආකාරය පහත පරිදි වේ.

වගුව III-01 : මහපොළ ශිෂ්‍යත්වලාභීහු
(මාසය හා පීඨය අනුව වර්ගීකරණය කර ඇත)

මහපොළලාභීන් වෙත මුළු විශ්වවිද්‍යාල දායකත්වය (350/-)								
2012	**සිසුන් සංඛ්‍යාව**	**ශාස්ත්‍ර**	**නීති**	**කළ. හා මූල්‍ය**	**විද්‍යා**	**වෛද්‍ය**	**ගෞතවේද**	**එකතුව රු.**
ජනවාරි	3,914	423,150.00	222,950.00	283,500.00	204,050.00	249,900.00	24,500.00	1,408,050.00
පෙබරවාරි	3,940	431,900.00	216,650.00	282,800.00	173,250.00	249,900.00	24,500.00	1,379,000.00
මාර්තු	3,770	430,850.00	216,650.00	284,200.00	174,300.00	189,700.00	24,500.00	1,320,200.00
අප්‍රේල්	**තිවාඩු කාලය**							
මැයි	3,758	431,900.00	213,850.00	280,350.00	175,000.00	189,700.00	24,500.00	1,315,300.00
ජූනි	3,761	427,700.00	215,250.00	278,600.00	180,950.00	189,700.00	24,150.00	1,316,350.00
ජූලි	3,759	427,000.00	356,650.00	287,000.00	174,650.00	189,700.00	20,650.00	1,455,650.00
අගෝස්තු *	601	-	-	-	-	189,700.00	20,650.00	210,350.00
සැප්තැම්බර්	0	-	-	-	-	-	-	-
ඔක්තෝබර්	3,572	661,150.00	145,250.00	291,900.00	175,000.00	189,700.00	20,650.00	1,483,650.00
(නිග සමග)	1,376	827,750.00	453,600.00	606,900.00	371,000.00	390,600.00	-	2,649,850.00
නොවැම්බර්	3,855	326,900.00	212,800.00	286,300.00	245,350.00	254,800.00	41,650.00	1,367,800.00
දෙසැම්බර්								
	32,306	4,388,300.00	2,253,650.00	2,881,550.00	1,873,550.00	2,283,400.00	225,750.00	**13,906,200.00**

මහපොළ භාරකාර අරමුදලින් රුපියල් 2,200/-ක් හෝ රුපියල් 2,150/-ක් පිළිවෙලින් කුසලතා හෝ සාමාන්‍ය ශිෂ්‍යත්වය ලෙස ශිෂ්‍යයෙක් ලබයි. ඊට අමතර ව. විශ්වවිද්‍යාලය විසින් රුපියල් 350/-ක මුදලක් ශිෂ්‍යයෙකු හට ගෙවනු ලැබේ. ඒ අනුව. කුසලතා හෝ සාමාන්‍ය වශයෙන් සිසුවෙකු මසකට පිළිවෙලින් රු. 2,550/-ක් හෝ රු. 2,500/-ක මුදලක් ලබයි.

ශිෂ්‍යාධාර

සම්පූර්ණ ශිෂ්‍යාධාරය හා අර්ධ ශිෂ්‍යාධාරය ලෙස සිසුවෙකුට රු. 2,000/-ක් හෝ රු. 1,900/-ක් ගෙවනු ලැබේ. 2012 වසරේ දී පහත ප්‍රථම උපාධි අපේක්ෂකයන්ට ශිෂ්‍යාධාර ලබා දෙන ලදී.

වගුව III-02 : ශිෂ්‍යාධාර
(මාසය හා පීඨය අනුව වර්ගීකරණය කර ඇත)

ශිෂ්‍යාධාර ලෙස ගෙවූ මුළු මුදල							
2012	ශිෂ්‍ය සංඛ්‍යාව	ශාස්ත්‍ර හා අධ්‍යාපන	නීති	කළ. හා මූල්‍ය	වෛද්‍ය	වෛද්‍ය හා භෞතවිකිත්සක විද	එකතුව රු.
ජනවාරි	615	282,300.00	307,600.00	513,400.00	89,700.00	21,400.00	1,214,400.00
පෙබරවාරි	708	278,300.00	307,600.00	550,700.00	290,700.00	162,000.00	1,589,300.00
මාර්තු	1,157	2,771,600.00	367,300.00	613,000.00	205,900.00	95,600.00	4,053,400.00
අප්‍රේල්	නිවාඩු කාලය						
මැයි	1,190	1,243,800.00	337,200.00	601,000.00	236,100.00	150,000.00	2,568,100.00
ජූනි	1,189	1,152,500.00	337500.00	569,900.00	204,100.00	107,300.00	2,371,300.00
ජූලි	1,186	1,144,900.00	319,500.00	560,400.00	204,100.00	113,000.00	2,341,900.00
අගෝස්තු	8	වෘත්තීය සමිති වැඩ වර්ජනය				15,500.00	15,500.00
සැප්තැම්බර්	9	වෘත්තීය සමිති වැඩ වර්ජනය				17,400.00	17,400.00
ඔක්තෝබර්	276	335,400.00	23,600.00	79,000.00	143,200.00	17,400.00	598,600.00
නොවැම්බර්	271	465,400.00	-	131,100.00	124,400.00	29,200.00	750,100.00
දෙසැම්බර්							
එකතුව	6,609	7,674,200.00	2,000,300.00	3,618,500.00	1,498,200.00	728,800.00	15,520,000.00

විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය සංගම්

ශිෂ්‍ය අනුශාසක නිලවරණ අධ්‍යයන වසර අවසානයේ දී පැවැත්විය යුතු බවට වූ CVCD යෝජනාවන්ට එකඟ වන ලදී. වෛද්‍ය හා විද්‍යා පීඨ විසින් තම පීඨ ශිෂ්‍ය සංගම් නිලවරණ පවත්වා අවසන් කරන ලද අතර අනෙකුත් පීඨ විසින් නිලවරණ පවත්වා නොමැත.

ශිෂ්‍ය සංගම්
1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 115 හා 116 යන වගන්ති ප්‍රකාර, පාලක සභාවේ සම්මුතිය සමඟ ශිෂ්‍ය සංගම් හා වෙනත් සමිති පිළිගැනීම සිදු වනු ඇත. සමාලෝචිත වසර තුළ ශිෂ්‍ය විශ්වවිද්‍යාලයෙහි සංගම් හා වෙනත් සමිති විසි හයක් (26) ක් ක්‍රියාත්මක විය.

ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන් සඳහා නේවාසිකාගාර ලබා දීම්

දැනට, විශ්වවිද්‍යාලය සතුව ස්ථිර නේවාසිකාගාර හතක් (7) ද, තාවකාලික පෞද්ගලික අයිතිය ඇති නිවාස තුනක් (3) ද පවතින අතර වසර තුළ දී විශ්වවිද්‍යාලය විසින් ඒවායේ නේවාසිකාගාර පහසුකම් ලබා දී ඇති ශිෂ්‍ය සංඛ්‍යාවන්, වගුව III-03 සහ III-04 හි දැක්වේ. නේවාසිකාගාර ලෙස කුලියට ගෙන කිරුළපනයේ හා රාජගිරියේ භාවිත කරමින් තිබූ නිවාස දෙකක් 2012 ජූලි මස 31 වන දා නැවත භාර දෙන ලදී.

වගුව III-03 : විශ්වවිද්‍යාල නේවාසිකාගාරයන්හි ශිෂ්‍ය නේවාසික පහසුකම් 2012
(පීඨය හා නේවාසිකාගාරය අනුව වර්ගීකරණය කර ඇත)

පීඨය නේවාසිකාගාරය	ශාස්ත්‍ර	නීති	කළ. හා මූල්‍ය	වෛද්‍ය	විද්‍යා	භෞත විකිත්සකවේද	එකතුව
බ්ලොම්ෆොන්ටේන් පිරිමි	-	-	-	362	-	-	**362**
බුලර්ස් කාන්තා	292	118	28	-	0	-	**438**
ද සේරම් කාන්තා	-	-	-	250	-	-	**250**
ද සේරම් කාන්තා (නව)	158	52	51	-	47	-	**308**
හැවිලොක් කාන්තා	297	38	17	-	102	22	**476**
කිත්යාකර පිරිමි	159	26	132	-	49	-	**366**
මුත්තයියා කාන්තා	402	54	93	-	0	-	**549**
තෙළවල පිරිමි	**නවීකරණය කෙරෙමින් පවතී**						
එකතුව	**1308**	**288**	**321**	**612**	**198**	**22**	**2749**

වගුව III-04 : කුලියට ගත් ගොඩනැගිලි තුළ ශිෂ්‍ය නේවාසික පහසුකම් 2012
(පීඨය හා නේවාසිකාගාරය අනුව වර්ගීකරණය කර ඇත)

පීඨය නේවාසිකාගාරය	ශාස්ත්‍ර	නීති	කළ. හා මූල්‍ය	භෞත විකිත්සකවේද	විද්‍යා	එකතුව
ග්‍රීන් පාත්, කොළඹ 07 (හිඤ්ජු)	30	1	0	0	0	**31**
මහරගම, නාවින්න (කාන්තා)	43	32	06	0	0	**81**
බොරලැස්ගමුව නිවස (කාන්තා)	9	0	2	46	0	**57**
එකතුව	**82**	**33**	**8**	**46**	**0**	**169**

නේවාසිකාගාරය	නේවාසික සිසුන්	විදුලිය (රු.)	ජලය (රු.)	දුරකථන (රු.)
බුලර්ස් කාන්තා	438	1,118,492.90	1,004,903.65	25,003.81
මුත්තයියා කාන්තා	549	1,194,329.43	1,098,785.68	30,723.60
හැව්ලොක් කාන්තා	476	1,341,470.68	1,165,762.34	17,077.85
ද සේරම් කාන්තා	250	1,069,912.18	1,227,364.48	28,472.91
ද සේරම් කාන්තා (නව)	308	687,954.04	732,014.96	4,768.10
තෙලවල පිරිමි [1]	-	53,599.52	-	-
කිත්යාකර පිරිමි	366	865,138.53	1,223,009.02	22,119.83
බ්ලොම්ෆොන්ටේන් පිරිමි	362	2,171,667.88	1,074,535.99	26,655.72
71/3. ග්‍රීන් පාත් }	31	226,897.07	113,169.20	4,224.50
71/4. ග්‍රීන් පාත් }		64,897.02	121,123.30	
නාවින්න	81	86,321.26	135,180.72	20,912.30
කිරුළපන	-	-	-	-
රාජගිරිය	-	-	-	-
බොරලැස්ගමුව	57	105,376.84	157,065.65	3,801.85

විශ්වවිද්‍යාලයීය නේවාසිකාගාරයන්හි උපාධි අපේක්ෂක සිසුන් 2749 දෙනෙකුට නේවාසික පහසුකම් ලබා දෙන ලද අතර, ශිෂ්‍යයන් 169 දෙනෙකුට කුලියට ගත් නිවාසයන්හි නේවාසික පහසුව ලබා දෙන ලදි. ඒ අනුව, විශ්වවිද්‍යාලය විසින් සිසුන් 2918 දෙනෙකුට නේවාසික පහසුකම් ලබා දී ඇත.

වගුව III-05: නේවාසිකාගාර හා නිවෙස් හි ශිෂ්‍යයන්ගේ පොදු පහසුකම් පරිහෝජනය 2012

(නිවෙස්හි රැඳී සිටි සිසුන් හා පරිහෝජන වියදම් මත වර්ගීකරණය කර ඇත) [1] *නවීකරණයට ලක් කෙරෙමින් පවතී*

*පොදු පහසුකම් පිළිබඳ සියලු වියදම් **2012 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා පමණක්** වන බැවි කරුණාවෙන් සලකන්න.*

වගුව III-06: ශිෂ්‍ය නිවෙස්හි වාර්ෂික කුලිය - 2012

නේවාසිකාගාර	වාර්ෂික කුලිය (රු.)
71/3, ග්‍රීන් පාත් }	2,460,000.00
71/4, ග්‍රීන් පාත් }	
නාවින්න	1,500,000.00
කිරුළපන	857,430.00
රාජගිරිය	490,000.00
බොරලැස්ගමුව	1,740,000.00

සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය

2012 වසර සඳහා සෞඛ්‍ය සුභසාධන ක්‍රමය 2012-03-01 දින සිට ක්‍රියාත්මක වන පරිදි එක් වසරක කාලයක් සඳහා ස්ථාපනය කරන ලදී. එහි රක්ෂණ ක්‍රම දෙකක් (ක්‍රමය I හා ක්‍රමය II වශයෙන්) හා තවත් බොහෝ ප්‍රතිලාභ සහිත විය.

	ක්‍රමය I	ක්‍රමය II
බාහිර	5,000/-	10,000/-
අභ්‍යන්තර	60,000/-	120,000/-
උපැස්	3,000/-	5,000/-

දිවා සුරුකුම් මධ්‍යස්ථානය

2006.05.18 දින කොළඹ විශ්වවිද්‍යාලයේ සේවකයින්ගේ වයස අවුරුදු 2 1/2 ත් 12ත් අතර දරුවන් සඳහා කොළඹ විශ්වවිද්‍යාලය විසින් දිවා සුරුකුම් මධ්‍යස්ථානයක් ස්ථාපනය කරන ලදී. එය බාහිර දරුවන් වෙනුවෙන් ද 2007 සිට විවෘත ව ඇත.

6. කොළඹ විශ්වවිද්‍යාලයීය ජාත්‍යන්තර ඒකකය

1. දර්ශනය

ඉහළ තත්ත්වයේ ඉගැන්වීම් හා පර්යේෂණ ඔස්සේ දැනුම නිප්පාදනයෙහි ගෝලීය වශයෙන් ක්‍රියාකාරී වූ ඒකකයක් වශයෙන් එලඹීම සඳහා, අධ්‍යාපනික උත්කෘෂ්ටත්වයෙහි ජාත්‍යන්තර කීර්තිය දරන කේන්ද්‍ර සමග ප්‍රබල සම්බන්ධතා ගොඩනගා ගැනීම කෙරෙහි කොළඹ විශ්වවිද්‍යාලය සතු දැඩි කැපවීම එහි දර්ශනයයි. 2008 වසරෙහි දී ස්ථාපනය වූ, කොළඹ විශ්වවිද්‍යාලයීය ජාත්‍යන්තර ඒකකය, කොළඹ විශ්වවිද්‍යාලයෙහි ජාත්‍යන්තර සබඳතා ස්ථාපනය කිරීමටත් ඒවා වර්ධනය කිරීමටත් ක්‍රියාකරන අතර, කොළඹ විශ්වවිද්‍යාලය පිළිබඳ තොරතුරු යථා කාලයේ දී ප්‍රයෝජනවත් විය හැකි අනෙකුත් සහකාර විශ්වවිද්‍යාලයන් වෙත එකී තොරතුරු ලබා දීමත්, ශිෂ්‍ය නුවමාරු හා කාර්ය මණ්ඩල සංචලනා වැඩසටහන් කෙරෙහි පහසුකම් සැලසීමත් එසේ ම, සම්මන්ත්‍රණ, සමූළු, වැඩමුළු හා ජාත්‍යන්තර සහකරුවන් සමග බද්ධ පර්යේෂණ සඳහා පහසුකම් ලබා දීමත් සිදු කරනු ලබයි.

2. මෙහෙවර

කොළඹ විශ්වවිද්‍යාලයීය ජාත්‍යන්තර ඒකකය ස්ථාපනය කෙරුණේ කොළඹ විශ්වවිද්‍යාලයීය ජාත්‍යන්තර සබඳතා සඳහා පහසුකම් සැලසීමත් පැමිණිය හැකි ජාත්‍යන්තර සිසුන් හට කොළඹ විශ්වවිද්‍යාලය පිළිබඳ තොරතුරු ලබා දීමටත්, පිඨ සමග සම්බන්ධීකරණයටත්, එසේ ම කොළඹ විශ්වවිද්‍යාලය සමග අනුබද්ධව ඇති විදේශීය අධ්‍යයන සාමාජිකයන් හා සිසුන් හට ඔවුන් මෙරට වාසය කරන කාල සීමාව තුළ ඔවුන්හට උපකාර කිරීමටත් ය.

2008 වසරේ දී IUUC ආරම්භ කළ දා පටන් ම, කොළඹ විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර සම්බන්ධතා ප්‍රවර්ධනයෙහි ලා IUUC මනෝපකාරී විය. IUUC සතුව වර්තමානයේ දී සාර්ථක ශිෂ්‍ය නුවමාරු හා කාර්යමණ්ඩල සංචරන වැඩසටහන් බොහොමයක් මෙන් ම, යුරෝපා සංගමයේ ඉරාමුස් මුන්ඩස් ශිෂ්‍යත්ව යෝජනාක්‍රමය සබැඳි සාර්ථක ශිෂ්‍යත්ව වැඩසටහන් බොහොමයක් ද වේ.

IUUC හි අරමුණු:

කොළඹ විශ්වවිද්‍යාලය හා බද්ධ විශ්වවිද්‍යාල/අධ්‍යයනායතන අතර සහයෝගිතා පර්යේෂණ හා නව්‍යජනන සඳහා පර්යේෂණ ප්‍රවර්ධනය.

1. විදේශයක අධ්‍යාපනය ලැබීමේ නව වැඩසටහන් ස්ථාපනය කිරීම හා පවත්නා සහයෝගිතාවන් වර්ධනය
2. කොළඹ විශ්වවිද්‍යාලයීය අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා විදේශයන්හි පශ්චාත් උපාධි අවස්ථා නිර්මාණය හා ආයතනික සම්බන්ධතා හා අධ්‍යයන කාර්යමණ්ඩල නුවමාරු ඔස්සේ විපයමාලා සංවර්ධනය
3. පශ්චාත් උපාධි සිසුන් සඳහා ඒ- ඉගෙනුම් හා දුරස්ථ ඉගෙනීම් වැඩසටහන් සවිමත් කිරීම හා තොරතුරු තාක්ෂණ සංවර්ධනය
4. සම්බද්ධ විශ්වවිද්‍යාල සමග බද්ධ සම්මන්ත්‍රණ, සමූළු හා වැඩමුළු සංවිධානය
5. බද්ධ අධ්‍යයනායතන සමග එක්ව, ප්‍රථම උපාධි හා පශ්චාත් උපාධි සිසුන් සඳහා නව පර්යේෂණ අවස්ථා ස්ථාපනය කිරීම හා පවත්නා පර්යේෂණ ජාලයන් සවිමත් කිරීම

ඉහත කී අරමුණු අනුව යමින් 2012 වසරේ දී IUUC විසින් ක්‍රියාකාරකම් රැසකම යෙදුන අතර, විදේශයන්හි විශ්වවිද්‍යාල හා අධ්‍යයනායතන සමග නව සබඳතා ගොඩ නැගිය.

<u>ජාත්‍යන්තර විශ්වවිද්‍යාල හා පර්යේෂණ ආයතන සමග සහයෝගිතා</u>

- **ක්වීන්ස්ලන්ඩ් තාක්ෂණික විශ්වවිද්‍යාලය (QUT), ඔස්ට්‍රේලියාව**

2012 නොවැම්බර් මස දී කොළඹ විශ්වවිද්‍යාලය විසින් ක්වීන්ස්ලන්ඩ් තාක්ෂණික විශ්වවිද්‍යාලය සමග විශ්වවිද්‍යාල දෙපාර්ශ්වයට ම වැදගත් ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් සබඳතා ප්‍රවර්ධනය සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. ඔස්ට්‍රේලියාවේ QUT හි ජාත්‍යන්තර උපාධි පර්යේෂණ ආයතනයෙහි අධ්‍යක්ෂ වන මහාචාර්ය අකුම් තාපිගේ සංචාරයෙන් පසු මෙම ගිවිසුමට අත්සන් කිරීම සිදු විය. මෙම අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමත් සමග ම ඔස්ට්‍රේලියාවේ QUT හා කොළඹ විශ්වවිද්‍යාලය අතර දීර්ඝ කාලීන සබඳතා විධිමත් විය.

ගිවිසුම යටතේ ප්‍රධාන අංග ලෙස ශිෂ්‍ය හා කාර්යමණ්ඩල හුවමාරු, පර්යේෂණ සහයෝගිතාවන්, හා දර්ශන සූරි ඒකාබද්ධ අධීක්ෂණ හඳුනා ගන්නා ලදී. QUT හි ආචාර්ය ටෝනි සහාමා විසින් 2012 දෙසැම්බර් මස 28 වන දා කොළඹ විශ්වවිද්‍යාලයේ දී 'පර්යේෂණ සහයෝගිතාවන් හා උසස් උපාධි පර්යේෂණ (HDR) අවස්ථා' පිළිබඳ දැනුවත් කිරීමේ සැසියක් පවත්වන ලදී. බද්ධ දර්ශන සූරි අධීක්ෂණය පිළිබඳ සුවිශේෂී ගිවිසුමක් කෙටුම්පත් කිරීම පිළිබඳ ව විශ්වවිද්‍යාල දෙක ම දැනට කටයුතු සිදු කරමින් සිටියි.

- **ළමා ආරෝග්‍ය ශාලාව හා ළමා සෞඛ්‍යය පිළිබඳ ආයතනය, ලාහෝර්, පකිස්තානය**

පහත සඳහන් ක්ෂේත්‍රයන්හි සහයෝගිතා වැඩසටහන් සඳහා ඇති ශක්‍යතාව සොයා බැලීම් වස්. කොළඹ විශ්වවිද්‍යාලයීය වෛද්‍ය පීඨය හා පකිස්තානයේ ලාහෝරයේ පිහිටි ළමා ආරෝග්‍ය ශාලාව හා ළමා සෞඛ්‍යය පිළිබඳ ආයතනය අතර 2012 නොවැම්බර් මස අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී: අන්‍යෝන්‍ය වශයෙන් වැදගත් කමක් ඇති විෂය ක්ෂේත්‍රයන්හි තොරතුරු හුවමාරුව, බද්ධ පර්යේෂණ ක්‍රියාකාරකම්, සම්මන්ත්‍රණ හා පරිසංවාදයන්හි සහභාගී වීම සඳහා විද්වතුන් හා පශ්චාත් උපාධි සිසුන් හට ආරාධනා හුවමාරු කර ගැනීම, සහ අධ්‍යයන කාර්යමණ්ඩලය හා පශ්චාත් උපාධි සිසුන් සායනික පුහුණුව හා පර්යේෂණය සඳහා හුවමාරු කිරීම.

- **ටියැංජින් වෛද්‍ය විශ්වවිද්‍යාලය, චීනය**

2012 ඔක්තෝබර් මස දී කොළඹ විශ්වවිද්‍යාලය චීනයේ ටියැංජින් විශ්වවිද්‍යාලය සමග විශ්වවිද්‍යාල දෙක අතර, අධ්‍යයන හා සංස්කෘතික හුවමාරුව ප්‍රවර්ධනය සඳහා ගිවිසුමකට එළඹෙන ලදී.

- **ජපානයේ සුකුබා විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර විද්‍යා පිළිබඳ උපාධි අධ්‍යයන පාසල**

2012 සැප්තැම්බරයේ දී ජපානයේ සුකුබා විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර විද්‍යා පිළිබඳ උපාධි අධ්‍යයන පාසලත් කොළඹ විශ්වවිද්‍යාලයේ කළමනාකරණ හා මූල්‍ය පීඨයත් විසින් සුකුබා විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර විද්‍යා පිළිබඳ උපාධි අධ්‍යයන පාසලත්, කොළඹ විශ්වවිද්‍යාලයේ කළමනාකරණ හා මූල්‍ය පීඨයත් අතර කෙටි කාලීන අධ්‍යයන වැඩසටහනක් ප්‍රවර්ධනය කිරීම සඳහා ගිවිසුමකට එළඹෙන ලදී. මෙම සහයෝගිතාවෙහි ප්‍රතිඵලයක් ලෙස, කොළඹ විශ්වවිද්‍යාලයෙන් එහි යන ප්‍රථම ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති ශිෂ්‍ය කණ්ඩායම, 2013 මාර්තු මස 31 වන දා සුකුබා විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි වනු ඇත.

- **මැසී විශ්වවිද්‍යාලයය, නවසීලන්තය**

2012 අගෝස්තු මස නවසීලන්තයේ මැසී විශ්වවිද්‍යාලයේ උසස් තරාතිරමේ විද්වත් නියෝජිත පිරිසක්, කොළඹ විශ්වවිද්‍යාලය සමග විධිමත් ලෙස අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබීම සඳහා කොළඹ විශ්වවිද්‍යාලයෙහි සංචාරයක නිරත විය. එම සංචාරය, 2012 මුල් භාගයේ හා 2011 සිදු කළ සාර්ථක සංචාර දෙකකට පසු. මැසී විශ්වවිද්‍යාලය කොළඹ විශ්වවිද්‍යාලයෙහි සිදු කළ තෙවන සංචාරය විය. ගරු ස්ටීව් මහරේ, මැසී විශ්වවිද්‍යාලයේ උපකුලපති විසින් නියෝජිත පිරිසෙහි නායකත්වය දරන ලදී. විශ්වවිද්‍යාල දෙක විසින් එළඹෙන ලද ගිවිසුමෙහි කොන්දේසි අනුව, සහයෝගිතාව සඳහා පවත්නා ප්‍රධාන ම මාර්ගය වශයෙන් ශිෂ්‍ය හුවමාරුව හා බද්ධ දර්ශන සූරි අධීක්ෂණ හඳුනාගන්නා ලදී.

- **2013 සඳහා සාක්ෂාත් කර ගත හැකි සහයෝගිතා**

2012 දී අරඹන ලද සාර්ථක සාකච්ඡාවනට පසු. නවසිලන්තයේ 'පැළැටි සහ ආහාර පර්යේෂණ' නම් වූ පර්යේෂණ සංවිධානය සමග සහයෝගී සම්බන්ධතාවන් ගොඩනගා ගැනීමට විශ්වවිද්‍යාලය අපේක්ෂාවෙන් සිටියි. ශිෂ්‍ය හා කාර්යමණ්ඩල හුවමාරු මෙන් ම බද්ධ අධ්‍යයන සාකච්ඡා ද. එක්සත් රාජධානියේ යෝක් විශ්වවිද්‍යාලය සමග පැවති සාර්ථක සාකච්ඡාවන් කරණ කොට සිදුවිය හැකි හවුල් ව්‍යාපෘතියක් සඳහා ශක්‍යතාවන්ගෙන් හෙබි සහයෝගිතාවකට මංපෙත් ලෙස හඳුනා ගැනිණි.

<u>ශිෂ්‍ය හුවමාරු වැඩසටහන්</u>

2008 වසරේ සිට. ඔස්ට්‍රේලියාවේ ලා ට්‍රෝබ් විශ්වවිද්‍යාලය හා ජර්මනියේ ගීසන්හි ජස්ටස් ලීබග් විශ්වවිද්‍යාලය (JLU) සමග අනිසාර්ථක වූ ශිෂ්‍ය හුවමාරු වැඩසටහන් දෙකකට කොළඹ විශ්වවිද්‍යාලය සම්බන්ධ ව සිටියි. 2013 පෙබරවාරි මස සිට ඇරඹෙන පරිදි. ශ්‍රී පාලි මණ්ඩප සිසුවෙකු ලා ට්‍රෝබ්හි විශ්වවිද්‍යාලයෙහි එක් සෙමෙස්තරයක් විදේශගත ව ඉගෙනීම සඳහා 2012 වසරේ දී තෝරාගෙන තිබිණි.

- 2012 මාර්තු සිට අගෝස්තු දක්වා ගීසන් හි JLU දී ඉංග්‍රීසි අධ්‍යයනාංශයේ සිසුන් තිදෙනෙකු සාර්ථක ලෙස සෙමෙස්තරයක් සම්පූර්ණ කරන ලදී. ගීසන් හි JLU සිට හුවමාරු සිසුන් තිදෙනෙකු 2012 ඔක්තෝබර් මස කොළඹට සපැමිණි අතර දැනට ඉංග්‍රීසි හා ආර්ථික විද්‍යා අධ්‍යයනාංශයන්හි පාඨමාලා හදාරයි. ඔවුන් 2013 අප්‍රේල් දක්වා කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධව සිටිනු ඇත.

<u>කාර්යමණ්ඩල හුවමාරු හා සංචරණ වැඩසටහන්</u>

ජර්මනියේ ගීසන්හි ජස්ටස් ලීබග් විශ්වවිද්‍යාලය:

ගීසන්හි JLU විශ්වවිද්‍යාලය හා කොළඹ විශ්වවිද්‍යාලය අතර එළඹෙන ලද ගිවිසුම ප්‍රකාරව. ඉංග්‍රීසි අධ්‍යයනාංශයේ ආචාර්ය දුප්‍යන්ති මැන්දිස් හා ආචාර්ය පර්මාල් විජේවර්ධන ජර්මනියේ ගීසන්හි ජස්ටස් ලීබග් විශ්වවිද්‍යාලය වෙත කෙටි කාලීන කථිකාචාර්ය පදවි සඳහා අනුබද්ධව කටයුතු කළහ. මේ දක්වා මෙම සහයෝගිතාවන්හි ප්‍රගතිය සාකච්ඡා කිරීමට හා ඉදිරි දෙවසර සඳහා ශිෂ්‍ය හා කාර්යමණ්ඩල යන දෙකොටසෙහි ම හුවමාරු වැඩසටහන් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ඉල්ලුම් පත් සම්පූර්ණ කිරීම් වස්. ගීසන් හි JLU හි ආචාර්ය ඇන්ද්‍රියා රමල් 2012 ජූලි මස කොළඹ විශ්වවිද්‍යාලය වෙත පැමිණියාය. විශ්වවිද්‍යාල දෙක අතර සහයෝගිතාව වෙනුවෙන් ප්‍රතිපාදන සපයනුයේ DAAD (ජර්මන් අධ්‍යයන හුවමාරු සේවාව) විසිනි.

ඉරාමුස් මුන්ඩස් කාර්යමණ්ඩල සංචලන වැඩසටහන:

ඉතාලියේ ට්‍රෙන්ටෝ විශ්වවිද්‍යාලයෙහි පැවති ඉරාමුස් මුන්ඩස් ක්‍රියාකාරිත්ව 2 2011/2012 කාර්ය මණ්ඩල සංචලනා වැඩසටහනට ශාස්ත්‍ර පීඨයේ ආර්ථික විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්ය සිරිමල් අබේරත්න සහභාගි විය. එම සංචාරයෙන් පසු. මහාචාර්ය අබේරත්න. ට්‍රෙන්ටෝ විශ්වවිද්‍යාලයත් කොළඹ විශ්වවිද්‍යාලයත් අතර ආයතනික සම්බන්ධතා සවිමත් කිරීම හා සහයෝගිතාවන් පිළිබඳ ව පවත්නා ශක්‍යතා මේ වන විට සොයා බලමින් සිටියි.

ස්පාඤ්ඤයේ ඩුඑස්ටෝ විශ්වවිද්‍යාලයේ දී අධ්‍යාපන පීඨයේ ආචාර්ය ලක්ෂමන් වෙඩික්කාරගේ ද. ඉරාමුස් මුන්ඩස් කාර්යමණ්ඩල සංචලන වැඩසටහනට සහභාගී විය. ඔහුගේ සංචලනා වැඩසටහනට පසු විපරමක කොටසක් ලෙස. ඩුඑස්ටෝ හි මනෝ විද්‍යා හා අධ්‍යාපන පීඨය සහ කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨය අතර ශිෂ්‍ය හුවමාරු වැඩසටහනක් සඳහා කටයුතු පිළියෙල වෙමින් පවති.

<u>2012 සඳහා විදේශීය සිසුන් වෙත ශ්‍රී ලංකා රජයේ ශිෂ්‍යත්ව</u>

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ඉහත ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය සඳහා කොළඹ විශ්වවිද්‍යාලය වෙත ඉල්ලුම්පත් 20 ක් ලැබී ඇත. මේ දක්වා. ශාස්ත්‍ර. විද්‍යා. උපාධි අධ්‍යයන පීඨ හා කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක පාසල විසින් ඉල්ලුම්පත් 10 ක් තම පශ්චාත් උපාධි පාඨමාලා සඳහා පිළිගෙන ඇත. මෙම ඉල්ලුම්පත් දැනට. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හරහා පූර්ව ලියාපදිංචිකිරීමේ ක්‍රියාවලිය පසුකරමින් සිටී. අධ්‍යාපන. කළමනාකරණ හා මූල්‍ය සහ නීති පීඨ විසින් සලකා බැලීමේ බලාපොරොත්තුවෙන් ඉල්ලුම් පත් 4 ක් පසුවෙයි.

7 මූලධන හා සැලසුම්කරණය

හැඳින්වීම

2012 වසරේ දී ඉදිකිරීම් ව්‍යාපෘති හතක් (07) ද, නවීකරණ හා වැඩිදියුණු කිරීම් පහක් (05) ද, එසේ ම තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතියක් ද සිදුවෙමින් පැවතිණ.

<u>ප්‍රධාන ඉදිකිරීම් ව්‍යාපෘති</u>

උපාධි අධ්‍යයන පීඨයේ නව ගොඩනැගිලි සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු විශ්වවිද්‍යාලය විසින් ජනනය කරන ලද අරමුදල් රුපියල් මිලියන 152 ක් භාවිතයෙන් සමාලෝචිත වසර තුළ ආරම්භ කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබිණ. 2013 මුල් භාගයේ දී ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂිතය. වෛද්‍ය පීඨයේ සායනික වෛද්‍ය විද්‍යා අංශය හා ශ්‍රවණාගාරය සඳහා සය මහල් ගොඩනැගිල්ල ඉදිකිරීම් කටයුතු නිමා වූ අතර, අධ්‍යයන කටයුතු සඳහා විශ්වවිද්‍යාලය විසින් ගොඩනැගිල්ල භාර ගන්නා ලදී. අභ්‍යන්තර ජනිත අරමුදල් භාවිතයෙන් කොළඹ විශ්වවිද්‍යාලය සඳහා බහු කාර්ය ගොඩනැගිල්ලක් (කොළඹ විශ්වවිද්‍යාලය සඳහා විභාග ශාලාව) සැදීමේ කටයුත්ත සඳහා කැබිනට් අමාත්‍ය මණ්ඩල අනුමැතිය සමාලෝචිත වසරෙහි දී ලද අතර, ඉදිකිරීම් කටයුතු 2013 මැද භාගය වන විට ඇරඹීමට අපේක්ෂිත ය. විශ්වවිද්‍යාලය විසින් ජනනය කරගත් මුදල් රුපියල් මිලියන 150 ක් භාවිතයෙන් විශ්වවිද්‍යාලය එහි පළමු අදියරේ කටයුතු කිරීමට තීරණය කළ අතර, ඒ අනුව වැඩ නිම කෙරෙන පරිදි එහි මහල් කිහිපයක් හෝ අධ්‍යයන කටයුතු සඳහා භාවිත කළ හැකි වනු ඇත. කොළඹ විශ්වවිද්‍යාලය විසින් වෛද්‍ය පීඨය සඳහා (දළ වර්ග මීටර 36,276 ක බිම් ප්‍රමාණයක් ඇති එසේ ම බිම් මහල, යට හා ඉහළ පතුල්මාල හැර මහල් 14 කින් යුත්) සුවිශාලතම ගොඩනැගිලි ව්‍යාපෘතිය ඉදිකිරීමට තීරණය කරන ලදී. 2013 ආරම්භය වන විට දෙවන අදියර (පළමු මහලේ ශ්‍රවණාගාරයේ හැර කොන්ක්‍රීට් මට්ටම දක්වා ඉදිකිරීම) සඳහා ලංසුතැබීම් කටයුතු ඉදිරියට ගෙන යාමට අපේක්ෂිත අතර, 2013 මැද භාගය වන විට ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ. විද්‍යා පීඨයේ භෝජනාගාරය හා ශිෂ්‍ය පහසුකම් පුළුල් කිරීම් සඳහා මූලික කටයුතු ද නිමා කර ඇත. අධ්‍යාපන පීඨයේ ගොඩනැගිල්ලක පුළුල් කිරීම් කටයුතු සඳහා මූලික අදියරයන් ද කළමනාකරණ හා මූල්‍ය පීඨයේ නැගෙනහිර පස කොටසේ ඉදිකිරීම් ව්‍යාපෘතියේ කටයුතු ද සමාලෝචිත වසර තුළ දී ඉදිරියට සිදුකරගෙන යන ලදී.

<u>ගොඩනැගිලි නවීකරණ හා වැඩිදියුණු කිරීමේ සුවිසල් ව්‍යාපෘති</u>

කොළඹ විශ්වවිද්‍යාලයේ නව කලාගාරයේ නවීකරන ව්‍යාපෘතිය සිදුකර නිම වූ අතර සමාලෝචිත වසර තුළ දෙවන අදියර ද සිදුකරගෙන යන ලදුව ක්‍රියාකාරකම් සඳහා සූදානම්ව පවති. කොළඹ 07, හේවා මාවතේ අංක 11 දරන ස්ථානයේ පවත්නා ගොඩනැගිලි යලි නවීකරණයකට භාජනය කිරීමේ කටයුතු ද සිදුකෙරුනු අතර, 2013 මැද භාගය වන විට භාවිතයට සූදානම් වනු ඇතැයි අපේක්ෂිත ය. පැවිලියනය සඳහා කොටසක් ඇදීමක ඉදිකිරීම් ද, එනම් ව්‍යායාම කාමර දෙකක් ඉදිකිරීම ද 2012 වසර තුළ කරගෙන යන ලදී. පරිපාලන ගොඩනැගිල්ල සඳහා මගින් 10 දෙනෙකුට ගමන් කළ හැකි විදුලි සෝපානයක ඉදිකිරීම් කටයුතු ද එය සපයා සවි කිරීමේ කටයුතු (සිවිල් වැඩ කටයුතු ද ඇතුළු) ද, සමාලෝචිත වසර තුළ දී කොළඹ විශ්වවිද්‍යාලය විසින් සිදුකරන ලද අතර, 2013 මැද භාගය වන විට එය භාවිතයට ගත හැකි වනු ඇතැයි අපේක්ෂිතය. කළමනාකරණ හා මූල්‍ය පීඨයේ නැගෙනහිර කොටසේ වැසිකිලි පද්ධතියේ ඉදිකිරීම් කටයුතු ද සමාලෝචිත වසරේ දී සිදුකරනු ලැබිය.

<u>තොරතුරු තාක්ෂණ යටිතලපහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය</u>

(ඇ) කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨය මගින් පවත්වනු ලබන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවේ 2010/2011 කණ්ඩායමේ ඉගැන්වීම් කටයුතු 2012 දෙසැම්බර් 31 දින අවසන් වී තිබු අතර ගුරු පුහුණුව සඳහා දැරීමට සිදුවන රු.3,150,000 ක වියදම අඩුකළ පසු පාඨමාලා ගාස්තු ආදායම වූ රු.13,644,002 ක් ආදායම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට රු.7,764,237 ක වියදම් කපාහැර රු.9,029,765 ක් විලම්බිත ආදායම් ලෙස ගිණුම්ගත කර රු.720,850 ක් පමණක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට බැර කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට පාඨමාලා 74 ක අතිරික්ත ආදායම් වූ රු.71,520,554 ක මුදල් විශ්වවිද්‍යාල අරමුදලට බැර කරනු වෙනුවට උපාධි අධ්‍යයන පීඨ ගොඩනැගිලි අරමුදලට බැරකර තිබුණි.

2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

පරීක්ෂාකාල ආචාර්යවරු 100 දෙනකුගෙන් යුත් නියැදියේ ඇතුළත් ආචාර්යවරු 15 දෙනකු සම්බන්ධයෙන් අදාල පරීයේෂණ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණු අතර එම ආචාර්යවරුන් සඳහා පරීයේෂණ දීමනා වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ රු.1,480,177 ක් ගෙවා තිබුණි.

2.2.4 **ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්**

අන්තර් ජංගම ගිණුම් අතර තිබෙන ශේෂයන් වර්ෂය අවසානයේ දී පියවීමට කටයුතු නොකර පාඨමාලා 217 ක අතිරික්ත ආදායම් වූ රු.124,038,130 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ණය ගැතියන් හා ණය හිමියන් වශයෙන් දක්වා තිබුණි.

2.2.5 **නීති,රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

	නීති,රීති හා රෙගුලාසි ආදියේ යොමුව	අනුකූල නොවීම
	---	---
(අ)	1987 අංක 03 දරන පොදු සොන්ත්‍රාත් පනතේ 6(1)(අ) වගන්තිය	සොන්ත්‍රාත් ගිවිසුමේ පිරිවැය රු. මිලියන 5 ඉක්මවන අවස්ථා වලදී සෑම ටෙන්ඩර් කරුවෙකුම පොදු සොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි කළයුතු වුවත්, රු.20,204,939 ක් වූ නව කලාගාරය අලුත්වැඩියාව හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය හා

		රු.9,026,077 ක් වූ විද්‍යා පීඨ උද්‍යාණ අලංකරණ ව්‍යාපෘතියට අදාල කොන්ත්‍රාත්කරුවන් හා කොන්ත්‍රාත් ගිවිසුම් එසේ ලියාපදිංචි කර නොතිබුණි.
(ආ)	1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 99(1) උපවගන්තිය	(i) විශ්වවිද්‍යාලයේ සියළුම උත්පාදක ආදායම් ඇතුළුව සියළුම අරමුදල් විශ්වවිද්‍යාල අරමුදලේ කොටසක් වියයුතු වුවද ඊට පටහැනිව විශ්වවිද්‍යාලය විසින් භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව පාලක සභා තීරණ යටතේ කොළඹ විශ්වවිද්‍යාලීය සංවර්ධන අරමුදල පිහිටුවීමට කටයුතු කර තිබුණි. (ii) විශ්වවිද්‍යාල මූල්‍ය කමිටුවේ නිර්දේශ මත විවිධ පීඨ හා දෙපාර්තමේන්තු සඳහා සංවර්ධන අරමුදල් පිහිටුවා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට එම අරමුදල් 75 ක රු.119,069,767 ක් රැස්කර තිබූ අතර වියදම රු.73,754,623 ක් විය.
(ඇ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.4 මාර්ගෝපදේශය	තාක්ෂණ ඇගයීම් කමිටුවේ අදාල විෂය සම්බන්ධ විශේෂඥ සාමාජිකයෙකු සිටියයුතු වුවත්, කොන්ත්‍රාත් වටිනාකම රු.20,204,939 ක් වූ නව කලාගාරය අලුත්වැඩියාව හා වැඩිදියුණු කිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා පත්කර තිබූ තාක්ෂණික ඇගයීම් කමිටුවේ එවැනි සාමාජිකයෙක් පත්කර නොතිබුණි.
(ඈ)	විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ V පර්ව්ඡේදයේ 5.2 වගන්තිය හා 2007 අගෝස්තු 24 දිනැති අංක. 09/2007(1) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	අනධ්‍යයන කාර්ය මණ්ඩලයට උපරිම වශයෙන් වයස අවුරුදු 60 දක්වා සේවය කළ හැකි අතර එසේ විශ්‍රාම ගිය නිලධාරියෙකු මාස 12 ක උපරිමයකට යටත්ව නැවත සේවයේ යෙදවිය හැකිය. එම සීමාවන් ඉක්මවා අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ නිලධාරීන් 3 ක් අවුරුදු 01 සිට අවුරුදු 04 දක්වා කාලයක් අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව සේවයේ යොදවා තිබුණි.

(ඉ)	2011 අප්‍රේල් 07 දිනැති අංක 45 දරන කළමණාකරන සේවා වක්‍රලේඛය	පිළිගත් පරීක්ෂණ කම්ටුවක අනුමැතිය නොලබා ආචාර්යවරුන් 502 දෙනෙකුට පරීක්ෂණ දීමනා ලෙස රු.58,366,090 ක් ගෙවා තිබුණි. තවද ඉහත ආචාර්යවරුන්ගෙන් ආචාර්යවරු 07 දෙනෙකු පරීක්ෂණ කටයුතුවල නියැලී නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ රු.524,571 ක පරීක්ෂණ දීමනාවක් ඔවුනට ගෙවා තිබුණි.
(ඊ)	විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3.1 වගන්තිය හා ආයතන සංග්‍රහයේ X පරිච්ඡේදයේ 1.6.1 වගන්තිය.	අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම , පිටවීම හා නිවාඩු සනාථ කර ගැනීම සඳහා අදාල පොත්පත් ලේඛණ නඩත්තු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා ගෙවූ රු. 587,716,629 ක් වූ වැටුප් හා දීමනාවල නිවැරදිතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය, පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.1,280,656,942 ක ඌනතාවයක් වූ අතර, ඉකුත් වර්ෂයේ අනුරූපී ඌනතාවය රු.1,194,550,697 ක් විය. පුනරාවර්තන වියදම් සහ නඩත්තු වියදම් සඳහා රු.1,313,690,377 ක් වූ රජයේ ප්‍රදානය ගණන් ගැනීමෙන් පසු සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.33,033,435 ක අතිරික්තයක් බවට පත්ව තිබූ අතර ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රු.1,263,933,516 ක් වූ රජයේ ප්‍රදානය හේතුවෙන් එම වර්ෂයේ අතිරික්තය රු.69,382,819 ක් දක්වා වැඩි වී තිබුණි.ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රජයේ ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු මූල්‍ය ප්‍රතිඵලයේ රු.36,349,384 ක අඩුවීමක් නිරීක්ෂණය විය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1. කළමනාකරණ ආකාර්යක්ෂමතා

භාණ්ඩාගාර අනුමැතියකින් තොරව විශ්වවිද්‍යාල පාලක සභා සංදේශ අංක. 88/10 යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදල සඳහා ආදායම් ප්‍රභවයන් වනුයේ බාහිර පාඨමාලාවල අතිරික්තය හා කොතලාවල ආරක්ෂක විද්‍යාලයේ උපදේශන ගාස්තු වේ. එකී නියමයන්ද අභිබවා යමින් 2000 ඔක්තෝබර් 21 දිනැති අංක. 21 දරණ කොළඹ විශ්වවිද්‍යාලීය වක්‍රලේඛය මගින් බාහිර පාඨමාලා අයවැයගත ආදායමෙන් සියයට 10 ලෙස සමාලෝචිත වර්ෂය තුළ රු.26,775,342 ක් විවිධ පිඨ මගින් සංවර්ධන අරමුදලට බැර කර තිබුණි . බාහිර පාඨමාලා ආදායම් කළමනාකරණය සම්බන්ධයෙන් කළමනාකරණයේ ඉහත පරස්පරතාවයන් මූල්‍ය පාලනයේ අහිතකර තත්ත්වයක් බව නිරීක්ෂණය විය.

4.2 ගිවිසුම් ගත සේවා

සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ ආරක්ෂක සේවා සඳහා රු.30,314,352 ගෙවා තිබූ අතර 2012 දෙසැම්බර් 04 දින පෙරවරු 11.00 පමණ සිදුකළ භෞතික පරීක්ෂාවේදී ආරක්ෂක නිලධාරීන් අනුයුක්ත කළයුතු සැලැස්මට අනුව ස්ථාන 09 ක නිලධාරීන් 12 ක් සේවයේ යොදවා නොතිබූ බව නිරීක්ෂණය විය.

4.3 ගිවිසුම් කඩකළ අචාර්යවරුන්ගෙන් ලැබියයුතු මුදල්

සමාලෝචිත වර්ෂය අවසානයට විශ්වවිද්‍යාල ආචාර්යවරුන් 37 ක් ගිවිසුම් කඩකර තිබූ අතර විශ්වවිද්‍යාලයට අයවීමට තිබූ මුලු මුදල රු.41,597,721 ක් විය.
ආචාර්යවරයා පිළිබඳ තොරතුරු සොයාගත නොහැකිවීම සහ අධිකාරණ නියෝග ලබාදී තිබුණද ඒ අනුව කටයුතු කිරීමට අපොහොසත්වීම නිසා ආචාර්යවරුන් 11 ක ගෙන් අයවියයුතු රු.11,966,890 ක් ද විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලින් අයකිරීමට කටයුතු කරන බව දක්වා තිබූ ආචාර්යවරු 13 ක ගෙන් අයවියයුතු රු.4,337,122 ක් ද සේවය කඩකළ ආචාර්යවර්යගෙන් අයවියයුතු රු.1,790,241 ක් ද දීර්ඝකාලයක සිට අයවී නොතිබුණි.

4.4. **නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) උපාධි අධ්‍යයන පීඨයේ සංචිකර ඇති රු.350,000 ක් පිරිවැය වූ විදුලි උත්පාදන යන්ත්‍රය වසර 07 ක සිට නිශ්ක්‍රියව පැවතුණි.

(ආ) වෛද්‍ය ශාස්ත්‍රීය ගොඩනැගිල්ල සඳහා රු.13,268,669 ක කාර්යාල උපකරණ මිලදී ගෙන තිබූ අතර ගොඩනැගිල්ලේ කොන්ත්‍රාත් කටයුතු අවසන් වීමට ප්‍රථම උපකරණ මිලදීගැනීම නිසා වසර 1 1/2 කට අධික කාලයක් නිශ්ක්‍රියව පැවතුණි.

(ඇ) විශ්වවිද්‍යාලයේ අනුමත රියදුරු කාර්යමණ්ඩලය 24 ක් වන අතර තථ්‍ය කාර්යමණ්ඩලය 21කි. ඒ අනුව පුරප්පාඩු තනතුරු ගණන 3කි. උපකුලපති සඳහා එක් වාහනයක්ද අනෙකුත් කාර්යමණ්ඩලය සඳහා වාහන 10 ක් ද වෛද්‍ය පීඨය සඳහා අතිරේක වාහන 5 ක් ද වශයෙන් වෙන් කළ මුළු වාහන සංඛ්‍යාව හා රියදුරන් සංඛ්‍යාව 16 කි. වාහන 32 ක ඇණියෙන් ඉතිරි වාහන 16 පැදවීම සඳහා යෙදවිය හැකි රියදුරන් ගණන 5 ක් පමණක් විය. විශ්වවිද්‍යාලයේ අනෙකුත් අංශයන්හි කටයුතු කාර්යක්ෂමව පවත්වාගෙන යාමට මෙම තත්ත්වය බාධාවක් වන අතර සැමවිටම වාහන 11 ක් ඌණ උපයෝජිතව පැවතුණි.

4.5 කොන්ත්‍රාත් පාලනයේ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වෛද්‍ය පීඨයේ ශාස්ත්‍රීය විද්‍යා අංශයේ ඉගෙනුම් හා විහාග කටයුතු සඳහා ඉදිකරනු ලබන ගොඩනැගිල්ල සඳහා වූ කොන්ත්‍රාත්තුව පෞද්ගලික කොන්ත්‍රාත් සමාගමකට 2004 දෙසැම්බර් 17 දින කොන්ත්‍රාත් වටිනාකම රු.47,644,945 කට ප්‍රදානය කර තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව මාස 18 කින් අවසන් කිරීමට සැලසුම් කර තිබුණද , වසර 08 කට අධික කාලයක් ඉකුත් වී 2013 අප්‍රේල් 08 දින කොන්ත්‍රාත් කටයුතු නිම කර තිබුණි. මෙම ඉදිකිරීම් සඳහා රු.92,353,867 ක වියදමක් විශ්වවිද්‍යාලය විසින් දරා තිබූ අතර එය මුළිසා කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 93.8 ක් ඉක්මයාමකි.

(ආ) රු.7,227,023 ක මුදලකට ප්‍රමිතියෙන් තොර පුටු මිලදී ගෙන තිබූ අතර මෙම පුටු භෞතික පරීක්ෂාවේදී බොහෝ පුටුවල රබර් බුස්, අත්ල, කුෂන් ගැලවී තිබුණ අතර පුටුවේ වාඩිවන කොටසේ යටි පැත්ත ස්ටේප්ලර් කටු ගසා ආවරණය කර තිබුණු අතර මිලදී ගත් මේස නිසි ප්‍රමිතියෙන් තොර බව නිරීක්ෂණය විය.

4.6 නේවාසිකාගාර ප්‍රතිසංස්කරණය හා පාලනය

පහත නිර්ක්ෂණයන් කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලය විසින් රු මිලියන 22 ක් වැයකර ප්‍රතිසංස්කරණය කරන ලද අක්කර 01 රූඩ් 01 පර්චස් 32.58 ක භූමියක පිහිටි සිසුන් 500 කට ආමණ නේවාසික පහසුකම් සැපයිය හැකි තෙලවල නේවාසිකාගාරය 2010 වර්ෂයේ සිට වසාදමා තිබුණි. 2012 දෙසැම්බර් 31 දිනට මෙහි වත්කම්වල පිරිවැය රු.25,352,000 ක් ලෙස මූල්‍ය ප්‍රකාශවල දක්වා තිබුණ අතර මෙම නේවාසිකාගාරය කාන්තා නේවාසිකාගාරයක් බවට පත්කිරීම සඳහා 2013 අප්‍රේල් මස සිට අළුත්වැඩියා කටයුතු ආරම්භකර ඇති බව උපකුලපතිවරයා දන්වා තිබුණි.

(ආ) නේවාසිකාගාර කිහිපයක අසාමාන්‍ය ජල පරිභෝජනයක් වූ අතර ඒඅ ශිෂ්‍ය ජල පරිභෝජනය රු.2,317 සිට රු.9,861 ක පරාසයක් තුළ විහිදුනි.

(ඇ) නේවාසිකාගාර කිහිපයක අසාමාන්‍ය විදුලි පරිභෝජනයක් වූ අතර ඒඅ ශිෂ්‍ය විදුලි පරිභෝජනය රු.1,341 සිට රු.8,953 ක පරාසයක් තුළ විහිදුනි.

(ඈ) ශ්‍රීන්පාත් භික්ෂු නේවාසිකාගාරයෙහි සිසුන් 50 කට ආමණ නේවාසික පහසුකම් සැපයිය හැකි නේවාසිකාගාරය මසකට රු.130,000 කුලී පදනමට ලබාගෙන තිබුණි. 2011 ජූලි 01 දින ඒකාබද්ධ මාසික කුලිය රු.205,000 ගෙවා යාබද ගොඩනැගිල්ලක්ද ලබාගෙන තිබූ අතර 2012 මැයි වන විට සිසුන් 37 කට ආමණක් නේවාසික පහසුකම් සපයා තිබුණි. එක් නේවාසිකාගාරය ආමණක් මෙම භික්ෂු ශිෂ්‍යයන්ට නේවාසිකව සිටිය හැකිව තිබුණි.

05 ගිණුම් කටයුතුහාවය හා යහපාලනය

5.1 ක්‍රියාකාරී සැලැස්ම

2012 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මේ රු.9,026,077 ක් වූ උද්‍යාන අලංකරණ ව්‍යාපෘතිය පිළිබඳ තොරතුරු ඇතුළත් කර නොතිබුණි.

5.2 ප්‍රසම්පාදන කටයුතු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1(අ) සහ 4.2.3 මාර්ගෝපදේශ ප්‍රකාරව අවම වශයෙන් වසර 03 ක කාලපරිච්ඡේදයක් තුළ ඉටුකිරීමට අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කළ සැලැස්මේ ඒ ඒ ප්‍රසම්පාදන සැලැස්මේ කාලරාමුව හා පියවරයන් ඇතුළත් වන ප්‍රසම්පාදන කාලසටහන සකස්කර නොතිබුණි.

(ආ) ඉහත මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.3.2 මාර්ගෝපදේශය පරිදි අරමුදල් සම්පාදන මාර්ගය සුමක් වුවත්, සියළු ප්‍රසම්පාදන කටයුතු එකී සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය පරිදි ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මිලදීගත් රු.84,276,916 ක් වූ මිලදීගැනීම් එකී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

5.3 කාර්යය මණ්ඩල පුරප්පාඩු

විශ්වවිද්‍යාලයේ සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යයන හා අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු 216 ක් විය. ඒ අනුව අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 136 ක් වූ අතර ඉන් 73 ක් සප්තවාර්ෂික නිවාඩු ලබාගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාලය විසින් බාහිර කථිකාචාර්යවරුන් සඳහා රු.12,264,835 ක වැය බරක් දරා තිබුණි.

06 පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විශ්වවිද්‍යාලයේ උපකුලපතිගේ අවධානයට වරින්වර යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

(අ) මිලදීගැනීම්

(ආ) කොන්ත්‍රාත් පාලනය

(ඇ) පුස්තකාල පරිපාලනය

(ඈ) ගිණුම්කරණය

(ඉ) පාඨමාලා ආදායම්

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

වැඩබලන විගණකාධිපති

2.2	මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම	
2.2.1	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති	
	සම්පූර්ණයෙන් ක්ෂය කළ වත්කම්	
	විශ්වවිද්‍යාලය සතුව එකතු වටිනාකම රු. 212,758,120 වූ දැනට ප්‍රයෝජනයට ගන්නා එහෙත් සම්පූර්ණයෙන් ක්ෂය කළ වත්කම් ප්‍රයෝජනවත් ජීවිත කාලය සමාලෝචනය කර සාධාරණ අගයකට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හෙලිදරව් කර නොතිබුණි.	මෙහි ඇතුලත් රු. 199,039,267/- ක් වූ පොත්පත් හා චාර සහරා නැවත ප්‍රයෝජනවත් ජීවිත කාලය අගය කර සාධාරණ අගයකට පොත්වලට ගැනීම් ප්‍රායෝගිකව අපහසු වේ. රු. 3,343,890/- ක් වූ මෝටර් රථ නැවත ප්‍රත්‍යාගණනය කර 2013 වර්ෂයේ අවසාන ගිණුම් හි ගිණුම් ගත කර ඇත.
2.2.2	ගිණුම්කරණ අඩුපාඩු	
	සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පරීක්ෂා කිරීමේදී පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.	
(අ)	සමාලෝචිත වර්ෂයේ ලැබූ රු. 9,870,322 ක් වූ බාහිර පාඨමාලා අයදුම්පත් ගාස්තු හා රු.18,640,016 ක් වූ ලියාපදිංචි ගාස්තු සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කළ යුතු වුවත්, රු. 961,500ක් වූ අයදුම්පත් ගාස්තු හා රු. 3,272,500 ක් වූ ලියාපදිංචි ගාස්තු ජංගම නොවන වගකීම් යටතේ විලම්බිත ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.	2013 වර්ෂයෙහි ගිණුම් පිළියෙල කිරීමේ දී නිවැරදි කර ඇත.
(ආ)	කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය මගින් මෙහෙයවනු ලබන ආසියානු පැසිපික් කලාපීය රටවල් අතර මානව හිමිකම් හා ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ 2011/2012 පශ්චාත් උපාධි පාඨමාලාව (Asia Pacific Masters) 2012 අප්‍රේල් 27 දින අවසන්වී තිබූ බැවින් සමස්ථ පාඨමාලා ආදායම වූ රු.12,075,047 ක් ආදායම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට රු.6,520,945 ක් වියදමට කපාහැරීම හා රු.1,407,736 ක් අරමුදල්වලට මාරුකර රු.4,146,366 ක් විලම්බිත ආදායම් ලෙස ගිණුම්ගතකර රු.1,315,073 ක් පමණක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට බැර කර තිබුණි.	2013 වර්ෂයෙහි ගිණුම් පිළියෙල කිරීමේ දී නිවැරදි කර ඇත.
(ඇ)	කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨය මගින් පවත්වනු ලබන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවේ 2010/2011 කණ්ඩායමේ ඉගැන්වීම් කටයුතු 2012 දෙසැම්බර් 31 දින අවසන් වී තිබූ අතර ගුරු පුහුණුව සඳහා දැරීමට සිදුවන රු.3,150,000 ක වියදම් අඩුකළ පසු	2013 වර්ෂයෙහි ගිණුම් පිළියෙල කිරීමේ දී නිවැරදි කර ඇත.

	පාඨමාලා ගාස්තු ආදායම වූ රු. 13,644,002 ක් ආදායම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට රු. 7,764,237 ක වියදම් කපා හැර රු. 9,029,765 ක් විලම්බිත ආදායම් ලෙස ගිණුම් ගත කර රු. 720,850 ක් පමණක් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට බැර කර තිබුණි.		
(ඇ)	සමාලෝචිත වර්ෂය අවසාන දිනට පාඨමාලා 74 ක අතිරික්ත ආදායම වූ රු. 71,520,554 ක මුදල විශ්වවිද්‍යාල අරමුදලට බැර කරනු වෙනුවට උපාධි අධ්‍යයන පීඨ ගොඩනැගිලි අරමුදලට බැරකර තිබුණි.		උපාධි අධ්‍යයන පීඨ ගොඩනැගිලි අරමුදල ද විශ්වවිද්‍යාලයේ පරමුදලේම කොටසක් වේ. ගිණුම් තුලනය කිරීමේ පහසුව සඳහා එම මුදල් උපාධි අධ්‍යයන පීඨ ගොඩනැගිලි අරමුදල නමින් වූ ලෙජර් ගිණුමකට බැර කර ඇත. මෙම මුදල් 2013.11.30 වන විට එම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් නටයුතු සඳහා භාවිතා කර ඇත.
2.2.3	**විගණනය සඳහා සාක්ෂි නොවීම**		
	පරීක්ෂාකළ ආචාර්යවරු 100 දෙනකුගෙන් යුත් නියැදියේ ඇතුළත් ආචාර්යවරු 15 දෙනකු සම්බන්ධයෙන් අදාල පර්යේෂණ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණු අතර එම ආචාර්යවරුන් සඳහා පර්යේෂණ දීමනා වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ රු. 1,480,177 ක් ගෙවා තිබුණි.		මෙම ඡේදයේ සඳහන් ආචාර්යවරුන් 13දෙනෙකුගේ පර්යේෂණ දීමනා පත්‍රිකා මේ සමග ඔබ වෙත ඉදිරිපත් කරන අතර (ඇමුණුම් අංක 01) T.D. උදලගම සහ B.M.W.U.C.B. ජයසුන්දර යන ආචාර්යවරුන්ට අදාල පර්යේෂණ දීමනා ගෙවා නැති බව දැන්වීමට කැමැත්තෙමි. ඒ පිළිබඳව T.D. උදලගම විසින් ඉදිරිපත් කරන ලද පැහැදිලි කිරීම මේ සමඟ අමුණා ඇත. (ඇමුණුම් අංක 02) තවද අදාල පර්යේෂණ දීමනා ගෙවා ඇත්තේ පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කර ඇති ආචාර්යවරුන් සඳහා පමණක් බව දැන්වීමට කැමැත්තෙමි.
2.2.4	**ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**		
	අන්තර් ජංගම ගිණුම් අතර තිබෙන ශේෂයන් වර්ෂය අවසානයේ දී පියවීමට කටයුතු නොකර පාඨමාලා 217 ක අතිරික්ත ආදායම වූ රු. 124,038,130 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ණය ගැනියන් හා ණය හිමියන් වශයෙන් දක්වා තිබුණි.		නිවැරදි කර ඇත.
2.2.5	**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**		
	පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.		
	නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	
	(අ) 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 6(1)(අ) වගන්තිය.	කොන්ත්‍රාත් ගිවිසුමේ පිරිවැය රු. මිලියන 5 ඉක්මවන අවස්ථා වලදී සෑම ටෙන්ඩර් කරුවෙකුම පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි කළයුතු	විශ්වවිද්‍යාලයේ කොන්ත්‍රාත් පිරිනැමීමේදී ප්‍රසම්පාදන ක්‍රමවේදයන් කිහිපයකට අනුව සිදුකරනු ලබයි. ඒ සඳහා භාවිතා වන්නේ එස්.බී.ඩී. I, එස්.බී.ඩී. II හෝ එස්.බී.ඩී III දරණ ගොඩනැගිලි අභ්‍යාස සහ සංවර්ධන

		වූවත්, රු. 20,204,939 ක් වූ නව කලාගාරය අලුත්වැඩියාව හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය හා රු. 9,026,077 ක් වූ විද්‍යා පීඨ උද්‍යාණ අලංකරණ ව්‍යාපෘතියට අදාල කොන්ත්‍රාත්කරුවන් හා කොන්ත්‍රාත් ගිවිසුම් එසේ ලියාපදිංචි කර නොතිබුණි.	ආයතනය (ICTAD) විසින් නිකුත් කරන ලද ටෙන්ඩර් ලියවිල්ලයි. මෙයට අමතරව සැලසුම් කොට ඉදිකිරීමේ (Design & Build/Turnkey) ආකාරයේ කොන්ත්‍රාත්තුවක් එස්.බී.ඩී. IV ටෙන්ඩර් ක්‍රමයද භාවිතයට ගනු ලබයි. මෙයට පෙර විශ්වවිද්‍යාලයේ කිසිදු කොන්ත්‍රාත්තුවක් පිරිනැමීමේදී විගණන විමසුමෙහි සඳහන් පරිදි 1987 අංක 03 දරණ පොදු කොන්ත්‍රාත් පනත අනුගමනය කර පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි කර නොතිබූ බව දන්වනු කැමැත්තෙමි. 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත පිලිබඳව ගොඩනැගිලි අභ්‍යාස සහ සංවර්ධන ආයතනයෙන් (ICTAD) කරන ලද විමසීමේදී ඔවුන් පවසා සිටියේ ප්‍රසම්පාදන කටයුතු කිරීමේදී ආයතනය විසින් පිලිපැදිය යුත්තේ ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පමණක් බවය. (National Procurement Guidelines) ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ කිසිදු ස්ථානයක 1987 අංක 03 දරණ පොදු කොන්ත්‍රාත් පනත අනුගමනය කර පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි කල යුතු යැයි දැන්වීමක් කොට නොමැති අතර NPA/CEO/18 දරණ චක්‍රලේඛ අංක 08 හි දෙවන පරිච්ඡේදයට අනුව, 2005.10.20 දිනට පූර්ව නිකුත් කොට ඇති ටෙන්ඩර් නීති, රීති වෙනුවට ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2006 ඒ වෙනුවට ආදේශ වන බැවින් අදාල ලියාපදිංචි වීම අනවශ්‍ය කරුණක් බව පැහැදිලිය. (ඇමුණුම් අංක 03) ජාතික ප්‍රසම්පාදන කොමිසම මගින් නිකුත් කරන ලද ප්‍රසම්පාදන මාර්ගෝපදේශන 2006 අංක 1.3 වගන්තියට අනුවද උක්ත 1987 අවශ්‍යතාවය අහෝසි වී යයි. (ඇමුණුම් අංක 04) කෙසේ වුවත් විගණන අංශයෙන් දිගින් දිගටම කරන මෙම විගණන විමසුම් නිසා මිලියන 05 ට වැඩි කොන්ත්‍රාත් පිරිනැමීමේදී කොන්ත්‍රාත්කරුවන් වෙත පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි වන ලෙස ලිඛිතව දන්වන ලද මුත්, ඔවුන් විසින්ද කරුණු සොයා බැලීමෙන් අනතුරුව ජාතික ප්‍රසම්පාදන ආයතනයේ උපදේශන වලට අනුව මෙවැන්නක් සිදු කිරීමට අනවශ්‍ය බව දන්වා ඇත. මේ අනුව විගණන විමසුමෙහි "සෑම ටෙන්ඩර්කරුවෙක්ම පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි කල යුතුය" බව සඳහන් කිරීම පිලිගත නොහැක.

	ආ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 99(1) උපවගන්තිය	(i) විශ්වවිද්‍යාලයේ සියළුම උත්පාදක ආදායම් ඇතුළුව සියළුම අරමුදල් විශ්වවිද්‍යාල අරමුදලේ කොටසක් වියයුතු වුවද ඊට පටහැනිව විශ්වවිද්‍යාලය විසින් භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව පාලක සභා තීරණ යටතේ කොළඹ විශ්වවිද්‍යාලීය සංවර්ධන අරමුදල පිහිටුවීමට කටයුතු කර තිබුණි. (ii) විශ්වවිද්‍යාල මූල්‍ය කමිටුවේ නිර්දේශ මත විවිධ පීඨ හා දෙපාර්තමේන්තු සඳහා සංවර්ධන අරමුදල් පිහිටුවා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට එම අරමුදල් 75 ක රු. 119,069,767 ක් රැස්කර තිබූ අතර වියදම රු. 73,754,623 ක් විය.	මෙම අරමුදල් පිහිටු වීම සම්බන්ධව 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතෙහි විශේෂිත අරමුදල් පිහිටුවීම සඳහා අවසර දී ඇති බැවින් භාණ්ඩාගාරයේ විරෝධතාවක් නොමැති බව අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල්තුමාගේ 2014.02.07 දිනැති ලිපිය මඟින් දන්වා ඇත. එහි පිටපතක් මේ සමග අමුණා ඇත. (ඇමුණුම් අංක 05)
	ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.4 මාර්ගෝපදේශය	නාක්ෂණ ඇගයීම් කමිටුවේ අදාල විෂය සම්බන්ධ විශේෂඥ සාමාජිකයෙකු සිටිය යුතු වුවත්, කොන්ත්‍රාත් වටිනාකම රු. 20,204,939 ක් වූ නව කලාගාරය අලුත්වැඩියාව හා වැඩිදියුණු කිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා පත්කර තිබූ නාක්ෂණික ඇගයීම් කමිටුවේ එවැනි සාමාජිකයෙක් පත් කර නොතිබුණි.	ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනය විසින් නිකුත් කර ඇති ප්‍රසම්පාදන මාර්ගෝපදේශක සංග්‍රහයේ වගන්තියේ "C" උප වගන්තිය කෙරෙහි අවධානය යොමු කරනු කැමැත්තෙමි. මේ අනුව නාක්ෂණික ඇගයීම් උපදේශන සඳහා බාහිර පුද්ගලයන් හෝ ආයතනයන්ගෙන් උපදෙස් ලබා ගත හැක. මෙහිදී ක්‍රියාත්මක වී ඇත්තේ, එම වගන්තිය අනුව ශ්‍රී ලංකාවේ ඉංජිනේරු කාර්යයන් පිළිබඳව උපදේශන සේවාවන් සපයන උසස්ම හා එකම රාජ්‍ය ආයතනය වන ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය මඟින් මේ පිළිබඳ නාක්ෂණික ඇගයීම් නිර්දේශ ලබා ගැනීමයි. එම නිර්දේශ මත නාක්ෂණික ඇගයීම් කමිටුව ඔවුන්ගේ නිර්දේශ ඉදිරිපත් කර ඇත.
	(ඈ) විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ V පරිච්ඡේදයේ 5.2 වගන්තිය හා 2007 අගෝස්තු 24 දිනැති අංක. 09/2007(1) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	අනධ්‍යයන කාර්ය මණ්ඩලයට උපරිම වශයෙන් වයස අවුරුදු 60 දක්වා සේවය කළ හැකි අතර එසේ විශ්‍රාම ගිය නිලධාරියෙකු මාස 12 ක උපරිමයකට යටත්ව නැවත සේවයේ යෙදවිය හැකිය. එම සීමාවන් ඉක්මවා අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ නිලධාරීන් 3 ක් අවුරුදු 01 සිට අවුරුදු 04 දක්වා කාලයක් අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව සේවයේ යොදවා තිබුණි.	සේවයේ අවශ්‍යතාවය මත මෙය කිරීමට සිදු වී ඇති බව කාරුණිකව දන්වමි.

	(ඉ) 2011 අප්‍රේල් 07 දිනැති අංක 45 දරන කළමණාකරන සේවා චක්‍රලේඛය	පිළිගත් පර්යේෂණ කමිටුවක අනුමැතිය නොලබා ආචාර්යවරුන් 502 දෙනකුට පර්යේෂණ දීමනා ලෙස රු. 58,366,090 ක් ගෙවා තිබුණි. තවද ඉහත ආචාර්යවරුන්ගෙන් ආචාර්යවරු 07 දෙනෙකු පර්යේෂණ කටයුතුවල නියැලී නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ රු. 524,571 ක පර්යේෂණ දීමනාවක් ඔවුනට ගෙවා තිබුණි.	මෙම ඡේදයේ සඳහන් ආචාර්යවරුන් 07 දෙනාගේ පර්යේෂණ දීමනා පත්‍රිකා මේ සමග ඔබ වෙත ඉදිරිපත් කරමි. (ඇමුණුම් අංක 06)
	(ඊ) විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3.1 වගන්තිය හා ආයතන සංග්‍රහයේ X පරිච්ඡේදයේ 1.6.1 වගන්තිය	අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම, පිටවීම හා නිවාඩු සනාථ කර ගැනීම සඳහා අදාල පොත් පත් ලේඛන නඩත්තු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා ගෙවූ රු. 587,716,629 ක් වූ වැටුප් හා දීමනාවල නිවැරදිභාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.	මේ සම්බන්ධව කලමණාකරන කමිටුව මගින් ද සාකච්ඡා කල අතර මෙය මුළු විශ්වවිද්‍යාල පද්ධතියටම පොදු වූ එකක් බැවින් එය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම හරහා විසඳීමට හැකි නම් වඩාත් යෝග්‍ය වේ.
3.	මූල්‍ය සමාලෝචනය		
3.1	මූල්‍ය ප්‍රතිඵලය		
	ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය, පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු. 1,280,656,942 ක ඌනතාවයක් වූ අතර, ඉකුත් වර්ෂයේ අනුරූපී ඌනතාවය රු. 1,194,550,697 ක් විය. පුනරාවර්තන වියදම් සහ නඩත්තු වියදම් සඳහා රු. 1,313,690,377ක් වූ රජයේ ප්‍රදානය ගණන් ගැනීමෙන් පසු සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 33,033,435 ක අතිරික්තයක් බවට පත්ව තිබූ අතර ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රු. 1,263,933,516 ක් වූ රජයේ ප්‍රදානය හේතුවෙන් එම වර්ෂයේ අතිරික්තය රු. 69,382,819 ක් දක්වා වැඩි වී තිබිණි. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රජයේ ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු මූල්‍ය ප්‍රතිඵලයේ රු. 36,349,384 ක අඩුවීමක් නිරීක්ෂණය විය.	එකඟ වේ.

4.	**මෙහෙයුම් සමාලෝචනය**	
4.1	**කළමනාකරණ අකාර්යක්ෂමතා**	
	භාණ්ඩාගාර අනුමැතියකින් තොරව විශ්වවිද්‍යාල පාලක සභා සංදේශ අංක එම 88/10 යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදල සඳහා ආදායම් ප්‍රභවයන් වනුයේ බාහිර පාඨමාලාවල අතිරික්තය හා කොතලාවල ආරක්ෂක විද්‍යාලයේ උපදේශන ගාස්තු වේ. එකී නියමයන්ද අභිබවා යමින් 2000 ඔක්තෝබර් 21 දිනැති අංක 21 දරණ කොළඹ විශ්වවිද්‍යාලීය චක්‍රලේඛය මඟින් බාහිර පාඨමාලා අයවැය ගත ආදායමෙන් සියයට 10 ලෙස සමාලෝචිත වර්ෂය තුල රු. 26,775,342 ක් විවිධ පීඨ මඟින් සංවර්ධන අරමුදලට බැර කර තිබුණි. බාහිර පාඨමාලා ආදායම් කළමනාකරණය සම්බන්ධයෙන් කළමනාකරණයේ ඉහත පරස්පරතාවයන් මූල්‍ය පාලනයේ අහිතකර තත්ත්වයන් බව නිරීක්ෂණය විය.	එකඟ නොවේ.
4.2	**ගිවිසුම් ගත සේවා**	
	සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ ආරක්ෂක සේවා සඳහා රු. 30,314,352 ගෙවා තිබූ අතර 2012 දෙසැම්බර් 04 දින පෙරවරු 11.00 පමණ සිදු කළ භෞතික පරීක්ෂාවේදී ආරක්ෂක නිලධාරීන් අනුයුක්ත කළ යුතු සැලැස්මට අනුව ස්ථාන 09 ක නිලධාරීන් 12 ක් සේවයේ යොදවා නොතිබූ බව නිරීක්ෂණය විය.	මෙම තත්ත්වය පිළිබඳ මාගේ අවධානය යොමු කළ අතර 2012 -12-24 දිනැති ලිපිය මඟින් විශ්වවිද්‍යාලයේ ආරක්ෂක සේවා කටයුතු සම්බන්ධව පූර්ණ අධීක්ෂණ කටයුතු කරනු ලබන විනයාරක්ෂක අංශයට තම අධීක්ෂණ කටයුතු වඩාත් විධිමත්ව හා නිරන්තර පරීක්ෂාවට ලක් කරන ලෙසට උපදෙස් දී තිබේ. එසේම ආරක්ෂක සේවා සපයන **"ජ්ලොඩ් ආරක්ෂක සේවා"** ආයතනයට නියමිත පරිදි සහ ගිවිසුම් ප්‍රකාරව ආරක්ෂක නිලධාරීන් නිවැරදිව යෙදීම සඳහා උපදෙස් ලබා දෙන ලදී. මෙයට අමතරව දිනපතා සේවයේ යෙදන සියලු ආරක්ෂක නිලධාරීන්ගේ අත්සන් ඒ ඒ සේවා ස්ථාන වල තිබෙන ඇඟිලි සලකුණු යන්ත්‍ර වල සටහන් කරන ලෙසට උපදෙස් ලබා දෙන ලදී. එමෙන්ම අදාළ ප්‍රදේශයන්හි සේවයේ යොදවා නොමැති සේවකයින් හට ගෙවීම් කර නොමැති බවද කරුණාවෙන් දැන්වීමට කැමැත්තෙමි.
4.3	**ගිවිසුම් කඩකළ ආචාර්යවරුන්ගෙන් ලැබියයුතු මුදල්**	
	සමාලෝචිත වර්ෂය අවසානයට විශ්වවිද්‍යාල ආචාර්යවරුන් 37 ක් ගිවිසුම් කඩකර තිබූ අතර විශ්වවිද්‍යාලයට අයවීමට තිබූ මුලු මුදල රු. 41,597,721 ක් විය. ආචාර්යවරයා පිලිබඳ තොරතුරු සොයා ගත නොහැකිවීම සහ අධිකරණ නියෝග ලබාදී තිබුණද ඒ අනුව කටයුතු කිරීමට අපොහොසත්වීම නිසා ආචාර්යවරුන් 11 ක ගෙන් අයවිය යුතු රු. 11,966,890 ක් ද විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලින් අයකිරීමට කටයුතු කරන බව දක්වා තිබූ ආචාර්යවරු 13ක ගෙන් අයවිය යුතු රු. 4,337,122 ක් ද සේවය කඩකළ	ආචාර්යවරුන් 37ක් ගිවිසුම් කඩකර තිබූ අතර විශ්වවිද්‍යාලයට අය වීමට තිබූ මුදල රු. 41,597,721 වුවද ආචාර්යවරුන් 06 දෙනෙක් ගිවිසුම් ගත මුදල ගෙවා අවසන් කල අතර ආචාර්යවරුන් 03 දෙනෙක් 2012 වසරින් පසුව ගිවිසුම් කඩ කර ඇති අතර මේ වන විට ආචාර්යවරුන් 34 දෙනෙකුගෙන් රු. 43,801,373 ක මුදලක් විශ්වවිද්‍යාලයට අයකර ගැනීමට ඇත.

	ආචාර්යවරියගෙන් අයවිය යුතු රු. 1,790,241 ක් ද දීර්ඝ කාලයක සිට අයවී නොතිබුණි.	2012.12.31 වන විට ආචාර්යවරුන් 37 අයවීමට තිබූ මුදල රු.41,597,721.61 **සම්පූර්ණ මුදල් ගෙවා අවසන් කර ඇති ආචාර්යවරුන්** එම් පේ එම් ෆසිල් 56,066.40 ඒ වී කුරේ 687,500.00 කේ එස් නඩරාජා 175,281.75 සුජාතා පෙරේරා 35,033.66 ඩී පී කුරුප්පුමුල්ලගේ 632,228.94 එස් ඒ එම් ඩඟන් 51,730.82 **1,637,841.57** වාරික වශයෙන් 2012/2013 එකතු කරගෙන ඇති මුදල **4,808,261.10** 6,446,102.67 රු.35,151,618.94 **2012/2013 ගිවිසුම් කඩකල ආචාර්යවරුන්** කේ එම් එන් සේනානායක 1,223,239.91 වී වාසු 2,338,502.08 එච් එම් අලිසබ්‍රි 4,689,723.84 8,251,467.83 2013.12.31 වන විට ආචාර්යවරුන් 34 අයවීමට ඇති මුදල **රු.43,403,086.77**

<table>
<tr><td>4.4</td><td>නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්</td><td></td></tr>
<tr><td></td><td>පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.</td><td></td></tr>
<tr><td></td><td>(අ) උපාධි අධ්‍යයන පීඨයේ සවිකර ඇති රු. 350,000 ක් පිරිවැය වූ විදුලි උත්පාදන යන්ත්‍රය වසර 07 ක සිට නිශ්ක්‍රීයව පැවතුණි.</td><td>මෙම යන්ත්‍රය මිල දී ගැනීමට සිදුවී ඇත්තේ රජය මඟින් දෛනිකව විදුලි බලය සැපයුම සීමා කිරීම නිසා, එම කාල පරාසය තුල පීඨයට අවශ්‍ය විදුලිය උත්පාදනය කිරීම සඳහා වේ. 2005 වසර පමණ දක්වා මෙම යන්ත්‍රය භාවිතා කර ඇති අතර , දිවයින පුරා විදුලි සැපයුම යාවත්කාලීන වූ පසු භාවිතා කර නොමැත.
මෙම යන්ත්‍රය නඩත්තු කිරීම වෙනුවෙන් දැරීමට සිදුවන ඉන්ධන පිරිවැය මෙන්ම බැටරිය සඳහා යන පිරිවැය ද ඉතා අධිකය.
කෙසේ වෙතත්, මේ දක්වා විදුලි බලය සැපයුම සීමා නොකිරීම නිසා මෙම යන්ත්‍රය භාවිතා කිරීමට තරම් අවශ්‍යතාවයක් ඇති නොවීය.</td></tr>
<tr><td></td><td>(ආ) වෛද්‍ය ඖෂධ රසායනික ගොඩනැගිල්ල සඳහා රු. 13,268,669 ක කාර්යාල උපකරණ මිලදී ගෙන තිබූ අතර ගොඩනැගිල්ලේ කොන්ත්‍රාත් කටයුතු අවසන් වීමට ප්‍රථම උපකරණ මිලදීගැනීම නිසා වසර 1 ½ කට අධික කාලයක් නිශ්ක්‍රීයව පැවතුණි.</td><td>2013 වර්ෂයේ සිට මුළුමනින්ම මෙම වත්කම් පාවිච්චි කරනු ලැබේ. ඊට පෙරද විභාග කටයුතු සඳහා මෙම වත්කම් භාවිතා කරන ලදී. ඒ අනුව විගණන ඡේදය සංශෝධනය කරන ලෙස කාරුණිකව ඉල්ලමි.</td></tr>
<tr><td></td><td>(ඇ) විශ්වවිද්‍යාලයේ අනුමත රියදුරු කාර්ය මණ්ඩලය 24 ක් වන අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 21කි. ඒ අනුව පුරප්පාඩු තනතුරු ගණන 3කි. උපකුලපති සඳහා එක් වාහනයක් ද අනෙකුත් කාර්යමණ්ඩල සඳහා වාහන 10 ක් ද වෛද්‍ය පීඨය සඳහා අතිරේක වාහන 5 ක් ද වශයෙන් වෙන් කළ මුළු වාහන සංඛ්‍යාව හා රියදුරන් සංඛ්‍යාව 16 කි. වාහන 32 ක ඇණියෙන් ඉතිරි වාහන 16 පැදවීම සඳහා යෙදවිය හැකි රියදුරන් ගණන 5 ක් පමණක් විය. විශ්වවිද්‍යාලයේ අනෙකුත් අංශයන්හි කටයුතු කාර්යක්ෂමව පවත්වාගෙන යාමට මෙම තත්ත්වය බාධාවක් වන අතර සෑමවිටම වාහන 11 ක් ඌණ උපයෝජිතව පැවතුණි.</td><td>
<table>
<tr><th>විස්තරය</th><th>වාහන</th><th>රියදුරු සංඛ්‍යාව</th></tr>
<tr><td>නිත්‍ය වාහන සපයනු ලබන නිලධාරීන් ගණන</td><td>12</td><td>12</td></tr>
<tr><td>වෛද්‍ය පීඨයේ සේවයට</td><td>04</td><td>04</td></tr>
<tr><td>විද්‍යා පීඨයේ සේවයට</td><td>01</td><td>01</td></tr>
<tr><td>NEREC අධ්‍යක්ෂකතුමාගේ රාජකාරි කටයුතු</td><td>01</td><td>01</td></tr>
<tr><td>සංචිතයේ වාහන</td><td>14</td><td>06</td></tr>
<tr><td></td><td>32</td><td>24</td></tr>
</table>

සංචිතයේ වාහන 14න් වාහන 6ක් පාවිච්චි කිරීමට නොහැකි ඉතා පැරණි අබලන් තත්ත්වයේ තිබෙන බැවින් ඒවා විකිණීමට කටයුතු යොදා ඇත. ඉතිරි වාහන 8 සඳහා රියදුරු මහතුන් ඇත්තේ 5 දෙනෙකු පමණි. එක් රියදුරු</td></tr>
</table>

		මහතෙකු විශ්‍රාම ගොස් ඇත. බස්රථ 3 සඳහා රියදුරු මහතුන් නොමැති වුවද රාජකාරී සඳහා අවශ්‍ය වූ විට සංචිතයේ රියදුරු මහතුන්ගෙන් මෙම බස්රථ සඳහා රියදුරු සේවය ලබා ගැනීම සිදු කරනු ලබයි. එබැවින් ප්‍රවාහන කටයුතු අබාන්ඩව සියළු අංශ සඳහා ලබා දීම සිදුකරනු ලැබේ. එබැවින් සත්‍ය වශයෙන්ම වාහන සඳහා හිඟ වී ඇත්තේ රියදුරු පුරප්පාඩු 3 ක් පමණි. එම පුරප්පාඩු පිරවීම සඳහා සියලු කටයුතු කර ඇති බව දැන්වීමට කැමැත්තෙමි.
4.5	කොන්ත්‍රාත් පාලනයේ අකාර්යක්ෂමතා	
	පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.	
	(අ) වෛද්‍ය පීඨයේ සායනික විද්‍යා අංශයේ ඉගෙනුම් හා විභාග කටයුතු සඳහා ඉදිකරනු ලබන ගොඩනැගිල්ල සඳහා වූ කොන්ත්‍රාත්තුව පෞද්ගලික කොන්ත්‍රාත් සමාගමකට 2004 දෙසැම්බර් 17 දින කොන්ත්‍රාත් වටිනාකම රු. 47,644,945 කට ප්‍රදානය කර තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව මාස 18 කින් අවසන් කිරීමට සැලසුම් කර තිබුණද, වසර 08 කට අධික කාලයක් ඉකුත් වී 2013 අප්‍රේල් 08 දින කොන්ත්‍රාත් කටයුතු නිම කර තිබුණි. මෙම ඉදිකිරීම් සඳහා රු. 92,353,867 ක වියදමක් විශ්වවිද්‍යාලය විසින් දරා තිබූ අතර එය මූලික කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 93.8 ක් ඉක්මයාමකි.	මෙම ගොඩනැගිල්ල ආරම්භ කිරීම සඳහා 2004 වර්ෂයට ප්‍රමාණවත් ප්‍රතිපාදන භාණ්ඩාගාරය විසින් ලබා දී නොමැති බැවින් මේ පිළිබඳ 2004/02/26 දින පැවති ගොඩනැගිලි කමිටුවේ අවධානය යොමු කර ඇත. මෙම ගොඩනැගිල්ල කොළඹ ජාතික රෝහල් පරිශ්‍රයේ ගොඩනැගීමට යෝජිත වූ බැවින් ඒ සඳහා අනුමැතිය ගැනීමේ දී විවිධ ගැටළු වලට විශ්වවිද්‍යාලයට මුහුණ පෑමට සිදු වීම නිසා මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට ටෙන්ඩර් අනුමැතිය 2004-03-04 දින ලැබී 2004-09-24 දින කොන්ත්‍රාත්තුව ප්‍රදානය කල ද 2004 දෙසැම්බර් දක්වා ප්‍රමාද වීම විශ්වවිද්‍යාලයට පරිපාලනය කළ නොහැකි හේතූන් මත සිදු වූ ප්‍රමාදයක් බව දන්වනු කැමැත්තෙමි. තව ද 2004-09-24 ටෙන්ඩරය ප්‍රදානය කරන අවස්ථාවේදී, අදාළ වැඩ බිමෙහි විශාල අඹ ගසක් මුළුමනින්ම කපා ඉවත් කළ යුතුව තිබූ අතර වෛද්‍යවරුන්ගේ රථ වාහන නවතා තබන ස්ථානයක් ලෙස ද පැවතුණි. තව ද වැඩ බිම රෝහල් පරිශ්‍රය තුළ තිබීම නිසා, එහි තාවකාලිකව ඉදිකිරීමට නියමිත උපදේශක රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ නේවාසික ඉංජිනේරු කාර්යාලය හා කොන්ත්‍රාත්කරු සඳහා තාවකාලික නිවස ඉදි කිරීම ආදි ව්‍යාපෘතියේ ප්‍රාථමික වැඩ ආරම්භ කිරීමට කටයුතු ආරම්භ කිරීම ප්‍රමාද විය. මෙය ගොඩනැගිලි කමිටුවේ අවධානයට යොමු කරන ලදී. මේ අනුව ව්‍යාපෘතිය පටන් ගැනීම සඳහා අනුමැතිය 2004-12-01 දින ලබා දී ඇත. තව ද මෙම ටෙන්ඩරය ලබා දීමට 2004-03-12 දින ටෙන්ඩර් මණ්ඩලය මගින් විශ්වවිද්‍යාලයට දැනුම් දුන්නත් කොන්ත්‍රාත්තුව ආරම්භ කිරීම 2004-12-07 දින

		වීම නිසා මාස 09ක පමණ කාලයක ප්‍රමාදයක් සිදු වී ඇති අතර එය විශ්වවිද්‍යාලයට පරිපාලනය කල නොහැකි හේතූන් මත සිදු වූ ප්‍රමාදයක් බව දන්වනු කැමැත්තෙමි. මේ අනුව 2004-12-07 දින පැවති ගොඩනැගිලි කමිටුව මගින් ව්‍යාපෘතිය ආරම්භ කරන ලද දිනය 2004-12-07 බවට නිර්දේශ කරන ලදී. මුල් කොන්ත්‍රාත්කරු ව්‍යාපෘතිය අතරමග හැරයාම හේතු කොටගෙන අදාළ වැය සඳහා ප්‍රමාණ බිල්පත් (BOQ) සැකසීම, ඒවා ප්‍රමාණගත කිරීම, ලේඛණගත කිරීම හා ප්‍රසම්පාදන කටයුතු සඳහා කාල වේලා යාමත් කොන්ත්‍රාත්කරුවකු විසින් දමා ගිය ව්‍යාපෘතියක් වෙනත් කොන්ත්‍රාත්කරුවෙකු විසින් සිදු කිරීමේදී මුහුණ පෑමට සිදු වූ විවිධ තාක්ෂණික කරුණු නිසා හට ගන්නා වූ විශ්වවිද්‍යාලයට නොවැලැක්විය හැකි හේතු කරන කොට ගෙන මෙම කාලය ගත වී ඇත. එයට අමතරව ඒ ඒ අවස්ථාවන්හිදී වර්තමානයට අවශ්‍ය වන පරිදි වෛද්‍ය පීඨයේ අතිරේක වැඩ කටයුතු පීඨයේ අවශ්‍යතාවය මත නව එකතු කිරීම් හා වැඩිදියුණු කිරීම් සිදු කිරීමටද විශ්වවිද්‍යාලය විසින් කටයුතු සලසන ලදී. මෙම ව්‍යාපෘතිය රු. 47,644,949.50 ක වටිනාකමක් සහිතව 2004-09-24 දින එස් ඩී ස්ටෙපන් සහ සමාගමට ප්‍රදානය කරන ලදී. නමුත් මෙම ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත පිරිවැය වන්නේ රු. 133,768,625.00 කි. ව්‍යාපෘතියේ සියළුම කාර්යයන් අවසන් කොට අමතර වැඩ හා ගෘහ භාණ්ඩ ද ඇතුළුව නිම කරන ලද ව්‍යාපෘතිය එම ඇස්තමේන්තුගත මුදල් ඉක්මවා නොමැති බව ඉතා සතුටින් දන්වමි. මුල් කොන්ත්‍රාත්කරු ව්‍යාපෘතිය අතහැර ගියත් විශ්වවිද්‍යාලයේ කාර්යක්ෂමතාව නිසා සැලසුම්ගත ඇස්තමේන්තු මුදලටත් අඩුවෙන් ව්‍යාපෘතිය අවසන් කර ඇති බව සතුටින් දැනුම් දෙමි.
	(ආ) රු. 7,227,023 ක මුදලකට ප්‍රමිතියෙන් තොර පුටු මිලදී ගෙන තිබූ අතර මෙම පුටු භෞතික පරීක්ෂාවේදී බොහෝ පුටුවල රබර් බුස්, අත්ල, කුෂන් ගැලවී තිබුණ අතර පුටුවේ වාඩිවන කොටසේ යටී පැත්ත ස්ටෙප්ලර් කටු ගසා ආවරණය කර තිබුණු අතර මිලදී ගත් මෙස නිසි ප්‍රමිතියෙන් තොර බව නිරීක්ෂණය විය.	දක්වා ඇති සිද්ධීන් එම භාණ්ඩ පරිහරනය කිරීම නිසා සිදු වූ සිද්ධීන් බව දන්වා සිටින අතර එම භාණ්ඩ යථා තත්වයට පත් කිරීම සඳහා අදාල භාණ්ඩ සැපයුම්කරුට දැනටමත් දන්වා ඇත. ඔවුන් ඒ සඳහා කටයුතු කරමින් සිටී.

4.6	**නේවාසිකාගාර ප්‍රතිසංස්කරණය හා පාලනය**	
	පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.	
	(අ) විශ්වවිද්‍යාලය විසින් රු. මිලියන 22ක් වැයකර ප්‍රතිසංස්කරණය කරන ලද අක්කර 01 රූඩ් 01 පර්චස් 32.58ක භූමියක පිහිටි සිසුන් 500කට පමණ නේවාසික පහසුකම් සැපයිය හැකි තෙලවල නේවාසිකාගාරය 2010 වර්ෂයේ සිට වසා දමා තිබුණි. 2012 දෙසැම්බර් 31 දිනට මෙහි වත්කම්වල පිරිවැය රු. 25,352,000 ක් ලෙස මූල්‍ය ප්‍රකාශවල දක්වා තිබුණ අතර මෙම නේවාසිකාගාරය කාන්තා නේවාසිකාගාරයක් බවට පත්කිරීම සඳහා 2013 අප්‍රේල් මස සිට අළුත්වැඩියා කටයුතු ආරම්භ කර ඇති බව උපකුලපතිවරයා දන්වා තිබුණි.	ශිෂ්‍ය ගැටළු පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේදී පවත්වන ලද සාකච්ඡාවේදී ජනාධිපතිතුමාගේ උපදෙස් මත කොළඹ විශ්වවිද්‍යාලයේ පවතින පැරණි ගොඩනැගිලි නවීකරණය කිරීම සඳහා ශ්‍රම දායකත්වය නොමිලේ ලබාදීම සඳහා ශ්‍රී ලංකා යුධ හමුදාව එකඟ විය. මෙසේ ඔවුන් විසින් කරන ලද ගණිත අංශ ගොඩනැගිල්ලේ විශිෂ්ඨ නිමාව සහ යුධ හමුදාව විසින් දක්වන ලද තාක්ෂණික නිපුණතාවයන් සැලකිල්ලට ගනිමින් තෙලවල නේවාසිකාගාරයේ අලුත්වැඩියා කටයුතු සඳහා ද ශ්‍රී ලංකා යුධ හමුදාවේ ඉංජිනේරු බලකායේ ශ්‍රම දායකත්වය ලබාගැනීමට තීරණය විය. එහෙත් මෙම අලුත්වැඩියා කටයුතු ඉතා කඩිනමින් සිදුකිරීමට එම ගොඩනැගිල්ලේ පැවති තත්වය මත අවශ්‍යතාවය සලකා බලා එහි මූලික සටහන් (Design Proposal) කොළඹ විශ්වවිද්‍යාලයීය ගොඩනැගිලි සහ සංවර්ධන කමිටුවේදී දීර්ඝ වශයෙන් සාකච්ඡා කොට, එහි පූර්ව අනුමැතිය යටතේ පාලක සභාවේ ආවරණ අනුමැතියට යටත්ව උපේන්ද්‍ර රාජපක්ෂ සහ හවුල්කරුවෝ නැමති වරලත් ගෘහ නිර්මාණ ශිල්පී ආයතනයට පවරන ලදී.
	(ආ) නේවාසිකාගාර කිහිපයක අසාමාන්‍ය ජල පරිභෝජනයක් වූ අතර ඒක ශිෂ්‍ය ජල පරිභෝජනය රු. 2,317 සිට රු. 9,861 පරාසයක් තුළ විහිදුනි.	කාන්තා ශිෂ්‍ය නේවාසිකාගාරයන්හි විභාග කාල තුළ ජල පරිභෝජනය වැඩි වේ. කෙසේ වෙතත් මේ පිළිබඳව උපශාලාධිපතිවරුන්ට උපදෙස් ලබා දෙන ලදී.
	(ඇ) නේවාසිකාගාර කිහිපයක අසාමාන්‍ය විදුලි පරිභෝජනයක් වූ අතර ඒක ශිෂ්‍ය විදුලි පරිභෝජනය රු. 1,341 සිට රු. 8,953 ක පරාසයක් තුළ විහිදුනි.	විදුලිය අරපිරිමැස්මෙන් භාවිතා කිරීමට සිසුන්ට උපදෙස් දෙන ලෙසට උපශාලාධිපතිවරුන්ට දැනුම් දෙන ලදී.
	(ඈ) ශ්‍රීන්පාත් භික්ෂු නේවාසිකාගාරයෙහි සිසුන් 50 කට පමණ නේවාසික පහසුකම් සැපයිය හැකි නේවාසිකාගාරය මසකට රු. 130,000 කුලී පදනමට ලබාගෙන තිබුණි. 2011 ජූලි 01 වන දින ඒකාබද්ධ මාසික කුලිය රු. 205,000 ගෙවා යාබද ගොඩනැගිල්ලක්ද ලබාගෙන තිබූ අතර 2012 මැයි වන විට සිසුන් 37කට පමණක් නේවාසික පහසුකම් සපයා තිබුණි. එක් නේවාසිකාගාරය පමණක් මෙම භික්ෂු ශිෂ්‍යයන්ට නේවාසිකව සිටිය හැකිව තිබුණි.	මෙම ගොඩනැගිලි දෙකෙන් එක් ගොඩනැගිල්ලක් Virtual Campus සඳහා 2013.07.01 දින සිට භාවිතා කරයි. ඒ අනුව ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාට අංක 71/3 ගොඩනැගිල්ලෙහි පමණක් නේවාසික පහසුකම් සපයා ඇත.

5.	ගිණුම් කටයුතුභාවය හා යහපාලනය	
5.1	ක්‍රියාකාරී සැලැස්ම	
	2012 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මේ රු. 9,026,077 ක් වූ උද්‍යාන අලංකරණ ව්‍යාපෘතිය පිළිබඳ තොරතුරු ඇතුළත් කර නොතිබුණි.	ඒ සඳහා ලැබූ ප්‍රතිපාදනයන් යටතේ සිදු කරන ලද ව්‍යාපෘතියක් බව කරුණාවෙන් සලකන්න.
5.2	ප්‍රසම්පාදන කටයුතු	
	පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.	
	(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (අ) සහ 4.2.3 මාර්ගෝපදේශ ප්‍රකාරව අවම වශයෙන් වසර 03ක කාලපරිච්ඡේදයක් තුළ ඉටුකිරීමට අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබු අතර සමාලෝචිත වර්ෂය සඳහා පිලියෙල කළ සැලැස්මේ ඒ ඒ ප්‍රසම්පාදන සැලැස්මේ කාල රාමුව හා පියවරයන් ඇතුළත් වන ප්‍රසම්පාදන කාලසටහන ඝකස් කර නොතිබුණි.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ප්‍රකාරව ලැයිස්තුගත ප්‍රසම්පාදන සැලැස්මක් 2013 වර්ෂය සඳහා පිලියෙල කර ඇති අතර ඉදිරි වර්ෂ වලදී ප්‍රසම්පාදන සැලැස්ම නිසි පරිදි පිලියෙල කිරීමට කටයුතු කරන බව සඳහන් කරමි.
	(ආ) ඉහත මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.3.2 මාර්ගෝපදේශය පරිදි අරමුදල් සම්පාදන මාර්ගය කුමක් වුවත්, සියළු ප්‍රසම්පාදන කටයුතු එකී සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය පරිදි ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කලයුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මිලදී ගත් රු. 84,276,916ක් වූ මිලදිගැනීම් එකී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.3.2 මාර්ගෝපදේශය පරිදි විශ්වවිද්‍යාලයේ සියළුම අරමුදල් මඟින් වැයවන සියළුම මිලදී ගැනීම් ඇතුලත් කර ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කිරීමට ඉදිරි වර්ෂ වලදී කටයුතු කරන බව සඳහන් කරමි.
5.3	කාර්යය මණ්ඩල පුරප්පාඩු	
	විශ්වවිද්‍යාලයේ සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 216ක් විය. ඒ අනුව අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 136ක් වූ අතර ඉන් 73ක් සප්තවාර්ෂික නිවාඩු ලබාගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාලය විසින් බාහිර කථිකාචාර්යවරුන් සඳහා රු. 12,264,835ක වැය බරක් දරා තිබුණි.	ඉහත විගණන විමසුමේ සඳහන් අධ්‍යන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු 216 ලෙස සඳහන් වුවත් එයට අයත් වන්නේ අධ්‍යයන 136 අධ්‍යයන සහායක 50 පරිපාලන හා මූල්‍ය 07 අනිකුත් පරිපාලන 23 වශයෙනි. ඉහත විගණන විමසුමේ සඳහන් අධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු 136ට සප්ත වාර්ෂික නිවාඩු ලබා ගත් 73 ක් අයත් නොවන බවද සඳහන් කරමි.

6.	පද්ධති හා පාලනය	
	විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විශ්වවිද්‍යාලයේ උපකුලපතිගේ අවධානයට වරින්වර යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය. (අ) මිලදී ගැනීම (ආ) කොන්ත්‍රාත් පාලනය (ඇ) පුස්තකාල පරිපාලනය (ඈ) ගිණුම්කරණය (ඉ) පාඨමාලා ආදායම්	ඉදිරියේදී මේ පිළිබඳ විශේෂ අවධානය යොමු කිරීමට සටහන් කර ගනිමි.

Act උපකුලපති
කොළඹ විශ්වවිද්‍යාලය

පිටපත් : ලේකම් / උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
විගණකාධිපති / විගණකාධිපති දෙපාර්තමේන්තුව
අධ්‍යක්ෂ ජනරාල් / රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය
අධ්‍යක්ෂ ජනරාල් / ජාතික අයවැය දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය

අමාත්‍යාංශ අංක 01

SAR/AP

DA/5

37

Dr. M. Ganeshamoorthy,
Senior Lecturer,
Department of Economics,
University of Colombo.
20.06.2012

The Vice Chancellor,
University of Colombo
Colombo.
Through Dean Arts/
Head Economics.

SAR/AE
Under the purview
of AE
AR/AT
7/4

Dear Madam

Application for Research Allowance.

I am currently involved in a research project on ***'External Sector Performance of Sri Lanka During the New Millennium'*** The main objective of this research is to investigate the performance of exports and imports as well as exchange rate movements in order to identify the prospects and weaknesses and to suggest measures that help improving the performance of the external sector in the future. I intend to publish the research paper in an indexed journal published in Colombo.

Please be kind enough to grant me the researcn allowance considering the above research project.

Thank you,

Yours Truly,

Dr. M. Ganeshamoorthy,
Senior Lecturer,
Department of Economics,
University of Colombo.

Dean / Arts

Recommended and forwarded
with thanks.
28.06.2012

Recommended.
25/6/12
Dean
Faculty of Arts
University of Colombo
Sri Lanka

CEA
PNA
6/7/2012

External Sector performance of Sri Lanka During the New Millenniu


Abstract

Dr. M. Ganeshamoorthy,
Department of Economics,
Faculty of Arts,
University of Colombo.

Liberalization of the external sector of Sri Lanka had begun in the late 1970s, long before many countries in the South Asian region as well as many countries in the developing world embarked to do so. Since then Sri Lanka has been considered by many commentators as a pioneer in liberation effort and as an example of a small open economy. Sri Lanka engaged in negotiations of multilateral trade liberalization under the auspices of the World Trade organization In addition, the country has also entered into regional as well as bilateral treaties in order to liberalize trade at regional and bilateral level.

However, three and a half decades later, the external sector is in turmoil and the country was compelled to seek financial assistance from the IMF in the form of Standby Agreements. It is quite common that external sector performance tends to be bleak temporarily during the recessionary periods of world business cycles as export markets could be lost due to low income, low demand, low investment and low production spiral of a recession. Sri Lankan data shows, however, that the poor performance of the external sector is primarily due to fundamental weaknesses in the export and import sector of the country rather than recessionary trends in the main export markets. The trade balance of the country has continually been a large deficit throughout the post liberalization period, though the overall balance of the balance of payment has shown small positive numbers in certain years. The large deficit of trade account was cushioned mainly by inflows of private transfers in the form of remittances of expatriate workers living abroad, leading to a smaller deficit in the current account than in the trade account. Recent movements in the exchange rates of Sri Lanka exemplify this fundamental weakness and the inability of the monetary authorities to support the external sector using exchange rate as a main tool.

The objective of this paper is twofold: First, to identify the fundamental weakness of the external sector of Sri Lanka and the reasons for such weaknesses, Second, to propose possible remedial measures to overcome the fundamental weakness of the external sector based on the experiences of other countries.





To: Vice Chancellor

Through : Dean/ Faculty of Arts Recommended

Head/ Economics

Subject: Research allowance for 2012- Department of Economics

I have attached my proposal outline, which has the title below for the purpose of the above Research Allowance:

Is Inflation in Sri Lanka policy-driven?

This research examines the period of post 1990 period in depth to ascertain the drivers of inflation in Sri Lanka, both externally triggered and internally generated and then ascertain the degree of policy implications of of the policies adopted as a counter-inflationary measure.

Indrajith Aponsu

Department of Economics

8/01/2012

Department of Economics
University of Colombo
18th January 2012

The Vice Chancellor,
University of Colombo

Through Dean/ Faculty of Arts Recommended

Through Head/Department of Economics Recommended

Dean
Faculty of Arts
University of Colombo
Colombo 3
Sri Lanka

Dear Madam

Request for Research Allowance

Attached herewith is an abstract of a paper I will be working on this year titled 'Scenario Building as a costing technique in estimating prevention and treatment of NCDs'. I am hoping to publish this paper locally in the Ceylon Medical Journal.

Thanking you.

Yours faithfully

GAC de Silva

(Prof. Amala de Silva)

SAR/Acad Est
2nd Pl
25/1/12

B

VC
23/01/2012

Abstract

'Scenario Building as a costing technique in estimating prevention and treatment of NCD

Introduction:
Currently the Non-communicable diseases (NCDs) are a major health problem in the country, and are likely to worsen given the demographic transition in progress. NCDs apart from being a major health issue also pose serious financing problems at both system and household level. While primordial and primary prevention are clearly the way forward, attention also needs to be paid to secondary and tertiary prevention. Creating the policy environment necessary to support the financing of such health services in the country necessitates a strong evidence base.

Diabetes Mellitus (DM) is chosen for in-depth study as it is a major burden on the health system at present and the work already carried out in this context will provide the necessary initial evidence on which this study will be based.

Four different prevention levels will be focused on, in the context of diabetes:

Primordial prevention in the form of health education to the general public
Primary prevention in terms of health education on diet and exercise among the population group 40 to 60
Secondary prevention in terms of screening for diabetes
Tertiary prevention in relation to diabetic clinics at different levels of the health system (tertiary, secondary and primary care)

Cost-benefit analysis will be used to evaluate the different interventions, with cost savings being used to proxy for benefits.

Objectives:

(1) Evaluating the primordial, primary, secondary and tertiary prevention strategies in the context of diabetes
(2) Developing a systematic costing template for costing prevention of DM through primordial, primary, secondary and tertiary prevention interventions
(3) Providing a systematic costing template that can be modified and used in costing other non-communicable diseases.

Methodology

Methodological survey of costing literature
Empirical Literature Review of international publications relating to NCDs
Synthesizing evidence from local costing studies relating to DM and other NCDs
Developing costing template for different prevention interventions as they relate to Diabetes Mellitus using the Scenario Building Approach
Costing the different prevention interventions for DM using the Scenario Building Approach
Proposing necessary measures for generalizing and adopting this costing template for other NCDs

Limitations: Scenario Building technique is criticized even by practitioners, as providing a ballpark estimate rather than a totally accurate cost estimate. However given the limited availability of data in the Sri Lankan hospital and health system context, such a rough and ready measure could play a useful role in determining the choice of appropriate prevention strategies


Outcome: Journal article and presentations at meetings of the Social Determinants of Health group and for PGIM students

G A C de Silva

Dept of Economics,

University of Colombo

18th, January.2012





The Vice Chancellor,

University of Colombo

Through Dean Arts/Faculty of Arts Recommended on 2 Feb 2012

Through Head/Dept of Economics

20/1/12

DEAN
Faculty of Arts
University of Colombo
Colombo 3
Sri Lanka

Dear Madam,

Request for Research Allowance

An abstract copy of a paper titled "Major economic contributions by women to Sri Lankan Economy" attached herewith is the currently working paper in progress for year 2012.

I am hoping to publish this paper in the Sri Lankan Economists Association(SLEA)

Journal.

Thanking You

Ms. Selvy .Sirikananathan.

Lecturer in Economics.

Recommended and forwarded

For Head

20.01.2012

Abstract

Major economic contributions by women to Sri Lankan Economy

Major contribution of women to the economy of Sri Lanka can be specifically identified to the three sectors in this study during the last few decades .The country has a total population consists of nearly half the number as of females. Significant participation of women in the productive activities in the Tea Sector ,Garment Sector and Migrant Employment sector is the main focus of this research analysis. The relative importance among Sri Lankan total industrial exports of 74.9% the share of Garments 46.2%, and among total agricultural exports of 23.9 % the share of Tea exports is 16.7%.Remittances of the Migrant labour from middle Eastern countries contribute 60% to total remittances to the Sri Lankan economy. Majority of this workers consist of unskilled domestic female labour.

Historical reasons have made the Tea plantations being the largest women labour force participation sector from the pre to post independent period to the present time. Next manufacturing sector dominated by the Garment sector also is exclusively consists of major female labour force participation. European countries ensured the continuous buying markets for our tea products. Next followed by the open economic policies since the late seventies promoted the garment export markets in Europe and US with concessional trade for our export products. Thirdly due to globalization and easy mobility across borders for employment enabled the unskilled labour. An opportunity for women to proceed for work in the service sector in Middle eastern countries resulting in large sums of foreign remittances in the form of valuable hard currencies to the Sri Lankan economy.

Despite the benefits to the nation the challenges faced by the women labour force are many and deserve attention in different areas for policy remedial action by the government. Majority of the female labour force and their families live in poverty with poor standard of living conditions lacking education ,health and housing facilities which needs to be addressed by the state on a priority basis. High lighting facts with suggestions for implementing to meet the problems and change the status quo would help to attain the goals specified in the vision to move forward in making of Sri Lanka as the 'Miracle of Asia.'



DEAN
Faculty of Arts
University of Colombo
Colombo 3
Sri Lanka

To:
Vice Chancellor

Through:
Dean/Arts
Head/Economics

Recommended & forwarded.
27.1.2012

Dear Madam

Application for Research Allowance for Year 2012

Please approve the above allowance for me to conduct following research studies started at the beginning of this year.

A research study on the Pricing Strategies of Cultural Heritage Sites in Sri Lanka: A comparative study with other popular destination sites in Asia.

Examine the possible strategies in promoting Bandaranayake International Airport as a Aviation Center in Asia

Thanking you,

Yours Faithfully

Dr. D.A.C. Silva
Senior Lecturer
Department of Econor
University of Colombo

Concept Paper of the Research Study on:

An Examination of the Possible Strategies in Developing Bandaranayake International Airport (BIA) as a Aviation Center in Asia

This research study is to examine how to develop Bandaranaike International Airport (BIA) in Katunayake, Sri Lanka as one of most demanded aviation centers in Asia.

BIA started its operation in 1944. The study first reviews the historical development of the airport. To overview the present development and its trends, a situation analysis will be carried out with a SWOT analysis. Secondly, identification of the key challenges that BIA is to face in developing its service standards to be one of the demanded aviation hubs in Asia will be carried out. Thirdly, the factors that can determine the customer satisfaction at BIA will be examined and analyzed by using a customer satisfaction survey. Finally possible strategies that can be employed to develop BIA at international standards will be examined and a stakeholder analysis will be carried out for policy implication.

Besides the secondary data collected from various sources (e.g. Annual Reports of BIA administration, Central Bank Reports, Annual and related reports from SLITDA and related agencies will be used. In addition data will be collected from a field survey conducted at the BIA. Sample size of this survey will be determined after the examination of total customer population at the airport.

Data will be analyzed by using SPSS technical package.

At the end of this research study, it will identify the major challenges that BIA must face while providing major solutions, strategies and policy implications to overcome these challenges. A comparative analysis will also be carried and development of a new international airport in Matthala will be taken into consideration.

Keywords: Airport; Bandaranaike International Airport (BIA); services; Quality; Customer satisfaction; standards; Sri Lanka.

Dr. D.A.C Silva

Department of Geography
University of Colombo, Sri Lanka
P O Box 1490
Cumaratunga Munidasa Mawatha
Colombo 3 Sri Lanka

Telephone 500458, 502940
Fax 502940
Email norantony@yahoo.com



19th January 2008

The Vice-Chancellor
University of Colombo

Through:
The Dean/ Faculty of Arts Recommended and forwarded.
20/1/12

Dear Madam,

Payment of Research Allowance

I wish to apply for Research Allowance for the year of 2012. I have enclosed all relevant details pertaining to my research activities and publication for your perusal.

